# ගම්පහ සංවර්ධන සැලැස්ම

## 2024 -2033

“ සියනෑවේ පිබිදෙන හරිත අගනගරය”



නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

# ගම්පහ සංවර්ධන සැලැස්ම

2024 -2033



නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

**ගම්පහ සංවර්ධන සැලැස්ම 2024-2033**

**©නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2024**

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

**ප්‍රකාශය**
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපෑල - info@uda.gov.lk
දුරකථන අංක - + 94112 875 900
ප්‍රකාශනය - 2024

ගම්පහ සංවර්ධන සැලැස්ම 2024 -2033, පළමුවන කොටස, දෙවන කොටස සහ තුන්වන කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සැලැස්මය. දෙවන කොටස 2024 -2033 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාළ සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය මඟින් ගම්පහ සංවර්ධන සැලැස්ම 2024-2033 සකස් කරන ලදී.

**අධීක්ෂණය :** නාගරික සංවර්ධන අධිකාරිය

නිමේෂ් හේරත් - සභාපති
වරලත් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර - අධ්‍යක්ෂ ජනරාල්
වාස්තු විද්‍යාඥ / වරලත් නගර නිර්මාණ ශිල්පී මහින්ද විතානආරච්චි - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
වරලත් නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප I)
වරලත් නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප II)
වරලත් නගර නිර්මාණ ශිල්පී වයි.ඒ.පී.කේ.ගුණතිලක - අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)
නීතිඥ ඩී.එම්.කිරිවත්තුඩුව - ක.නි.අධ්‍යක්ෂ (නීති)
වරලත් නගර නිර්මාණ ශිල්පී ඩබ්.ඒ.ආර්.රංජනී - අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම්)

**සැලසුම් කණ්ඩායම :** නාගරික සංවර්ධන අධිකාරිය, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය.

වරලත් නගර නිර්මාණ ශිල්පී කේ.ඩබ්.ඒ . එච් ලක්පැතුම් - නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (සැලසුම්)
වරලත් නගර නිර්මාණ ශිල්පී ටී.ටී.එන්.ඩබ්. කුරුනේරු- සහකාර අධ්‍යක්‍ෂ (නගර සැලසුම්)
වරලත් නගර නිර්මාණ ශිල්පී හර්ෂණී ඉරේෂිකා ජයවර්ධන - නගර නිර්මාණ ශිල්පී

**සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය**
උපායමාර්ගික සැලසුම් අංශය - (සම්බන්ධීකරණය සහ ප්‍රකාශයට පත් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - (PORS,DRR, සංරක්ෂණ සැලසුම් සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)

# ප්‍රණාමය

ගම්පහ නාගරික බල ප්‍රදේශයේ අනාගත සංවර්ධන දිශානතිය හඳුනාගනිමින් 2024 - 2033 කාල පරාසය උදෙසා ගම්පහ මහා නගර සභා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා භෞතිය, ආර්ථික, සමාජීය සහ පාරිසරික අංශයන් ඒකාබද්ධ වූ නගර සංවර්ධන සැලසුමක් සකස් කරලීම උදෙසා ඍජුව මෙන්ම වක්‍රාකාරව සහය දැක්වූ පාර්ශවයන් රාශියක් ඇත. එම සියලු පාර්ශවයන් ගෞරවයෙන් සහ ස්තූති පූර්වකව සිහි ගැන්වීම අප සතු යුතුකමක් වේ.

පළමුකොට, ප්‍රාදේශීය පරිපාලන ආයතන ලෙස ගම්පහ මහ නගර සභාවේ හිටපු නගරාධිපති වන එරංග සේනානායක මහතා ඇතුළු මහජන නියෝජිතයන් සහ ගම්පහ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති වන රංජිත් ගුණවර්ධන මහතා ඇතුළු මහජන නියෝජිතයන් මෙම සංවර්ධන සැලැස්ම සාර්ථක කරගැනීම උදෙසා තම සහයෝගය දක්වමින් ප්‍රදේශයේ අනාගත සංවර්ධන උන්නතිය උදෙසා කැපවෙමින් ලබා දුන් දායකත්වයට අපගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරන්නට කැමැත්තෙමු. එසේම, සංවර්ධන සැලැස්මේ මූලික පසුබිම ලෙස වර්තමාන තත්ත්වය විශ්ලේෂණය උදෙසා දත්ත හා තොරතුරු ලබා දෙමින් සහයෝගය පල කළ ගම්පහ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සහ ගම්පහ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයත්, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්, සහකාර ලේකම් සහ සැලසුම් අංශයේ කාර්ය මණ්ඩලයත්, ගම්පහ දිස්ත්‍රික් ලේකම් ඇතුළු එහි කාර්ය මණ්ඩලයත් මෙහිදී විශේෂයෙන් සිහි කළ යුතුය.

එසේම මෙම සංවර්ධන සැලැස්ම උදෙසා මහජන අදහස් ලබා ගැනීම අරමුණ කරගනිමින් පැවැත්වූ පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා සහභාගී වෙමින් තම වටිනා අදහස් හා යෝජනා ඉදිරිපත් කළ සියලුම වගකිව යුතු රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි නිලධාරීන් උදෙසාද, වෙළඳ සමිති හා සමාගම් නියෝජනය කරමින් පැමිණි ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු මහජනයාටද වඩාත් සාර්ථක සැලැස්මක් උදෙසා මඟ පෙන්වීම වෙනුවෙන් ගෞරවනීය ස්තූතිය හිමි විය යුතුය.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂක ජනරාල්තුමා, අතිරේක අධ්‍යක්ෂක ජනරාල්තුමා, නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්තුමා (සැලසුම් කලාප I), නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්තුමා (සැලසුම් කලාප II) සහ උපායමාර්ගික සැලසුම් අංශය, බස්නාහිර පළාත් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය සහ පාරිසරික හා භූ දර්ශන අංශයද ඇතුළු සහයෝගය දැක්වූ සියලුම අංශ වෙතද අපගේ ගෞරව පූර්වක ස්තූතිය හිමි විය යුතුය. එසේම බස්නාහිර පළාත් අධ්‍යක්ෂකතුමන් සහ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), වරලත් නගර නිර්මාණ ශිල්පී හේමාල් ලක්පැතුම් මහතා ඇතුළු සැලසුම් නිලධාරී කණ්ඩායමටත්, උපාය මාර්ගික සැලසුම් කණ්ඩායමටත් සෙසු කාර්ය මණ්ඩලයටත් මෙහිදී ස්තූති පූර්වක ප්‍රණාමය හිමි වේ.

වරලත් නගර නිර්මාණ ශිල්පී, හර්ෂණී ඉරේෂිකා ජයවර්ධන
නගර නිර්මාණ ශිල්පී - නාගරික සංවර්ධන අධිකාරිය
ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
2024.02.29

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

"ගම්පහ " නගර සංවර්ධනය යථාර්ථයක් කරා...



ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැක්ම හා ප්‍රතිපත්තති ප්‍රකාශයට අනුව වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා සඵලදායි ලෙස ඉටු කර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍ය යොමු කිරීම යටතේ නව සංවර්ධන සැලසුමක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය .

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික් අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ. ඒ අනුව "ගම්පහ" නගර සංවර්ධන සැලැස්මද ඒ ලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වර්ෂය වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් වැඩි ප්‍රමාණයක් සකසා අවසන් කිරීම සඳහා සැලසුම් කර ඇත.

ගම්පහ නගර සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ ගම්පහ නගර කේන්ද්‍රීයව සේවා ලබාගන්නා සහ එහි වෙසෙන නේවාසික ජනතාව සඳහා වන අතර තවදුරටත් ප්‍රශස්ත සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම අරමුණු කොටගෙන, පවතින විභාවතාවයන් හා ගැටළු විශ්ලේෂණය කරමින්, ප්‍රදේශයේ පවතින ස්වභාවික පරිසර පද්ධතිය මෙන්ම නගරය තුළ පවතින ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට මෙම සැලැස්ම මඟින් හඳුනාගෙන ඇත. මෙම සැලස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින් , පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර ඒවා නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ මෙම සැලසුම සකස් කිරීම සඳහා උපයෝගී කොට ගෙන ඇත.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් සහ නන් අයුරින් මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුලින් ගම්පහ සංවර්ධන සැලසුම (2024-2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

## සභාපතිතුමාගේ පණිවිඩය - නාගරික සංවර්ධන අධිකාරිය



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාළ සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ඒවා ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරී සංශෝධිත පනතේ II අ කොටස හි 8 අ (1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කළ නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික , සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන ගම්පහ සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් ගම්පහ සංවර්ධන සැලැස්ම 2024 -2033 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙළ කර ඇත. ගම්පහ සංවර්ධන සැලැස්ම තුළින්, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනාගැනීම, ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර තවදුරටත් සංවර්ධන සැලසුම තුළින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුළින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

ගම්පහ සංවර්ධන සැලැස්ම නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද මෙම කර්තව්‍යය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**නිමේෂ් හේරත්**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය

## නාගරික කොමසාරිස්තුමියගේ පණිවිඩය (ගම්පහ මහා නගර සභාව)



දශක හතරක් පුරාවට ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයේ පුරෝගාමී මෙහෙවර ඉටුකරන නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය පරිපාලන ආයතන සමගද ඒකාබද්ධ වෙමින් නිසි භූමි පරිහරණ රටාවකින් යුක්තව සියලු නාගරික අවශ්‍යතා සපුරාලන ජීවත් වීමට හිතකාමී නගර නිර්මාණ උදෙසා පෙළ ගැසී සිටී.

ගම්පහ මහා නගර සභා සීමාව 2001 වසරේදී නාගරික සංවර්ධන බලප්‍රදේශයක් බවට පත්වීමත් සමඟම නාගරික සංවර්ධන අධිකාරියට භෞතිය, ආර්ථික, සමාජීය සහ පාරිසරික අංශයන්හි ගුණාත්මක සහ තුලනාත්මක සංවර්ධනය උදෙසා වඩා වැඩි බරක් එක් වූ අතර, නාගරික පරිපාලන ආයතනය ලෙස ගම්පහ මහා නගර සභාවද මෙම සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරමින් පොදු මහජන සුභ සිද්ධිය උදෙසා නොපිරිහෙලා තම වගකීම් සමුදාය ඉටුකරමින් පවතී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය මගින් සම්පාදනය කොට ඇති 2024-2033 කාල සීමාව තෙක් බල පැවැත්වෙන ගම්පහ සංවර්ධන සැලැස්ම තුලින් නාගරික ජනතාවගේ ආර්ථික ස්ථායිතාව ඇති කරමින් විධිමත් ප්‍රතිනාගරීකරණ සැළැස්මක් ඔස්සේ නාගරික ප්‍රදේශ සංවර්ධනය සහ නියාමනය යන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට මෙම සංවර්ධන සැලසුම් මහත් පිටිවහලක් ඇති බවට විශ්වාස කරමි.

එබැවින් මෙම සැලැස්ම පිළියෙල කිරීමේදී ඉතා වගකීමෙන් තම කාර්යභාරය ඉටු කරන ලද සැලැසුම් කණ්ඩායමට සහ නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට හෘදයාංගම කෘතඥතාවය පිරිනමන ගම්පහ මහා නගර සභා බලප්‍රදේශය තුළ ප්‍රශස්ත නාගරීකරණයක් ඇති කිරීම උදෙසා මා ඇතුළු ගම්පහ මහා නගර සභාවේ නිළධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය කැපවී සිටින අතර, එම උදාරතර අරමුණ වෙනුවෙන් තම වගකීම් සහ යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට බලාපොරොත්තු වේ.

ලෝචනා බාලසූරිය
නාගරික කොමසාරිස්
මහා නගර සභාව
ගම්පහ

## ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියගේ පණිවිඩය (ගම්පහ ප්‍රාදේශීය සභාව)



ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රමුඛ කාර්යයන් මෙහෙයවීමේ බිම් මට්ටමේ සංවිධානයන් සමග ඒකාබද්ධ වෙමින් නගර සංවර්ධන ක්‍රියාවලියේදී පවත්නා සීමිත සම්පත් කාර්යක්ෂම ලෙස හා උපරිම ඵලදායීතාවයෙන් යුතුව භාවිතා කිරීම සඳහා මානව අවශ්‍යතා තීරණය කරමින් සැලසුම් සහගත නගර නිර්මාණයක් උදෙසා නාගරික සංවර්ධන අධිකාරිය පෙරමුණ ගෙන සිටියි.

ගම්පහ ප්‍රාදේශීය සභාව, 2016.09.09 වන දින අංක 1983/30 දරණ ගැසට් නිවේදනය යටතේ නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත්විය. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්වන ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයත්, ගම්පහ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයත් ඒකාබද්ධ කොටගෙන, පැවති ගම්පහ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සදහා වු සැලැස්මෙහි, සැලසුම් බල ප්‍රදේශය තවදුරටත් පුළුල් කරමින්, එය උපාය මාර්ගික සැලසුම් ක්‍රමය යටතේ යාවත්කාලීන කරමින්, ගම්පහ සංවර්ධන සැලැස්ම 2024-2033 ලෙස වසර දහයක කාලසීමාවකට වලංගු වන පරිදි වත්මන් සංවර්ධන නැඹුරුතාවයන් ද සැලකිල්ලට ගනිමින් සර්වග්‍රාහී සැලැස්මක් ලෙස සකස් කර තිබිම සතුටට කරුණකි.

උක්ත බල ප්‍රදේශ දෙකම ආවරණය කරමින් සැලසුම්සහගත භෞතික සංවර්ධන දිශානතියක් කරා යොමු කරන අතර මෙමගින් ගම්පහ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සීඝ්‍ර සංවර්ධනයක් ඇතිවන බව නොරහසකි. මෙමගින් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට දැනෙන සුභවාදී වෙනසක් ප්‍රතිනිර්මාණය කිරීමට සහ එමගින් ජනහිතකාමී හා ගුණාත්මකභාවයෙන් වැඩි සේවාවක් උරුම කර දීමට හැකිවනු ඇති බවට විශ්වාස කරමි.

මෙම සැලැස්ම පිළියෙල කිරීමේදී ඉතා වගකීමෙන් හා කැපවීමෙන් සිය කාර්යභාරය ඉටු කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමන් ඇතුළු කාර්යය මණ්ඩලයටත් ඒ සඳහා සහයෝගය දැක්වූ සැමටත් කෘතවේදීත්වය පිරිනමන අතර සියනෑවේ පිබිදෙන හරිත අගනගරය කරා යාමට සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම සදහා අවශ්‍ය සියළු සහයෝගය ලබාදිමට ගම්පහ ප්‍රාදේශීය සභාව ඉදිරියටත් කැපවී සිටින බව ප්‍රත්‍යක්ෂ කරමි.

එස්.ඒ.එන්.පී.සුරවීර.
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා ගම්පහ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

# පූර්විකාව

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 101න් සමන්විත වන අතර, 1945 වසරේදී, ඉහළගම, පහළගම, මැදගම, පට්ටියගම, අලුත්ගම යන කුඩා ගම් පහ එකතු කරමින් ගම්පහ නගර සභාව ලෙස ස්ථාපිත කළ අතර ඉතිරි ග්‍රාම නිලධාරී වසම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් විය. මෙසේ හඳුනාගත් නගර සභා බල ප්‍රදේශය 1979.06.01 දින අංක 38/16 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් විය. ජනගහන වර්ධනය හා නාගරික සංවර්ධනය සමග 2000 ජුලි මස 27 වන දින අංක 1142/22 දරණ ගැසට් නිවේදනය මඟින් පැවති නගර සභා බල ප්‍රදේශයේ භූමි ප්‍රමාණය වර්. කි. මී. 2.57 සිට 27.9 දක්වා විශාල කර මහ නගර සභාවක් ලෙස ස්ථාපිත කරන ලදී. ඒ අනුව නැවත 2001 පෙබරවාරි මස 20 වන දින අංක 1172/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙම මහ නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත් කර ඇත. 2016.09.09 වන දින අංක 1983/30 දරණ ගැසට් නිවේදනය යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුල පවත්නා සියලුම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් නාගරික සංවර්ධන බල ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්වීමත් සමගම ගම්පහ ප්‍රාදේශීය සභාවද නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත්විය.

වර්තමානය වන විට ගම්පහ නගරාශ්‍රිත සංවර්ධනය මහ නගර සභා බල ප්‍රදේශයට සීමා නොවී ඉන් ඔබ්බට එහි ක්‍රියාකාරී සීමාව විසිර යයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගම්පහ මහා නගර සභාව සහ ප්‍රාදේශීය සභාව යන දෙකම ඒකාබද්ද කොටගෙන, දැනට පවත්නා ගම්පහ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සැලැස්ම (ගම්පහ නගර සභා බල ප්‍රදේශය) – (2006 – 2026) හි සැලසුම් බල ප්‍රදේශය තව දුරටත් පුළුල් කරමින්, එය උපායමාර්ගික සැලසුම් ක්‍රමය යටතේ සංශෝධනය කිරීම සිදු කෙරේ. සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මුලාශ්‍රිත දත්ත  සහ ක්ෂේත්‍ර සමීක්ෂණවලින් ලබාගත් දත්ත පදනම් කරගත් අතර ඒ හරහා දත්ත විශ්ලේෂණය, විවිධ විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගනිමින් ඒවා පිළිබඳ නිගමනවලට එළඹීම සිදු විය. ඒ අනුව, ගම්පහ මහ නගර  සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය උදෙසා 2024 -2033  කාල පරිච්ඡේදය සඳහා වලංගු වන නව සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම කොටස් තුනකින් සමන්විත වේ. එහි පළමුවන කොටස සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන කොටස් අන්තර්ගත කොට ඇත. දෙවන කොටස 2024 -2033  කාල පරිච්ඡේදය සඳහා සැලසුම් කිරීමේ සීමාවට අදාළ සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමනාවලින් සමන්විත වේ. තුන්වන කොටස බණ්ඩාංක සහ සියලු ඇමුණුම් සමඟ කලාප සීමා මායිම්වලින් සමන්විත වේ.

සංවර්ධන සැලැස්මේ පසුබිම වන පළමු පරිච්ඡේදය තුළ හැඳින්වීම, සංවර්ධන සැලසුම් කණ්ඩායම, විෂය පථය සහ අනුගමනය කරන ලද සැලසුම් ක්‍රියාවලිය විස්තරාත්මකව ඉදිරිපත් කෙරේ. මූලික අධ්‍යයනය වන දෙවන පරිච්ඡේදය මඟින් අධ්‍යයන ප්‍රදේශය, සැලසුම් සහ තත්ත්ව සන්දර්භය මෙන්ම සැලසුම් බල ප්‍රදේශය නිර්ණය කිරීම පිළිබඳව විස්තර කෙරේ.

පරිච්ඡේදය තුන මඟින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය සඳහා නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය විද්‍යාත්මක විශ්ලේෂණයන් පදනම් කර සිදු කළ අධ්‍යයනයන්ට අනුකූලව තාර්කික පදනමක් යටතේ ප්‍රධාන ගැටළු හා විභවතා වලට ගොනු කරමින් සාකච්ඡා කොට ඇත. එහි සංවර්ධන සැලසුම් රාමුව පරිච්ඡේද හතර මඟින් ආරම්භ වන අතර ගම්පහ මහා නගර සභා සහ ගම්පහ ප්‍රදේශීය සභා බල ප්‍රදේශ ආර්ථික, ආයතනික, නේවාසික සංවර්ධනය සහ සංවේදී තෙත්බිම් පරිසර පද්ධතිය ආරක්ෂා කරගනිමින් තිරසාර සංවර්ධන දිශානතියක් ඔස්සේ ගොඩනැගෙන "සියනෑවේ පිබිදෙන හරිත අගනගරය" බවට දැක්වෙන අනාගත දැක්ම, එහි ප්‍රකාශනය, අරමුණු සහ පරමාර්ථ අඩංගු කොට ඇත. මෙහි සඳහන් ප්‍රධාන අරමුණු තුන පදනම් කරගනිමින් සිදු කළ සාරාංශගත SWOT විශ්ලේෂණය ඇතුළත්ව පස්වන පරිච්ඡේදය සකස් කොට ඇත.

2033 වසර සඳහා වන අපේක්ෂිත දැක්ම සාක්ෂාත් කරලීම උදෙසා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම හයවන පරිච්ඡේදය මඟින් විස්තර කෙරෙන අතර එහි සංකල්පිත සැලැස්ම, යෝජිත භූමි පරිහරණ සැලැස්ම සහ උපාය මාර්ගික සැලසුම් අන්තර්ගත කර ඇති අතර ඒ යටතේ යෝජිත උපාය මාර්ගික ව්‍යාපෘති සහ වගකිව යුතු ආයතනික රාමුවත් විස්තර කෙරේ.

එමෙන්ම ගම්පහ සංවර්ධන සැලැස්මේ දෙවන කොටසින් ආරම්භ වන හත්වන පරිච්ඡේදය හරහා ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට වෙන් වෙන් වශයෙන් අයත්වන සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා විස්තර වන අතර අටවන පරිච්ඡේදයේ යෝජිත කලාපීකරණ නියමතාද වෙන් වෙන් වශයෙන් විස්තර කෙරේ. නව වන පරිච්ඡේදයේ දී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට අයත්වන යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත ඇතුළත් වේ. මේ අනුව, මෙම අධිකාරියේ අභිප්‍රාය වන්නේ 2024-2033 ගම්පහ සංවර්ධන සැලැස්ම මඟින් තිරසාර සංවර්ධනයක් ක්‍රියාත්මක කිරීමයි.

# අමාත්‍යතුමාගේ අනුමැතිය

**ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 ජුනි මස 12 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
[illegible] වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

ප්‍රසන්න රණතුංග (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II
බත්තරමුල්ල.

2024 07/....... මස 19 වන දින.

## ගැසට් නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2395/03 - 2024 ජූලි මස 29 වැනි සඳුදා - 2024.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

### I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 ජූනි මස 12 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජූලි මස 19 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'', අදියර - II,
බත්තරමුල්ල.

Activat
Se

2A I කොටස: (I) ඡෙදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2024.07.29

**ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2024 ක් වූ ජූලි මස 19 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජූලි මස 26 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය", අදියර - II,
බත්තරමුල්ල.

**ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 ජූලි මස 19 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමේෂ් හේරත්
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2024 ජූලි මස 26 වැනි දින.

EOG 07 - 0272

# පටුන

ප්‍රණාමය ....... vi
ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය ....... vii
සභාපතිතුමාගේ පණිවිඩය - නාගරික සංවර්ධන අධිකාරිය ....... viii
නාගරික කොමසාරිස්තුමියගේ පණිවිඩය (ගම්පහ මහා නගර සභාව) ....... ix
ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියගේ පණිවිඩය (ගම්පහ ප්‍රාදේශීය සභාව) ....... x
පූර්විකාව ....... xi
අමාත්‍යතුමාගේ අනුමැතිය ....... xiii
ගැසට් නිවේදනය ....... xiv
සිතියම් ලේඛනය ....... xix
වගු ලේඛනය ....... xx
රූප සටහන් ලේඛනය ....... xxi
ඇමුණුම් ලේඛනය ....... xxiii
පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම ....... 4
1.1. හැඳින්වීම ....... 4
1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් ....... 5
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය ....... 6
1.4. සැලසුම් ක්‍රියාවලිය ....... 7
පරිච්ඡේදය 02 : මූලික අධ්‍යයනය ....... 13
2.1. අධ්‍යයන ප්‍රදේශය ....... 13
2.2. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම ....... 16
2.2.1. හැඳින්වීම ....... 16
2.2.2. ක්‍රියාකාරී සීමාව ....... 16
2.2.3. භූගෝලීය සීමාව ....... 17
2.2.4. පරිපාලන සීමාව ....... 18
2.2.5 සැලසුම් සීමාව ....... 18
2.3 සැලසුම් සහ තත්ත්ව සන්දර්භය ....... 20
2.3.1. ඓතිහාසික පසුබිම හා විකාශනය ....... 20
2.3.2. ජාතික හා ප්‍රාදේශීය සම්බන්ධතා ....... 24
2.3.3. පූර්ව සැලසුම්මය මැදිහත්වීම් ....... 28
2.3.4. ජාතික හා කලාපීය වැදගත්කම ....... 30
2.3.5. වත්මන් ගම්පහ ....... 33
2.3.5.1. සමාජීය අංශය ....... 33
2.3.5.2. භෞතික අංශය ....... 40
2.3.5.3 . ආර්ථික අංශය ....... 51
2.3.5.4. පාරිසරික අංශය ....... 55

පරිච්ඡේදය 03: සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ... 66
3.1 හැඳින්වීම ... 66
3.2 හඳුනාගත් ගැටළු ... 66
3.3 හඳුනාගත් විභවතා ... 78
පරිච්ඡේදය 04 : සංවර්ධන සැලසුම් රාමුව ... 87
4.1 දැක්ම ... 87
4.2 දැක්මේ ප්‍රකාශනය ... 87
4.3 ඉලක්ක ... 87
4.4 පරමාර්ථ ... 88
ඉලක්ක ... 89
පරිච්ඡේදය 05 : ශඳුඅත විශ්ලේෂණය ... 94
පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම ... 99
6.1 සංකල්පිත සැලැස්ම ... 99
6.2 යෝජිත භූමි පරිභරණ සැලැස්ම ... 101
6.3 අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම ... 106
6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම ... 106
6.3.1.2. අධ්‍යාපන පහසුකම් ... 109
6.3.1.3. සෞඛ්‍ය පහසුකම් ... 111
6.3.2. මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම ... 113
6.3.3. ජල සැපයුම් සැලැස්ම ... 116
6.3.4. විදුලි සැපයුම් සැලැස්ම ... 118
6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම ... 118
6.3.6. කසළ කළමනාකරණ සැලැස්ම ... 120
6.4. ආර්ථික පුනර්ජීවන උපාය මාර්ගික සැලැස්ම ... 123
6.4.1. ආර්ථික සංවර්ධන සැලැස්ම ... 123
6.5. නාගරික ජනාවාස උපාය මාර්ගික සැලැස්ම ... 128
6.5.1. යෝජිත ජනගහන සහ නිවාස ඝනත්ව ව්‍යාප්තිය ... 128
6.6. දැනුම් කේන්ද්‍රය පුළුල් කිරීමේ උපාය මාර්ගික සැලැස්ම ... 135
6.7. නගර සන්නාම උපාය මාර්ගික සැලැස්ම ... 137
6.8. තිරසාර පාරිසරික උපායමාර්ග සැලැස්ම ... 138
6.8.1 පරිසර සංරක්ෂණ ප්‍රදේශ ... 138
6.8.1 යෝජිත පොදු එළිමහන් විනෝද අවකාශ සැලැස්ම (PORS Plan) ... 141
6.9. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම ... 143
6.9.1 උපාය මාර්ගික ව්‍යාපෘති සහ අනෙකුත් ව්‍යාපෘති ... 143

පරිච්ඡේද 07 : සංවර්ධන කලාප සහ කලාප සංගුණකය....180
7.1 හැඳින්වීම ....180
7.2 ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ කලාපීකරණ සැලැස්ම ....181
7.3 ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන කලාප සහ කලාප සංගුණකය....182
7.4 ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ කලාපීකරණ සැලැස්ම ....183
7.5 ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන කලාප සහ කලාප සංගුණකය ....184
7.6 ගම්පහ මහා නගර සභා හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා ......185
පරිච්ඡේද 08 : කලාපීකරණ රෙගුලාසි ....191
8.1 ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ කලාපීකරණ රෙගුලාසි....191
8.2 ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ කලාපීකරණ රෙගුලාසි.... 200
8.3 ගම්පහ මහා නගර සභා හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංරක්ෂණ කලාපීකරණ රෙගුලාසි. .... 207
8.4 උපලේඛණ....211
පරිච්ඡේදය 09 : යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත, මායිම් තාප්ප....239
9.1 යෝජිත මාර්ග පළල සහ ගොඩනැගිලි සීමා හැඳින්වීම.... 239
9.2 ගම්පහ සැලසුම් ප්‍රදේශය සඳහා යෝජිත මාර්ග පළල සහ ගොඩනැගිලි සීමාවන්.... 239
9.2.1 පළමු ප්‍රමුඛතා මාර්ග.... 239
9.2.2 දෙවන ප්‍රමුඛතා මාර්ග....240
9.2.3 තෙවන ප්‍රමුඛතා මාර්ග....241
9.2.4 සිව්වන ප්‍රමුඛතා මාර්ග .... 243
9.2 රක්ෂිත .... 258
9.2.1. දුම්රිය මාර්ග රක්ෂිත.... 258
9.2.2 . අධිවේගී මාර්ග රක්ෂිත .... 259
9.2.3. ඇළ, දොළ, ගංගා සහ ජලාශ රක්ෂිත.... 259
9.3 මායිම් තාප්ප ....260
ඇමුණුම්....264

## සිතියම් ලේඛනය

සිතියම 2.1 : අධ්‍යනය ප්‍රදේශය 15
සිතියම 2.2 : ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන පීඩන දර්ශකයසිතියම 15
සිතියම 2.2 :සැලසුම් බල ප්‍රදේශය (ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ) 19
සිතියම2.3: බස්නාහිර පළාත තුළ ජන ඝනත්ව ව්‍යාප්තිය, 2017 33
සිතියම2.4 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජන ඝනත්ව ව්‍යාප්තිය 36
සිතියම2.5 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස ඝනත්වය 39
සිතියම2.6 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ භූමි පරිභෝජන අවකාශීය සැලැස්ම 43
සිතියම2.7 :බස්නාහිර කලාපය තුළ වෙළඳ හා වාණිජ කටයුතු වල අවකාශීය ව්‍යාප්තිය 54

සිතියම2.8 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිසර සංවේදී ප්‍රදේශ වල අවකාශීය ව්‍යාප්තිය 56
සිතියම 2.9 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ගංවතුර ආපදාවට ලක්වන ප්‍රදේශ 59
සිතියම2.10: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටි , එළිමහන් විනෝද උද්‍යාන පවතින ස්ථාන වල අවකාශීය සිතියම 61
සිතියම6.1 : යෝජිත භූමි පරිහරණ සැලැස්ම - ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය 104
සිතියම6.2 : යෝජිත භූමි පරිහරණ සැලැස්ම - ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය 105
සිතියම6.3 : යෝජිත ප්‍රමුඛතා මට්ටම අනුව නාගරික මධ්‍යස්ථාන ධූරාවලිය 108
සිතියම6.4 : පාසල් අධ්‍යාපන පහසුකම් සහ ඒවායේ සේවා ප්‍රදේශ විශ්ලේෂණය 110
සිතියම6.5 : සෞඛ්‍ය පහසුකම් සහ ඒවායේ සේවා ප්‍රදේශ විශ්ලේෂණය 112
සිතියම 6.6 : යෝජිත ජනාවාස ධූරාවලිය - 2048 129
සිතියම6.7 : ප්‍රධාන නගර , උප නගර හා මංසන්ධීන් මුල්කරගනිමින් අපේක්ෂිත ජනගහනය හා නිවාස සංඛ්‍යාව 134
සිතියම6.8 : යෝජිත තෙත් බිම් කලාපීකරණ සැලැස්ම 139
සිතියම 6.9 :යෝජිත පොදු එළිමහන් අවකාශීය සැලැස්ම 142
සිතියම 7.1: ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශ කලාපීකරණ සැලැස්ම 2024-2033 181
සිතියම7.2 : ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ කලාපීකරණ සැලැස්ම 2024-2033 183
සිතියම8.1 :යෝජිත තෙත්බිම් සංරක්ෂණ සැලැස්ම 210

වගු ලේඛනය

වගුව 2.1 : ගම්පහ නගරයේ සිට ප්‍රධාන නගර කිහිපයකට ඇති ආසන්න දුර 25
වගුව 2.2 : දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර වලට ඇති දුර (Km) 27
වගුව 2.3 : ජනගහන වර්ධන අනුපාතය සංසන්දනය 34
වගුව2.6 : සැලසුම් බල ප්‍රදේශය හා අවට ප්‍රධාන නගර වලට මහා මාර්ග ජාලය ඔස්සේ ඇති ඇති ආසන්න දුර 45
වගුව2.7: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ පාසල් වර්ගීකරණය 47
වගු අංක 2.8 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රජයේ රෝහල් වල ධාරිතාවය 48
වගුව2.9 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ භාවිත කරන පානීය ජල මුලාශ්‍ර 49
වගු අංක 2.10 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ දිනකට එකතු වන කසළ ප්‍රමාණය 50
වගුව2.11 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාපිත වී ඇති කර්මාන්ත 51
වගුව2.12: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ 55
වගුව2.13 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෘජු විනෝද පහසුකම් සපුරා ගත හැකි ස්ථාන 62
වගුව3.1 : ගම්පහ නගරය තුළට දිනකට පැමිණෙන සහ පිටවන වාහන ගණන 72
වගුව3.2: විදුලි දුම්රිය ව්‍යාපෘතියත් සමඟ අපේක්ෂිත මගීන් සංඛ්‍යාව 82
වගුව 3.2 : ගම්පහ සහ කොළඹ නගර වල නිවාස මිලෙහි දැරිය හැකි බව (Housing Affordability) 84
වගුව6.2 : මහාමාර්ග ප්‍රමුකතාකරණය 113
වගුව6.3 : යෝජිත නාගරික ඒකරාශී ප්‍රදේශ වල භූමි ප්‍රමාණය හා අපේක්ෂිත ජනගහනය 128
වගුව6.4 : යෝජිත ජාතික නගර වල පළාත් පාලන ආයතනය, අපේක්ෂිත ජනගහනය හා ප්‍රමුඛතා ක්ෂේත්‍ර 130
වගුව6.5 : කලාප අනුව ජනගහනය, ජන ඝනත්වය සහ නිවාස ඒකක ගණන - ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය 132
වගුව 7.1 :ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන් 182
වගුව 7.2 :ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන් 184
වගුව 8.1.1 : අධි ඝනත්ව නේවාසික කලාපය (R) 191

වගුව 8.1.2 : මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) 192
වගුව 8.1.3 :අධි ඝනත්ව වාණිජ කලාපය (C1) 193
වගුව 8.1.4 : මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2) 194
වගුව 8.1.5 : අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1) 195
වගුව 8.1.6 : අධි ඝනත්ව ආයතනික කලාපය (I1) 198
වගුව 8.1.7 : මධ්‍යම ඝනත්ව සංචාරක කලාපය (T2) 199
වගුව 8.2.1 : අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1) 200
වගුව 8.2.2 :මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) I 201
වගුව 8.2.3 : මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) II 202
වගුව 8.2.4 : අධි ඝනත්ව නේවාසික කලාපය (R1) 203
වගුව 8.2.5 : මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2) 204
වගුව 8.2.6 : මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය (In2) 205
වගුව 8.2.7 : අඩු ඝනත්ව නේවාසික කලාපය (R3) 206
වගුව 8.3. 1:මධ්‍යම සංවේදී පරිසර සංරක්ෂණ කලාපයේ අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි 208
වගුව 8.4.1 : අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි (2021) හි 06 වන උපලේඛනයේ "අ" ආකෘතිය : 211
වගුව 8.4.2 : අවසරලත් මහල් ප්‍රමාණයන් : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන රෙගුලාසි / රෙගුලාසි (2021) හි 06 වන උපලේඛනයේ "ආ" ආකෘතිය : 215
වගුව 8.4.3 : විවෘත අවකාශයන්: නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි (2021)හි 06 වන උපලේඛනයේ "ඉ" ආකෘතිය: 216
වගුව 8.4.4 : සංවර්ධන කලාප සඳහා අවසරලත් භාවිතයන් සහ අවම බිම් ප්‍රමාණය - ගම්පහ මහා නගර සභාව 217
වගුව 8.4.5 : සංවර්ධන කලාප සඳහා අවසරලත් භාවිතයන් සහ අවම බිම් ප්‍රමාණය - ගම්පහ ප්‍රාදේශීය සභාව 223
වගුව 8.4.6 : යෝජිත රථවාහන නැවතුම් 223
වගුව 9.1 :ගම්පහ නාගරික බල ප්‍රදේශයේ පළමු ප්‍රමුඛතා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන් 239
වගුව 9.2 : ගම්පහ නාගරික බල ප්‍රදේශයේ දෙවන ප්‍රමුඛතා මාර්ග වල යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන් 240
වගුව 9.3 : ගම්පහ නාගරික බල ප්‍රදේශයේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රමුඛතා මාර්ග වල යෝජිත පළල හා ගොඩනැගිලි සීමාවන් 241
වගුව 9.4 : ගම්පහ නාගරික බල ප්‍රදේශයේ ගම්පහ මහ නගර සභාවට අයත් නොවන ප්‍රමුඛතා මාර්ගවල යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන් 242
වගුව 9.5 : ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට අයත් මාර්ග ලැයිස්තුව 243
වගුව 9.6 : ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ග ලැයිස්තුව 248

රූප සටහන් ලේඛනය

රූප සටහන 1.1 : උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය 7
රූප සටහන 1.1 : උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය 7
රූප සටහන 2.1 :ඉංග්‍රීසි පාලන සමය තුළ නගරයේ විකාශනය සිදු වූ ආකාරය 21
රූප සටහන 2.2 : හෙනරත්ගොඩ පැරණි දුම්රිය ස්ථානය 21
රූපසටහන 2.3 : 1867 දී ශ්‍රී ලංකාවේ පළමු රබර් ගස රෝපණය කිරීම (වර්තමානයේ හෙනරත්ගොඩ උද්භිත උද්‍යානය ) 22
රූපසටහන 2.4 : වර්ෂ 1919 දී ගම්පහ නගර මධ්‍යය සැලසුම් කරන ලද ආකාරය පිළිබඳ සංකල්පිත සිතියම 23

රූප සටහන 2.5 :ආයුර්වේද විකුමාරච්චි දේශීය වෛද්‍ය ආයතනය 24
රූප සටහන 2.6 :බස්නාහිර පළාතේ ප්‍රධාන මාර්ග කොරිඩෝ හත 25
රූප සටහන 2.7 : ගම්පහ නගරය ජාතික මහාමාර්ග ජාලය ඔස්සේ දිවයිනේ ප්‍රධාන නගර හා සම්බන්ධවන ආකාරය 25
රූප සටහන 2.8 : ප්‍රධාන දුම්රිය මාර්ග ඔස්සේ දිවයිනේ සෙසු නගර හා ගොඩනැගී ඇති සම්බන්ධතාවය 26
රූප සටහන 2.9 : ගම්පහ නගරය ප්‍රාදේශීය මහාමාර්ග ජාලය ඔස්සේ හා දුම්රිය මාර්ගය ඔස්සේ ප්‍රාදේශීය නගර හා සම්බන්ධවන ආකාරය 27
රූප සටහන 2.10 : කොළඹ මහ කලාපීය ව්‍යුහ සැලැස්ම (CMRSP ) - 1998 28
රූප සටහන 2.11 : බස්නාහිර මෙගාපොලිස් සැලැස්ම 28
(CESMA Plan) - 2002/3 28
රූප සටහන 2.12 : ගම්පහ නගර සංවර්ධන සැලැස්ම (2006-2026 ), කලාපීකරණ සැලැස්ම 29
රූප සටහන 2.14 : නාගරික ව්‍යුහ සැලැස්ම, බස්නාහිර කලාපීය මෙගාපොලිස් ගමනාගමන මහ සැලැස්ම 31
රූප සටහන 2.13 :යෝජිත අවකාශීය ව්‍යුහ සැලැස්ම - 2048 31
රූප සටහන 2.15 : බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්ම -2030 31
රූප සටහන 2.16 : තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) 32
රූප සටහන 2.17 : ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ජනගහනය -2017 34
රූප සටහන 2.18 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අධ්‍යාපනික මට්ටම 38
රූප සටහන 2.19 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රැකියාවේ ස්වභාවය අනුව රැකියා නියුක්ත ජනගහනය 40
රූප සටහන 2.20 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිවාස ඒකකයක් විසින් පරිහරණය කරන ලබන ගොඩ ඉඩම් ප්‍රමාණය 42
රූප සටහන 2.21 : සහසම්බන්ධිත මාර්ග ජාලය ඔස්සේ අන්තර් භුවමාරු මධ්‍යස්ථාන වලට හා අවට ප්‍රධාන නගර වලට ඇති සම්බන්ධය හා සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින දුම්රියස්ථාන 44
රූප සටහන 2.22 : දුම්රියේ දෛනික මගී සංසරණය (දිශාවන් දෙක ඔස්සේ) 46
රූප සටහන 2.23 : දුම්රිය මාර්ගය ඔස්සේ වැඩිම ගමනාගමනයක් සිදුවන මධ්‍යස්ථානයකි 46
රූප සටහන 2.24 :සැලසුම් ප්‍රදේශය තුළ පවතින ජල ව්‍යාපෘති මඟින් ආවරණය වන ප්‍රදේශ 49
රූප සටහන 2.25 : ගම්පහ දිස්ත්‍රික්කය තුළ වී වගා කරන ලද කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර ) 52
රූප සටහන 2.26 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන භෝග වගාවන් 52
රූප සටහන 2.27 : බැලුම්මහර, මුදුන්ගොඩ ප්‍රදේශ වල සිදු කරගෙන යනු ලබන අන්නාසි වෙළඳදාම 53
රූප සටහන 2.28 : කුන්ඩිවිල ඇළ මාර්ගය කැලෑ බිහිවී ඇති ආකාරය 57
රූප සටහන 2.29 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජල ගැලීම් සිදු වූ ග්‍රාම නිලධාරී කොට්ඨාශ හා පුද්ගල සංඛ්‍යාව 58
රූප සටහන 2.30 : ගම්පහ ප්‍රදේශය තුළ සිදුවන ගංවතුර තත්ත්වය 58
රූප සටහන 2.31 : ගංවතුර අවධානම් වර්ගීකරණය 60
රූප සටහන 3.1 : කලාපීකරණ සැලැස්ම - ගම්පහ සංවර්ධන සැලැස්ම (2006-2026) 67
රූප සටහන 3.2 : ගම්පහ පවතින කලාපීකරණ සැලැස්ම හා භාවිතයන් වල සිදු වී ඇති වෙනස්කම් 67
රූප සටහන 3.3 : ගම්පහ නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් හඳුනා ගත් ව්‍යාපෘති 68
රූප සටහන 3.4 : අගනගරීය ලාක්ෂණිකයන් නැති වීමට හේතු වී තිබෙන ඌන නාගරික අවකාශයන් 69
රූප සටහන 3.5 : ගම්පහ නගරයට ඇතුළුවන ප්‍රධාන මාර්ග ජාල 72
රූප සටහන 3.6 :ගම්පහ නගරයට දෛනිකව ඇතුළුවන හා පිටවන වාහන සංඛ්‍යාව කාලපරාස සමග විශ්ලේෂණය කිරීම 73
රූප සටහන 3.7 : ගම්පහ නගරයට පැමිණෙන රථවාහන වල සංයුතිය 73
රූප සටහන 3.8 : ගම්පහ නගර මධ්‍යය තුළ දවස පුරා පවතින වාහන නැවතුම් ඉල්ලුම 74

රූප සටහන 3.9 : ගම්පහ නගරය තුළ පැය 3-4 පමණ දක්වා පවතින රථවාහන නැවතුම් ඉල්ලුම 74
රූප සටහන 3.10 : ගම්පහ නගර මධ්‍යය තුළ පවතින තත්ත්වය 75
රූප සටහන 3.11 :ගම්පහ සැලසුම් බල ප්‍රදේශය තුළ ගණේමුල්ල සහ වැලිවේරිය උප නගර වල ක්‍රියාකාරීත්වය අවකාශීය වශයෙන් 76
රූප සටහන 3.12 ගණේමුල්ල බස්රථ නැවතුම් ප්‍රදේශය 77
රූප සටහන 3.13 වැලිවේරිය මංසන්ධිය තුළ දක්නට ඇති ඌන සංවර්ධනය 77
රූප සටහන 3.14 බහුමාන වාණිජ නගර සමඟ ජාතික නගරයක් ලෙස ගම්පහ නගරයේ අවකාශීය පිහිටීම 79
රූප සටහන 3.15 : ඉදිකෙරෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගය හා එම මාර්ගය ඔස්සේ අපේක්ෂිත අන්තර් හුවමාරු අතර දිනකට අපේක්ෂිත වාහන සංඛ්‍යාව 80
රූප සටහන 3.16 : යෝජිත විදුලි දුම්රිය ව්‍යාපෘතිය 81
රූප සටහන 6.2 : ගමනාගමනය මුල් වූ සංවර්ධනයේ සංකල්පිත සැලසුම් 125
රූප සටහන 6.3 : ගණේමුල්ල චන්ද්‍රිකා නගරය සංකල්පිත සැලසුම් 126
රූප සටහන 6.2 : වැලිවේරිය චන්ද්‍රිකා නගරය සංකල්පිත සැලසුම් 126
රූප සටහන 6.4 : අගය එකතු කරන ලද ආයුර්වේද හා කෘෂි කලාප සංවර්ධනය සංකල්පිත සැලසුම් 127
රූප සටහන 6.5 :යෝජිත අධ්‍යාපනික ත්‍රිකෝණය 136

## ඇමුණුම් ලේඛනය

ඇමුණුම 1: සංවර්ධන පීඩන දර්ශකය සඳහා යොදා ගත් ජනගහන දර්ශකය 264
ඇමුණුම 2: සංවර්ධන පීඩන දර්ශකය සඳහා යොදාගත් භූමි පරිභෝජන දර්ශකය 264
ඇමුණුම 3:සංවර්ධන පීඩන දර්ශකය සඳහා යොදා ගත් මාර්ග සම්බන්ධක දර්ශකය 265
ඇමුණුම 4: සංවර්ධන පීඩන දර්ශකය 266
ඇමුණුම 5: ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර , උප නගර හා මංසන්ධීන් අතර සම්බන්ධතා විශ්ලේෂණය 267
ඇමුණුම 6:ගම්පහ දිස්ත්‍රික්කය තුල ජන ඝනත්ව ව්‍යාප්තිය 268
ඇමුණුම 7: ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඉඩම්වල වාණිජ වටිනාකම් ව්‍යාප්තිය 269
ඇමුණුම 8: ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී සීමාව (Functional Boundary) හඳුනාගැනීම 270
ඇමුණුම 9: ගම්පහ දිස්ත්‍රික් පරිසර සංවේදිතා දර්ශකය (Environment Sensitivity Index) 271
ඇමුණුම 10: ගම්පහ දිස්ත්‍රික්කය තුළ ජාල දේහ ව්‍යාප්තිය 272
ඇමුණුම 11: භෞතික සීමාව හඳුනා ගැනීම (Physical Boundary) 273
ඇමුණුම 12: ගම්පහ දිස්ත්‍රික්කය තුළ සංවර්ධන සැලසුම් මඟින් ආවරණය වන ප්‍රදේශ 274
ඇමුණුම 13: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පාසල් වල ව්‍යාප්තිය 275
ඇමුණුම 15: සිද්ධි අධ්‍යනය - ගම්පහ බෞද්ධාලෝක මාවත 279
ඇමුණුම 16: උපාය මාර්ගික ව්‍යාපෘති සහ ඒවායේ ප්‍රමුඛතාකරන විශ්ලේෂණය 281
ඇමුණුම 17: ගංවතුර පාලන සැලැස්ම 286
ඇමුණුම 18: ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට අයත් කලාපීකරණ සිතියම් හා භූ ඛණ්ඩාංක 290
ඇමුණුම 19: ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කලාපීකරණ සිතියම් හා භූ ඛණ්ඩාංක 314



# පළමුවන කොටස

# 01 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මේ පසුබිම

# පරිච්ඡේදය 01
# සංවර්ධන සැලැස්මේ පසුබිම

## 1.1. හැඳින්වීම

තෝරාගත් ප්‍රදේශයක් උදෙසා නිශ්චිත ඉදිරි දැක්මක් අනුව ක්‍රමවත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම මඟින් ජනතාවගේ සමාජීය, භෞතික හා ආර්ථික උන්නතිය හා අභිවෘද්ධියත්, කලාපයේ විභවතාවයන් වැඩිදියුණු කරගනිමින් පවත්නා ගැටළු මඟහරවා ගැනීමත් අපේක්ෂා කෙරේ. නාගරික සංවර්ධන අධිකාරිය යනු , 1978 අංක 41 දරණ පනත යටතේ ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ නාගරික බල ප්‍රදේශ සඳහා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම සඳහා වූ බලයලත් නියාමන ආයතනයයි. එමෙන්ම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධන) පනතේ කොටස 8 අ (I) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන බල ප්‍රදේශයන් සඳහා ඒකාබද්ධ සංවර්ධන  සැලසුම් සකස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය ලබා දී ඇත.

ඒ අනුව, ගම්පහ සංවර්ධන සැලැස්ම යටතේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්වන ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයත් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයත් සැලසුම් බල ප්‍රදේශය ලෙස ආවරණය කෙරේ. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 101න් සමන්විත වන අතර, 1945 වසරේදී, ඉහළගම , පහළගම ,මැදගම,පට්ටියගම,අලුත්ගම යන කුඩා ගම් පහ එකතු කරමින් ගම්පහ නගර සභාව ලෙස ස්ථාපිත කළ අතර ඉතිරි ග්‍රාම නිලධාරී වසම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් විය. මෙසේ හඳුනාගත් නගර සභා බල ප්‍රදේශය 1979.06.01 දින අංක 38/16 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශය පත් විය. එනමුත් කාලයේ ඇවෑමෙන් සිදු වූ ජනගහන වර්ධනය හා නාගරික සංවර්ධනය සමග 2000 ජුලි මස 27 වන දින අංක 1142/22 දරණ ගැසට් නිවේදනය මඟින් පැවති නගර සභා බල ප්‍රදේශයේ භූමි ප්‍රමාණය වර්. කි. මී. 2.57 සිට 27.9 දක්වා විශාල කර මහ නගර සභාවක් ලෙස ස්ථාපිත කරන ලදී. ඒ අනුව නැවත 2001 පෙබරවාරි මස 20 වන දින අංක 1172/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙම මහ නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත් කර ඇත.

නමුත් ඒ වන විටත් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ගැසට් වී නොතිබුණු අතර වර්තමානය වන විට මුළු මහත් ගම්පහ දිස්ත්‍රික්කය තුලම පවත්නා ජනගහන වර්ධනය හා භෞතික සංවර්ධනය පාදක කර ගනිමින් 2016.09.09 වන දින අංක 1983/30 දරණ ගැසට් නිවේදනය යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුල පවත්නා සියලුම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් නාගරික සංවර්ධන බල ප්‍රදේශයන් ලෙස ගැසට් වීමත් සමගම ගම්පහ ප්‍රාදේශීය සභාවද නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත්විය.

වර්තමානය වන විට ගම්පහ නගරාශ්‍රිත සංවර්ධනය මහ නගර සභා බල ප්‍රදේශයට සීමා නොවී ඉන් ඔබ්බට විහිදී ඇති බව පෙනී යයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගම්පහ මහා නගර සභාව සහ ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ ද්විත්වයම ඒකාබද්ධ කොටගෙන, දැනට පවත්නා ගම්පහ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සැලැස්ම (ගම්පහ නගර සභා බල ප්‍රදේශය) - 2006 - 2026 හි සැලසුම් බල ප්‍රදේශය තව දුරටත් පුළුල් කරමින්, එය උපායමාර්ගික සැලසුම් ක්‍රමය යටතේ සංශෝධනය  කිරීම සිදු කෙරේ.

මෙම සැලැස්ම, ගම්පහ සංවර්ධන සැලැස්ම 2024 - 2033 ලෙස වසර 10ක කාලයක් සඳහා වලංගු වන පරිදි ප්‍රාදේශීය මට්ටමේ උපාය මාර්ගික සැලැස්මක් ලෙස සකස් කොට ඇති අතර මේ තුලින් වත්මන් සංවර්ධන නැඹුරුතාවයන්ද සැලකිල්ලට ගනිමින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්වන ගම්පහ මහා නගර සභා බල සීමාව හා ගම්පහ ප්‍රාදේශීය බල සීමාව සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

ගම්පහ උපායමාර්ගික සංවර්ධන සැලැස්ම 2024– 2033 දක්වා සකස් කිරීම සඳහා අදාල සියලුම රාජ්‍ය හා පෞද්ගලික මෙන්ම වගකීම් සහිත බලධාරීන්,ආයතන සහ ප්‍රජාව සම්බන්ධ කරගනු ලැබීය. මේ තුළින් ප්‍රදේශයට සම්බන්ධ සියලුම ආයතන,බලධාරීන් සහ ප්‍රජාවගේ අදහස්,උපදේශ හා යෝජනා ලබාගෙන සාමූහික සැලැස්මක් සකස් කිරීම අපේක්ෂා විය.

<u>ප්‍රධාන පාර්ශවකරුවන්</u>

- ගම්පහ මහා නගර සභාව
- ගම්පහ ප්‍රාදේශීය සභාව

<u>ප්‍රධාන උපදේශක ආයතන</u>

- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- ගම්පහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- මාර්ග සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- ලංකා විදුලිබල මණ්ඩලය

<u>පාර්ශවකරුවන්ගේ කණ්ඩායම්</u>

- කලාප අධ්‍යාපන කාර්යාලය
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
- වෙළඳ සංගමය
- ත්‍රිරෝද රථ සංගම්
- ගොවිජන සේවා මධ්‍යස්ථානය
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- පොලිස් ස්ථානය ගම්පහ සහ යක්කල

## 1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන නගරය වන ගම්පහ නගරය කේන්ද්‍ර කොටගෙන කරන ලද මෙම ගම්පහ උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම යටතේ ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයත් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයත් යන පරිපාලන බල ප්‍රදේශයන් දෙකම ආවරණය ඇත. කොළඹ ප්‍රධාන වාණිජ නගරයට ආසන්න නමුත් පරිපාලනමය වශයෙන් වෙන්ව පවත්නා ගම්පහ දිස්ත්‍රික්කය තුල පවතින ප්‍රධාන නගරය ලෙස ජනගහන වර්ධනය හා නාගරීකරණ තීව්‍රතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය පුළුල්ව විස්ථාපනය වෙමින් පවතී. ඒ අනුව මේ වනවිට ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය උදෙසා ක්‍රියාත්මක වන ගම්පහ නගර සංවර්ධන සැලැස්ම 2006 - 2026 යන සැලැස්ම සංශෝධනය කරමින් එහි සැලසුම් ප්‍රදේශය පුළුල් කර “ගම්පහ සංවර්ධන සැලැස්ම 2024 – 2033” ලෙස ප්‍රාදේශීය මට්ටමේ නව සැලැස්මක් මෙලෙස සම්පාදනය කර ඇත.

කොළඹ ආශ්‍රිතව පවතින අධික ඉල්ලුමත් සමඟ භූමියේ උපරිම ධාරිතාව ඉක්මයාම හේතුවෙන් හා පවත්නා ජාතික මට්ටමේ නව ප්‍රවේශ මාර්ග ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතින්හි බලපෑමත් සමඟ ගම්පහ ප්‍රදේශය ආශ්‍රිතව ඉහළ ජනගහන වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව මෙම සංවර්ධන නැඹුරුතාවයන් නිසි පරිදි කළමනාකරණය කරගනිමින්, පවත්නා මෙන්ම අපේක්ෂිත ඉල්ලුමට සරිලන පරිදි භෞතික පහසුකම් සැපයීම සඳහා උපායමාර්ගික නාගරික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා අවධානය මෙමඟින් යොමු කර ඇත.

මෙම සැලැස්ම 2024 වසරේ සිට 2033 වසර දක්වා අවුරුදු 10ක කාල සීමාවට වලංගු වන අතර දිස්ත්‍රික්කයේ පරිපාලන අග නගරය ලෙස අදාළ සියලු පරිපාලන බල ප්‍රදේශයන් හා සහසම්බන්ධ වූ නගරයක් ලෙස ගම්පහ මහා නගර සභාව හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන ප්‍රාදේශීය බල ප්‍රදේශ දෙකම එක් කරගනිමින් එනම් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා බල පැවැත්වෙන පරිදි සම්පාදනය කර ඇත. ඒ අනුව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී වසම් තිස්තුන ආවරණය වන පරිදි සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී වසම් හැට අට ආවරණය වන පරිදි මෙම ගම්පහ සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

ගම්පහ  නගර සංවර්ධන සැලැස්ම උපාය මාර්ගික ප්‍රවේශයන් සහිත උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියක් යටතේ පහත පියවරයන් ඔස්සේ සකස් කරන ලදී.

*රූප සටහන 1.1 : උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය*



ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා වන සංවර්ධන සැලැස්මෙහි මුළු සැලසුම් ක්‍රියාවලිය රූප සටහන 1.1 හි දැක්වෙන පරිදි ප්‍රධාන අදියර තුනක් යටතේ විකාශනය විය.

පළමුවැන්න 'අප සිටින්නේ කොහේද?' (where are we now?) දෙවනුව 'අපට යාමට අවශ්‍ය කොතැනටද?' (where are we want to go?) සහ තුන්වැන්න 'අප එහි යන්නේ කෙසේද?' (How we go there?) යන්නයි. ඒ අනුව 2019 ඔක්තෝම්බර් මාසයේ දී සැලැස්මෙහි පළමු අදියර ලෙස පවතින තත්ත්වය සහ සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය හඳුනාගැනීම ආරම්භ කරන ලදී. පසුබිම් අධ්‍යයනය තුළින් ක්ෂේත්‍ර නිරීක්ෂණය, ලේඛන ගත තොරතුරු, අන්තර්ජාලය, ගූගල් සිතියම්, චන්ද්‍රිකා ඡායාරූප ආදිය හරහා ඓතිහාසික, සමාජීය, ආර්ථික, පාරිසරික හා භෞතික සාධක මත පදනම්ව ප්‍රාථමික දත්ත සහ ද්විතීයික මූලාශ්‍ර ආශ්‍රයෙන් දත්ත රැස්කරනු ලැබීය. විශේෂයෙන්ම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ගම්පහ මහා නගර සභාව සහ ප්‍රාදේශීය සභාව යන ආයතනයන් දත්ත ලබා ගැනීමෙහිලා ප්‍රමුඛ විය. මෙම සියලු දත්ත භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තුළ භූ දත්ත සමුදායක් ලෙස ගබඩා කර ඇත.

රාමුගත කිරීම යටතේ, පසුබිම් අධ්‍යයනයන්හිදී රැස් කරගත් දත්ත සහ නිරීක්ෂණ භාවිතා කරමින් පැතිරුම් පත් (Excel), ගූගල් සිතියම්, භූගෝලීය තොරතුරු පද්ධති පදනම් කරගත් (GIS) සිතියම්කරණ යන මූලික විශ්ලේෂණයන් මත පදනම්ව ජාතික සහ කලාපීය සන්දර්භය තුළ සැලසුම් කලාපයෙහි පිහිටීම විශ්ලේෂණය කරන ලදී. එම කරුණු අධ්‍යයනයෙන් පසුව 2020 මාර්තු මස 02 වන දින මහජන පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගැනීමේ පළමු සැසිය පවත්වන ලදී. NVIVO මෘදුකාංගය භාවිතයෙන් සියලු පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා විශ්ලේෂණය කරන ලදී. එම කර්තව්‍යය සංවර්ධන සැලසුම් අංශය සමඟ එක්ව සම්පූර්ණයෙන්ම මෙහෙයවනු ලැබීය. ගැටළු සහ විභවතා හඳුනා ගැනීම හා අර්ථ දැක්වීම යටතේ දත්ත විශ්ලේෂණය සඳහා කරනු ලැබූ NVIVO, සංවර්ධන පීඩනය, පරිසර සංවේදීතාව, ගණිතමය විශ්ලේෂණ, NDVI ආදී සියලු විශ්ලේෂණයන් මත පදනම්ව සංවර්ධන සැලසුම් මඟින් අවධානය යොමු කල යුතු ගැටළු හඳුනා ගැනුණි.

දෙවන අදියරය ලෙස 'අපට යාමට අවශ්‍ය කොතැනටද?' (where are we want to go?) යටතේ, හඳුනාගත් ගැටළු, විභවතාවයන් සහ සංවර්ධන ප්‍රවණතාවයන් නිසි ලෙස කළමනාකරණය කරමින් කාලීන නාගරික සංවර්ධනයක් ඇති කිරීම සඳහා දැක්ම හා අරමුණු ගොඩ නැංවීම සිදු විය. ඒ අනුව, දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන අරමුණු තුනක් ඇත. ඉන්පසු පියවර ලෙස සවිස්තරාත්මක විශ්ලේෂණ යටතේ එක් එක් අරමුණ සඳහා වෙන් වෙන් වශයෙන් SWOT විශ්ලේෂණයන් සිදු කරනු ලැබිණි. මෙසේ කරන ලද SWOT විශ්ලේෂණයන් පාදක කොට ගෙන කලාපය තුළ පවත්නා ශක්තීන් සහ අවස්ථාවන් දායක කරගනිමින් දුර්වලතා හා තර්ජන මගහරවා ගත හැකි පරිදි පරමාර්ථයන් සකස් කරන ලදී. මෙම සැලැසුම් ක්‍රියාවලිය තුළ, පවත්නා සියලුම අවස්ථාවන් ඊට ඉහත පියවරයන් සමඟ ඒකාබද්ධව ඉදිරියට ක්‍රියාත්මක වුවකි.

අවසාන අදියර යටතේ, සැලසුම් කිරීම හා උපාය මාර්ග සැකසීමේ පියවර තුළ මාර්ග හා ප්‍රවාහන, ඓතිහාසික ආවේණිකත්වය, ආර්ථික, සමාජ, භෞතික සහ පරිසරය යන සියලු අංශ එකාබද්ධ වන පරිදි පරමාර්ථයන් උපක්‍රමශීලී උපායමාර්ගික භෞතික සැලසුම් වලට පරිවර්තනය කරනු ලැබිණි. එම උපාය මාර්ග, ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ප්‍රායෝගික තත්ත්වය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. පසුව මෙම උපාය මාර්ගයන් සැබෑ භූමිය තුළ ක්‍රියාත්මක කිරීම උදෙසා ඉහත සඳහන් සැලසුම්වලට අදාළ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ස්ථාපිත කරන ලදී.

අනුමැතිය ලබා ගැනීමේ අදියර යටතේ කෙටුම්පත් සංවර්ධන සැලැස්ම අදාල පළාත් පාලන බලධාරීන්ගේ හා මහජන අනුමැතිය ලබා ගැනීම සඳහා වර්ෂ 2023.02.14 දින ඉදිරිපත් කරන ලදී. තවද මේ සඳහා වර්ෂ 2023.06.12 දින පැවති පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ දෙවන වැඩමුළුව මඟින් ප්‍රාදේශීය ආයතනයන්හි අනුමැතිය හා අදහස් ලබාගන්නා ලදී. ඒ තුළින් ලද අදහස් හා යෝජනා අනුව අදාළ වෙනස්කම් සිදු කර අවසන් සැලසුම් කෙටුම්පත අනුමැතිය උදෙසා ප්‍රධාන සැලසුම් කමිටුව සහ සංවර්ධන සැලසුම් අංශය වෙත ඉදිරිපත් කෙරිණි. ඉන් අනතුරුව ගම්පහ ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශය සඳහා වන සංවර්ධන සැලැස්ම 2024-2033 නීතිමය ක්‍රියාමාර්ගයන්ට අනුකූලව ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රකාශයට පත් කරන ලදී.



# 02

# පරිච්ඡේදය

## මූලික අධ්‍යයනය

# පරිච්ඡේදය 02
# මූලික අධ්‍යයනය

## 2.1. අධ්‍යයන ප්‍රදේශය

මූලික අධ්‍යයනය පරිච්ඡේදය ඔස්සේ අධ්‍යයන ප්‍රදේශය සහ ඒ ඇසුරින් සැලසුම් සීමාව නිර්ණය කිරීම සාකච්ඡාවට බඳුන් කෙරෙන අතර එහිදී ගම්පහ සංවර්ධන සැලැස්මේ අධ්‍යයන ප්‍රදේශය ලෙස සමස්ත ගම්පහ දිස්ත්‍රික්කය සලකා බැලුණි. එය පහත දැක්වෙන විශේෂ නිර්ණායක කිහිපයක් මඟින් සාධනීයව සනාථ කෙරේ.

i සැලැස්මට කේන්ද්‍ර වන ගම්පහ නගරය දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නගරය වීම

මෙහිදී සැලැස්මට කේන්ද්‍ර වන ගම්පහ නගරය, ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන අග නගරය වීම හේතුවෙන් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය මෙන්ම ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන පළාත් පාලන බල ප්‍රදේශ පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නොවන්නේ දිස්ත්‍රික්කයේ පවත්නා අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හෝ පළාත්පාලන බල සීමාවන්ගෙන් තොරව සියලුම ප්‍රදේශයන් ප්‍රධාන දිස්ත්‍රික් පරිපාලන නගරය හා බැඳෙන බැවිනි.

ii ජාතික ප්‍රතිපත්තීන් සහ කලාපීය තීරණ

මෙහිදී පවතින ජාතික මට්ටමේ ප්‍රවණතාවයන් සැලකිල්ලට ගැනුණු අතර ජාතික නගරයක් ලෙස ගම්පහ නගරය ජාතික ප්‍රතිපත්ති මාලාව මඟින් හඳුනාගෙන තිබීම විශේෂ වේ. එමෙන්ම සීඝ්‍ර නාගරීකරණයේ ප්‍රතිඵලයක් ලෙස 2016/09/09 වන දින අංක 1983/30 යන ගැසට් නිවේදනය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන බල ප්‍රදේශ (මහා නගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභා) නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සිදු වූ අතර එම නෛතික පසුබිම සමඟ ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන සීමාව අධ්‍යයන ප්‍රදේශය ලෙස සැලකීමට තීරණය විය.

iii පවත්නා සහ යෝජිත ප්‍රවාහන යටිතල පහසුකම්

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවාහන කොරිඩෝ හත අතුරින් ගම්පහ දිස්ත්‍රික්කය හරහා ප්‍රධාන ප්‍රවාහන කොරිඩෝ දෙකක් වන නුවර සහ මීගමුව ප්‍රවාහන කොරිඩෝවන් ගමන් ගන්නා අතර ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන සහ උප නගර මෙම කොරිඩෝ සහ ඒවාට සම්බන්ධ වන අනු මාර්ග ඔස්සේ ගොඩනැඟී ඇත. එසේම ප්‍රධාන දුම්රිය මාර්ගය සහ කොළඹ - පුත්තලම යන දුම්රිය මාර්ග පද්ධතීන්ද, ප්‍රධාන නගර, උප නගර සහ මංසන්ධින් සංවර්ධනය කිරීමට හේතු වී ඇත.

එමෙන්ම කොළඹ - කටුනායක, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ග ජාලය හේතුවෙන් සංවර්ධන ප්‍රවණතාවයන් තවදුරටත් තීව්‍ර කෙරෙන අතර අධ්‍යයන ප්‍රදේශයක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයම සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාවය මෙම ප්‍රවාහන ජාලයන්හි අන්තර් සම්බන්ධතාවයන් අනුව සනාථ වේ.

iv ජනගහන ආකර්ෂණය සහ නැගී එන නේවාසික මධ්‍යස්ථානය

ලංකාවේ ජනගහනය ව්‍යාප්ත වීමේ අතීත රටාව අනුව 1881දී නුවර ප්‍රදේශයත් 1991 වන විට එය කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්ටත් ව්‍යාප්ත වීමත් හඳුනාගත හැක. නමුත් 2001 වර්ෂයේ සිට එම ජනගහන ව්‍යාප්තිය ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළු අභ්‍යන්තර ප්‍රදේශ සඳහාද ව්‍යාප්ත වීමේ ප්‍රවනතාවයක් පැවතිණි. මේ වන විට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් දෙවන වැඩිම ජනගහනයක් සහිත දිස්ත්‍රික්කය ගම්පහ වේ. එය ප්‍රතිශතයක් ලෙස 11% ක් වන අතර 2021 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2,443,000 ක් ලෙස සංඛ්‍යාත්මකව දැක්විය හැක. මේ තත්ත්වය යටතේ සීඝ්‍ර ජනගහන වර්ධනයක් පැවතීමත් ඒ හා සමානව නේවාසික ආකර්ශනය ඉහළ යාමත් හේතු කොටගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ පළාත් පාලන ආයතනික බල සීමා ලෙස වෙන් වෙන් වශයෙන් නොසලකා සමස්ත ගම්පහ දිස්ත්‍රික්කයම අධ්‍යයන ප්‍රදේශය සැලකීමට කටයුතු සිදු කර ඇත.

මෙම මූලික නිර්ණායක යටතේ සමස්ත ගම්පහ දිස්ත්‍රික්කය සහ ස්වභාවික මායිම් ලෙස පවතින මා ඔය සහ කැලණි ගඟ දෙපස මීටර 100ක ප්‍රදේශද ඇතුළත්ව මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දහතුන සහ ර්ට ඇතුළත් පළාත් පාලන බල සීමා දහනවයම සහිත වර්ග කිලෝ මීටර 1,387 ක් වන භූමි ප්‍රමාණය ගම්පහ සංවර්ධන සැලැස්මේ අධ්‍යයන ප්‍රදේශය ලෙස සලකා බලමින් මූලික විශ්ලේෂණයන් සිදු කර ඇත. එමෙන්ම මෙම අධ්‍යයන ප්‍රදේශයේ මූලික භූමි පරිහරණය සලකා බලන විට 71% කට ආසන්න භූමි ප්‍රමාණයක් සංවර්ධිත සහ සංවර්ධනය කිරීමට හැකියාව පවතින භූමින් වන අතර 29% ක භූමි ප්‍රමාණයක් පාරිසරික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ප්‍රදේශ වේ.

*සිතියම 2.1 : අධ්‍යනය ප්‍රදේශය*




මූලාශ්‍රය: ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම

## 2.2. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

### 2.2.1. හැඳින්වීම

ගම්පහ දිස්ත්‍රික්කයම අධ්‍යනය ප්‍රදේශය ලෙස ගෙන, සැලසුම් බල ප්‍රදේශය නිර්ණය කිරීමේදී, ක්‍රියාකාරී සීමාව, භෞතික සීමාව සහ පරිපාලන සීමාව යන මූලික විශ්ලේෂණයන් පාදක කෙරුණු අතර ඒ මත පදනම්ව සැලසුම් සීමාව හඳුනාගැනීම සිදු කර ඇත.

### 2.2.2. ක්‍රියාකාරී සීමාව

ඒ අනුව පළමුව ක්‍රියාකාරී සීමාව පිළිබඳව සාකච්ඡා කිරීමේදී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගැනිණි.

i ගම්පහ දිස්ත්‍රික්කයම අධ්‍යයන ප්‍රදේශය ලෙස සලකා බැලුනු අතර ජනගහනය, භූමි පරිහරණය, සංවර්ධිත ප්‍රදේශ සහ ප්‍රවාහන සහසම්බන්ධතා යන දර්ශකයන් මත සංවර්ධන පීඩන දර්ශකය (Development Pressure Index) හඳුනාගෙන ඇති අතර එම දර්ශකයන් පිළිවෙලින් ඇමුණුම 01, 02 සහ 03 මඟින් දක්වා ඇත. එහි විස්තරාත්මක විශ්ලේෂිත සාධක සහ අවසන් ප්‍රතිඵලය ඇමුණුම 04 මඟින් දක්වා ඇත. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කය තුළ සංවර්ධන පීඩනය විහිදී ඇති ආකාරය මනාව පිළිබිඹු වේ.

ii ප්‍රදේශයේ පවතින ප්‍රධාන නගර, උප නගර සහ මංසන්ධින් ආශ්‍රිත සිදු කරන ලද සම්බන්ධතා විශ්ලේෂණය (Connectivity Analysis) සහ එම ප්‍රධාන නගර, උප නගර සහ මංසන්ධින් ආශ්‍රිත නාගරික පර්ෂද ඇතී වී ඇති රටාව සැලකිල්ලට ගෙන ඇත. එය ඇමුණුම 05 මඟින් දක්වා ඇත.

iii ජනගහනයේ ව්‍යාප්තිය, ජන ඝනත්වය සහ එහි රටාව පිළිබඳව සැලකීමේදී අධ්‍යයන ප්‍රදේශය තුළ කොළඹ නගරයට තදාසන්න ප්‍රදේශ සහ කොළඹ - මීගමුව ප්‍රවාහන තීරය ආශ්‍රිතව අධි ඝනත්ව ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබේ. මෙම කලාපයෙන් ඔබ්බට එම අධි ඝනත්ව ජනගහන ව්‍යාප්තියේ යම් පැතිරීමක් නොහොත් මධ්‍ය ඝනත්ව ජනගහන රටාවක් අතරමැදි කලාපය ඔස්සේ හඳුනාගත හැක. එමෙන්ම කුරුණෑගල, කෑගල්ල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක මායිම්ව පවතින අධ්‍යයන ප්‍රදේශයේ මායිම ආශ්‍රිත ප්‍රදේශ අඩු ඝනත්ව ජනගහන ව්‍යාප්තියක් පෙන්නුම් කරනු ලබයි. මෙම රටාව ඇමුණුම 06 මඟින් නිරූපිත ජන ඝනත්ව ව්‍යාප්තිය ඔස්සේ හඳුනාගත හැක.

iv කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක බස්නාහිර පළාත තුළ ඉතා ඉක්මනින් නාගරීකරණයට ලක්වන අතර එය ඉඩම්හි වටිනාකම ඉහළ යාම කෙරෙහිද බලපෑම් කෙරේ. එහිදී අධ්‍යයන ප්‍රදේශය තුළ ඉඩම් වටිනාකම වෙනස්වීම පිළිබඳව සිදු කළ විශ්ලේෂණය හරහා කොළඹ - නුවර සහ කොළඹ - මීගමුව ප්‍රධාන ප්‍රවාහන තීර ආශ්‍රිත කලාපයන් ඉතා වැඩි ඉඩම් වටිනාකමක් සහිත භූමින් වන අතර කොළඹ නගරයට තදාසන්න ප්‍රදේශ නොහොත් මහ කොළඹ සංවර්ධන හර ප්‍රදේශයට අයත් භූමින්ද වැඩි වටිනාකම් සහිත භූමින් අතර විචල්‍ය වේ. නමුත් කුරුණෑගල, කෑගල්ල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක මායිම්ව පවතින ප්‍රදේශ සාපේක්ෂව අඩු වටිනාකමක් පෙන්නුම් කෙරේ. මෙය ඇමුණුම 07 මඟින් නිරූපණය කෙරේ.

ඒ අනුව ඉහත දක්වා ඇති මූලික නිර්ණායක සහ විශ්ලේෂණ ප්‍රතිඵල එකිනෙක අතිච්ඡේදනය කරමින් අවසාන අදියර ලෙස ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම සිදු විය. එහිදී අධ්‍යයන ප්‍රදේශය ලෙස සලකා බැලුනු ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී සීමා සහිත ප්‍රධාන පර්ෂද හතක් පිළිබිඹු වූ අතර ගම්පහ, ගනේමුල්ල, වැලිවේරිය, නිට්ටඹුව, සහ වේයන්ගොඩ යන නගර සහසම්බන්ධව ක්‍රියාත්මක වන ගම්පහ ආශ්‍රිතව එක් ක්‍රියාකාරී පර්ෂදයක් හඳුනාගත හැකිය. මෙසේ හඳුනාගත් ක්‍රියාකාරී පර්ෂදය හුදෙක් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට හෝ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට සීමා නොවී බටහිරින් ජා-ඇළ දක්වාත් නැගෙනහිරින් නිට්ටඹුව දක්වාත් උතුරින් වේයන්ගොඩ ප්‍රදේශය දක්වාත් දිව යයි. මෙම ක්‍රියාකාරී සීමාවන් ඇමුණුම 08 මඟින් දැක්වේ.

### 2.2.3. භූගෝලීය සීමාව

දෙවනුව, සැලසුම් බල ප්‍රදේශය නිර්ණය කිරීම සඳහා භෞතික සීමාව නොහොත් ස්වභාවික මායිම් පිළිබඳව අධ්‍යයනයන් සිදු කළ අතර එහිදී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගැනිණි.

I. සමස්ත අධ්‍යයන ප්‍රදේශය තුළම ජලවහන රටාව සහ ඇළ මාර්ග පද්ධතීන්හි සම්බන්ධතාවය, භූමි පරිහරණය, වෘක්ෂලතා ව්‍යාප්තිය, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික වටිනාකම් සහිත ස්ථාන සහ ආපදා අවදානම් සහිත ප්‍රදේශ යන මූලික සාධක භාවිතා කරමින් අධ්‍යයන ප්‍රදේශය තුළ පාරිසරික සංවේදී දර්ශකය (Environment Sensitivity Index) හඳුනාගෙන ඇත. එහි විස්තරාත්මක විශ්ලේෂිත සාධක සහ අවසන් ප්‍රතිඵලය ඇමුණුම 09 මඟින් දක්වා ඇත.

II. මුහුදු මට්ටමේ සිට අධ්‍යයන ප්‍රදේශයේ උස වෙනස් වීම නොහොත් උන්නතාංශය සලකා බැලුණු අතර ගම්පහ දිස්ත්‍රික්කය වෙනත් කඳුකර ප්‍රදේශ සහිත දිස්ත්‍රික්ක සමඟ සාපේක්ෂව ගතහොත් අඩු උන්නතනාශයක් සහිත ප්‍රදේශ බහුලව ව්‍යාප්තව පවතී. මෙහිදී මූලිකවම වෙරළ කලාපය, වගුරු සහ තෙත්බිම් ආශ්‍රිත කලාපයන්ගේ සිට අධ්‍යයන ප්‍රදේශයේ මායිම ආශ්‍රිත ප්‍රදේශ නොහොත් කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්කවලට මායිම්වන ප්‍රදේශයන්ගේ කඳු පන්තින්හි ව්‍යාප්තියක් දක්නට ලැබේ.

III. අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින ජල මූලාශ්‍රයන්ගේ විහිදීම පිළිබඳව සිදු කළ අධ්‍යයනය හරහා ප්‍රධාන ජල මූලාශ්‍ර තුනක් හඳුනා ගැනිණි. අධ්‍යයන ප්‍රදේශයේ දකුණු මායිම වන කැලණි ගංගා මූලාශ්‍රය, උතුරු මායිමට වන මාඕය ජල මූලාශ්‍රය මධ්‍ය ප්‍රදේශයේ අතු ගංගා සහ ඇළ මාර්ග සම්බන්ධ වන අත්තනගලු ඔය ජල මූලාශ්‍රය ලෙස ඒවා පිළිවෙලින් නම් කළ හැක. එසේම මෙම ප්‍රධාන ජල මූලාශ්‍ර හා සම්බන්ධ වන අතු ගංගා සහ ඇළ මාර්ග ඇසුරින් ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණිකව නිර්මාණය වන උප ජල මූලාශ්‍ර පවතී. මෙහිදී ගම්පහ ප්‍රාදේශීය සභා බල සිමාවේ උතුරු මායිමත්, ගම්පහ මහා නගර සභා සිමාවේ උතුරු මායිම අත්තනගලු ඔයෙන් මායිම් වන අතර ගම්පහ ගම්පහ මහා නගර සභාවේ බටහිර හා දකුණු මායිම් මෙන්ම ගම්පහ ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර හා උතුරු මායිම් ඔරුවල් ඔයෙන් මායිම් වේ. මෙය ඇමුණුම 10 මඟින් නිරූපණය කෙරේ.

ඒ අනුව ඉහත දක්වා ඇති මූලික නිර්ණායක සහ විශ්ලේෂණ ප්‍රතිඵල එකිනෙක අතිච්ඡේදනය කරමින් අවසාන අදියර ලෙස භෞතික සීමාව (Physical Boundary) හඳුනාගැනීම සිදු විය. එහිදී භෞතික සීමාව නිර්ණය කිරීම සඳහා භාවිතා කරන ලද ඉහත දැක්වූ නිර්ණායක අනුව ඇමුණුම 11 මඟින් නිරූපණය වන්නේ ගම්පහ ප්‍රදේශය ස්වභාවිකව මායිම් වන ආකාරයි.

## 2.2.4. පරිපාලන සීමාව

සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීමේදි සලකා බැලුණු අනෙක් කරුණ නම්, ප්‍රදේශය පරිපාලනමය වශයෙන් බෙදීගොස් ඇති ආකාරයි.

මෙහිදී, වර්ග කිලෝමීටර 1387 ක් පුරා විහිදෙන ගම්පහ දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 කට බෙදේ. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය උතුරින් මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත්, නැගෙනහිරින් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත්, දකුණින් මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත්, බටහිරින් ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත් මැදිව පවතී. 2001 වර්ෂයේදී රජයේ විශේෂ ගැසට් නිවේදනයකට අනුව (පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2/78 2000 ජූලි 27 දිනැති) භූමි ප්‍රමාණය ව.කි 27.9 ක් වන ග්‍රාම නිලධාරී වසම් 33න් සමන්විත ගම්පහ නගරාශ්‍රිත ප්‍රදේශය ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය ලෙස නම් කරන ලදී. පසුව, ව.කි 64 පමණ වන ග්‍රාම නිළධාරී වසම් - 68 න් සමන්විත ප්‍රදේශය ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විය. මේ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් ලෙස ක්‍රියාත්මක වේ.

## 2.2.5 සැලසුම් සීමාව

ඒ අනුව, සැලසුම් බල ප්‍රදේශය නිර්ණය කිරීම උදෙසා ක්‍රියාකාරී සීමාව, භෞතික සීමාව සහ පරිපාලනය සීමාව සලකා බැලුනු අතර ගම්පහ ප්‍රදේශයේ ක්‍රියාකාරී සීමාව ගම්පහ නගරය කේන්ද්‍ර කරගනිමින් උතුරින් උඩුගම්පොල ප්‍රදේශය දක්වාත්, නැගෙනහිරින් නිට්ටඹුව ප්‍රදේශය දක්වාත්, දකුණින් වැලිවේරිය ප්‍රදේශය දක්වාත්, බටහිරින් ජා- ඇළ ප්‍රදේශය දක්වාත් පරිපාලන බල සීමාවන් දක්වා විහිද යයි. එසේම භෞතික පිහිටීම අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය උතුරින් අත්තනගලු ඔයෙන් ස්වභාවිකවම මායිම්ව පවතින අතර පරිපාලනයේ පහසුව මෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දැනට ක්‍රියාත්මක වන හා මේ වන විට සකස්කර පවතින සංවර්ධන සැලසුම් මඟින් ආවරණය වන ප්‍රදේශයන් සලකා බැලීමේදී, ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයත් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයත් ආවරණය වන ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සැලසුම් බල ප්‍රදේශය ලෙස ගෙන මෙම සැලසුම සකස් කරන ලදී. ඒ අනුව දැනට සංවර්ධන සැලසුම් මඟින් ආවරණය වන ප්‍රදේශ ඇමුණුම 12 මඟින් දැක්වෙන අතර ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම සඳහා සළකා බැලෙන ගම්පහ සැලසුම් ප්‍රදේශය සිතියම2.2 මඟින් දැක්වේ.

*සිතියම 2.2 :සැලසුම් බල ප්‍රදේශය (ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය )*




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

## 2.3 සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

### 2.3.1. ඓතිහාසික පසුබිම හා විකාශනය

අතීතයේදී ගම්පහ හඳුන්වා දී ඇත්තේ "හෙනරත්ගොඩ" නමිනි. ඓතිහාසික සාක්ෂි අනුව හෙනරත්ගොඩ යනු සෙනෙවිරත්න නම් ඇමතියෙකු සිටි ප්‍රදේශයක් බව සඳහන් වේ. ඒ අනුව සෙනෙවිරත්ගොඩ පසු කාලීනව හෙනරත්ගොඩ නමින් හඳුන්වා දී ඇත. පසුව "ගම්පහ" යන නම ලැබී ඇති අතර ඒ සම්බන්ධ විවිධ මත පැවතියද වඩාත් ප්‍රචලිත මතය වන්නේ මෙම ප්‍රදේශය පාලනය කරන ලද ලියනරාල, බැද්දේරාල, මොහොට්ටාල, ගමරාල සහ වන්නකුරාල නම් වූ පස් දෙනෙකුගේ පාලනය යටතේ මෙම ප්‍රදේශයට ඉහළගම, මැදගම, පහළගම, පට්ටියගම, අලුත්ගම යන ගම් 05කින් පෙරහැරවල් 05ක් පැමිණීමේ සිද්ධියක් මුල් කොටගෙන "ගම්පහ" යන නම සෑදුනු බවය .

*ගම්කීවාට නොඇලෙයි සකී*
*ගණනක් කීවාට ගණිතය නොවේ සකී*
*මේ දෙපදය එක් කල විට සකී*
*නගරය නම වේය දනු සකී*

මූලාශ්‍රය : සිසිර කුමාර කුරුප්පු ආරච්චි සහ ධර්මප්‍රිය ගුණසේකර විසින් රචිත ගම්පහ රහස් කෘතිය ඇසුරින්

ගම්පහ පිළිබඳව පවතින පිළිගත් මූලාශ්‍ර වලට අනුව පෘතුගීසි ආගමනයට පෙර මෙම ප්‍රදේශය ඝන කැලෑවක් වූ බව සඳහන් වේ. අනතුරුව ක්‍රි.ව. 1505 නොවැම්බර් 05 වැනිදා පෘතුගීසීන්ගේ නැව්පති ලොරෙන්සෝ ද අල්මේදා මුහුදින් ලංකාවට පැමිණි අවස්ථාවෙන් පසු එලැඹි පෘතුගීසි යුගයේදී ගම්පහ පිළිබඳ පසුබිම් කරගත් සත්‍ය සිදුවීම් රැසක් පර්නාවෝ කොවරෝස් නැමැති ලේඛකයා ලියූ පරංගි හටන නැමැති ග්‍රන්ථයේ සඳහන්ය. ඒ අනුව ක්‍රි.ව. 1593 දී සීතාවක රාජධානිය මුල් කොටගෙන ගම්පහ ඔරුතොටදී පරංගි සිංහල යුද්ධය ඇති වූ බව සඳහන්ය.

ඉන්පසු පැමිණි ලන්දේසි පාලන සමය තුළදී එනම් (1658 - 1796) වර්ෂ සීමාව තුළදී කඳුකරයට යන මාර්ගය ගම්පහ ප්‍රදේශය හරහා වැටී තිබුණු අතර (මිරිස්වත්ත ප්‍රදේශය හරහා) වර්තමානයේ එය කොළඹ - නුවර මාර්ගය දක්වා වැඩි දියුණු වී ඇත. තවද ලන්දේසීන් විසින් ගම්පහ ප්‍රදේශයේ ගම්මිරිස් වගා කර ඇති අතර අද එම ප්‍රදේශය මිරිස්වත්ත ලෙස හඳුන්වනු ලබයි. එමෙන්ම මේ වකවානුව තුළදී ගම්පහ ප්‍රදේශය කුරුඳු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යන ලදී.

ඉන්පසු එලබෙන ඉංග්‍රීසි පාලන සමය තුළ ගම්පහ ප්‍රදේශය තුළ වැඩි වශයෙන් ජනාවාස බිහිවීමට පටන් ගෙන ඇත. සර් එඩ්වඩ් බාන්ස් විසින් 1825 දී කොළඹ නුවර මාර්ගය විධිමත්ව කැපීම ආරම්භ කිරීමත් සමඟ මහනුවර සිට කොළඹට කරත්ත වලින් කෝපි ප්‍රවාහනය කිරීම වැඩි වූ අතර කෝපි රැගෙන ආ කරත්ත කරුවන්ට විඩා නිවා ගැනීමට විවේක ස්ථාන සහ කඩමණ්ඩි පැවතුන අතර මිරිස්වත්ත ප්‍රදේශයේ හෙනරත්ගොඩ නමින් හඳුන්වන්නේ එම එක් ප්‍රදේශයකි. 1828 දී එඩ්වඩ් බාන්ස් විසින් මොරගොඩ ප්‍රදේශයේ මුඩුබිම් හා කැලෑ එළිපෙහෙළි කරමින් පාර කැපීම නිසා මොරගොඩ දෙවි මැදුර ආරම්භ වූ අතර ප්‍රදේශය තරමක් ජනාවාස වීම ආරම්භ විය. ගම්පහ දිස්ත්‍රික්කය ශ්‍රී ලංකා ආර්ථිකයෙහි සුවිශේෂී ප්‍රදේශයක් බවට පත් වූයේ සර් හෙන්රි වෝඩ් පාලන සමයේ

කොළඹ සිට අඹේපුස්ස දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමත් සමඟය. 1866 දී හේනරත්ගොඩ දුම්රිය ස්ථානය (වර්තමානයේ ගම්පහ දුම්රිය ස්ථානය) නිම කරන ලද අතර (රූප සටහන 2.2 ) එය නගරයේ ප්‍රගතිය සහ පිළිගැනීම සඳහා ප්‍රධාන සාධකයක් විය. සර් විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාර සමයේ ගම්පහ උද්භිත උද්‍යානය මුල් කරගෙන රබර් වගාව ආරම්භ කිරීම සිදු වූ අතර 1867 දී ශ්‍රී ලංකාවේ පළමු රබර් ගස (රූප සටහන 2.3 ) රෝපණය කළේ හේනරත්ගොඩ උද්භිද උද්‍යානයේ ය. එම සිද්ධීන් දාමය මුල් කරගත් සංකල්පිත සිතියම පහත රූප සටහන 2.1 මඟින් දක්වා ඇත.

*රූප සටහන 2.1 :ඉංග්‍රීසි පාලන සමය තුළ නගරයේ විකාශනය සිදු වූ ආකාරය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, නා. සං.අ.

මූලාශ්‍රය : සිසිර කුමාර තුරුප්පු ආරච්චි සහ ධර්මප්‍රිය ගුණසේකර විසින් රචිත ගම්පහ රහස් කෘතිය ඇසුරින්

*රූප සටහන 2.2 : හෙනරත්ගොඩ පැරණි දුම්රිය ස්ථානය*



මූලාශ්‍රය: සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ , 2023

*රූපසටහන 2.3 : 1867 දී ශ්‍රී ලංකාවේ පළමු රබර් ගස රෝපණය කිරීම (වර්තමානයේ හෙනරත්ගොඩ උද්භිත උද්‍යානය )*




මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරිනි : https://www.ft.lk/FT-Lite/Trading-rubber-for-over-100-years/6-668921

ඉතිහාසය තුළ නගර විකාශය පිළිබඳව කතා කිරීමේදී මෙතෙක් ගම්පහ ප්‍රදේශය පැවතගෙන ආ ස්වභාවික නගර විකාශය නිම කරමින් මුල්වරට සැලසුම්ගත මැදිහත්වීමක් ගම්පහ නගරය තුළ සිදුවුණි. ලංකාවේ විසි වැනි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ සර් හෙන්රි මැකලම් මහතා වසර පහක් ලංකාව පාලනය කර සිය නිළ කාලය අවසන් වීමට ලගාවෙද්දී ගම්පහ ඇතුළු බස්නාහිර පළාතේ වනාන්තර එළි පෙහෙළි කර නගර නිර්මාණය කිරීම සඳහා වර්ෂ 1912 ජනවාරි 04 වෙනි දා සර් ජෝන් ජෝර්ජ් ප්‍රෙෂර් නම් ඉංග්‍රීසි ජාතික උගතෙකුව බස්නාහිර පළාතේ දිසාපති ධූරයට පත්කරන ලදී.

ගම්පහ නගරය සැලසුම් කළ ප්‍රථම පුද්ගලයා වූ බස්නාහිර පළාතේ ඒජන්ත ජෝන් ජෝර්ජ් ප්‍රෙෂර් මහතා වර්ෂ 1919 දී ගම්පහ නගරය සැලසුම් කළේය. බස්නාහිර පළාතේ දිසාපති ලෙස වර්ෂ 1912.01.04 සිට 1923.11.30 දක්වා සේවය කළ ප්‍රෙෂර් මහතා ගම්පහ නිර්මාණය කිරීම සඳහා කැපවෙමින් ඔහු ගම්පහ (හෙනරත්ගොඩ) බිම් අක්කරය රුපියල් 400 බැගින් පුද්ගලික ඉඩම් රජයට මිලදී ගෙන නගරයක් බවට පත්කර 1919.09.10 දා ගම්පහ නගරයට ප්‍රථම වරට නළ ළිං සේවාව ඇරඹුවේය. වර්ෂ 1919 සැප්තැම්බර් 10 වෙනිදා උත්සවාකාරයෙන් යුතුව ගම්පහට විදුලිය බෙදා හරින ඉන්ධන බලයෙන් ක්‍රියා කරන තාප විදුලි පොලක් පිහිටවූ ප්‍රෙෂර් මහතා ගම්පහ නගරය විදුලියෙන් ප්‍රථම වරට ආලෝකමත් කර ඇත. මෙම තාප මෝල පිහිටි ස්ථානය අද ගම්පහ පොදු වෙළඳපොළ බවට පත්වී ඇත.ඊට අමතරව ජල ටැංකියක්, පොදු වෙළඳ පොළක්, මහ වීදිය ඇතුළුව මහා මාර්ග 52 සහ රෝහලක් ගම්පහ නගරය තුළ ස්ථාපිත විය. මෙලෙස නගරය විධිමත් කිරීම හේතුවෙන් ගම්පහ නගරය ආශ්‍රිතව ජනාවාස ආරම්භ වී ඇත.

වර්ෂ 1921 දී ප්‍රෙෂර් මහතා ගම්පහ නගරය නිර්මාණය කරන අයුරු නැරඹීම සඳහා එවකට ලංකාවේ 23 වැනි ආණ්ඩුකාරවරයා ලෙස සිටි සර් විලියම් මැනින් මහතාට ගම්පහට පැමිණෙන ලෙස ආරාධනා කොට ඇති අතර විලියම් මැනින් ආණ්ඩුකාරවරයා ප්‍රමුඛ බ්‍රිතාන්‍ය රාජකීය පෙළපතේ ප්‍රභූවරු කිහිපදෙනකු ගම්පහ නගරයේ සිරි නැරඹීමට පැමිණියහ. ලංකාවේ ප්‍රථම රබර් ගස රෝපණය කර තිබූ හෙනරත්ගොඩ (ගම්පහ) උද්භිත උද්‍යානය මුල්කරගෙන පැවති Florat Pageant නම් වූ ප්‍රදර්ශනය නැරඹීමට සර් මැනින්

ආණ්ඩුකාරවරයා සහ ආර්යාව ඇතුළු ප්‍රභූවරු ගම්පහ නගරය මැදින් අසුපිටින් අස්ගිරියට කැඳවාගෙන යනවිට ඔවුන්ට දැකබලා ගැනීමට ප්‍රෙෂර් මහතා විසින් වටරවුමක් ඉදිකොට ඒ මැද දර්ශනීය වතුර මලක් සවි කොට ඇති අතර ගම්පහ නගරය අලංකාරවත් කළ එම ස්ථානය වතුර මල හන්දිය නමින් හැඳින්වේ.

ගම්පහ මූලික රෝහල අතීතයේ හැඳින්වූයේ මැනින් ආර්යා රෝහල ලෙසය. මැනින් ආණ්ඩුකාරවරයාගේ ආර්යාව සිහිවීමට 1921 වර්ෂයේදී පිහිටවූ රෝහල ප්‍රෙෂර් මහතා පිහිටවූ සෞඛ්‍ය සභාව නිසා ඉදිවූවකි. එම සිද්ධීන් දාමය මුල් කරගත් සංකල්පිත සිතියම පහත රූප සටහන 2.4 මඟින් දක්වා ඇත.

*රූපසටහන 2.4 : වර්ෂ 1919 දී ගම්පහ නගර මධ්‍යය සැලසුම් කරන ලද ආකාරය පිළිබඳ සංකල්පිත සිතියම*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, නා. සං.අ.

මූලාශ්‍රය : සිසිර කුමාර කුරුප්පු ආරච්චි සහ ධර්මප්‍රිය ගුණසේකර විසින් රචිත ගම්පහ රහස් කෘතිය ඇසුරින්

1928 දී ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත් ජී.පී. වික්‍රමාරච්චි විසින් පෙරදිග වෛද්‍ය සම්ප්‍රදාය ඉගෙනීමේ මධ්‍යස්ථානයක් ලෙස ගම්පහ සිද්ධ ආයුර්වේද මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී. ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ නැගී එන ප්‍රවණතා සහ ජාතික සෞඛ්‍ය අංශයට එහි ඉමහත් දායකත්වය හඳුනා ගැනීමෙන් 1951 දී රාජ්‍ය පිළිගත් ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර 1982 දී අංක 30 දරන පාර්ලිමේන්තු පනත මඟින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය ලෙස සංස්ථාගත කරන ලදී. 1995 දී එය විශ්ව විද්‍යාල ආයතනයක තත්වයට උසස් කරන ලද අතර අද එය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව ක්‍රියාත්මක වෙයි. රූප සටහන 2.5 මඟින් එකල පැවති ආයුර්වේද රෝහල දක්වා ඇත.

*රූප සටහන 2.5 :ආයුර්වේද වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය ආයතනය*




මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

1945 වර්ෂය වන තෙක්ම ගම්පහ ගම් සභාවක් ලෙස පැවති අතර 1945 ජනවාරි වන විට ඉහළගම , මැදගම , පහළගම ,පට්ටියගම හා අලුත්ගම ගම් පහ එකතු කරමින් ව.කි. 2.57 භූමි ප්‍රමාණයක් ගම්පහ නගර සභා බල ප්‍රදේශය ලෙස හඳුන්වා දෙන ලදී. එමෙන්ම , ගම්පහ දිස්ත්‍රික්කය, පරිපාලන දිස්ත්‍රික් පනතේ 3 වන ඡේදය යටතේ 1978 සැප්තැම්බර් මස 7 වන දින ගැසට් නිවේදනය මඟින් නව දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිණි .මෙය කොළඹ දිස්ත්‍රික්කය නැවත බෙදීමෙන් වෙන් කරන ලද පාලන ප්‍රදේශයකි. 2001 වර්ෂයේදී රජයේ විශේෂ ගැසට් නිවේදනයකට අනුව (පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2/78 2000 ජූලි 27 දිනැති) ව.කි. 27.9 ක භූමි ප්‍රමාණයක ග්‍රාම නිළධාරී වසම් 33 එක් කොට ගම්පහ නගර සභා ප්‍රදේශය මහ නගර සභා ප්‍රදේශයක් ලෙස නම් කරන ලදී. එබැවින් එතෙක් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 27ක් ද මහ නගර සභා බල ප්‍රදේශයට ඒකාබද්ධ වූ අතර ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ව.කි. 64 ක වපසරියකින් යුත්, ග්‍රාම නිළධාරී වසම් 68 කින් යුක්තවූ ප්‍රදේශයක් බවට පත්විය.

## 2.3.2. ජාතික හා ප්‍රාදේශීය සම්බන්ධතා

ජාතික සම්බන්ධතාවය පිළිබද සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන්, බස්නාහිර පළාතේ ප්‍රධාන මාර්ග කොරිඩෝ හතෙන් (රූප සටහන අංක 2.6 ) එක් මාර්ග කොරිඩෝවක් වන කොළඹ - නුවර ( A 01) මාර්ගය ඔස්සේ හා ප්‍රධාන දුම්රිය මාර්ගය ඔස්සේ ගම්පහ ප්‍රදේශය හරහා මධ්‍යම පළාත හා උතුරු නැගෙනහිර පළාත් වලට ඉහත ප්‍රධාන ප්‍රවාහන තීර ඔස්සේ සම්බන්ධ වේ. එසේම දැනට ඉදිවෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගය හරහාද ගම්පහ නගරය හා සෙසු පළාත් හා පහසුවෙන් සම්බන්ධ වීමේ මං පෙත් විවර කෙරෙනු ඇත. එසේම ගම්පහ නගරයේ සිට ප්‍රධාන මාර්ග හා දුම්රිය ජාල ඔස්සේ දිවයිනේ ප්‍රධාන නගර හා පහසුවෙන් සම්බන්ධ වීමේ හැකියාව පවතී. මෙසේ ගම්පහ සිට දිවයිනේ සෙසු නගර වලට ළඟා විය හැකි මාර්ග හා දුම්රිය ජාල පහත රූප සටහන 2.7, වගුව2.1 හා රූප සටහන 2.8 මඟින් දක්වා ඇත.

*රූප සටහන 2.6 :බස්නාහිර පළාතේ ප්‍රධාන මාර්ග කොරිඩෝ හත*




මූලාශ්‍රය : Megapolis Transport Master Plan, Final Report, 2016

*රූප සටහන 2.7 : ගම්පහ නගරය ජාතික මහාමාර්ග ජාලය ඔස්සේ දිවයිනේ ප්‍රධාන නගර හා සම්බන්ධවන ආකාරය*




මූලාශ්‍රය : මාර්ග සංවර්ධන අධිකාරිය

*වගුව 2.1 : ගම්පහ නගරයේ සිට ප්‍රධාන නගර කිහිපයකට ඇති ආසන්න දුර*

| ප්‍රධාන නගරය | ගම්පහ නගරයේ සිට ආසන්න දුර (කිලෝමීටර) |
|---|---|
| කුරුණෑගල | 66 කි.මී |
| මහ නුවර | 90 කි.මී |
| දඹුල්ල | 124 කි.මී |
| අනුරාධපුර | 170 කි.මී |
| පුත්තලම | 124 කි.මී |
| නුවරඑළිය | 148 කි.මී |
| ගාල්ල | 134 කි.මී |

*රූප සටහන 2.8 : ප්‍රධාන දුම්රිය මාර්ග ඔස්සේ දිවයිනේ සෙසු නගර හා ගොඩනැගී ඇති සම්බන්ධතාවය*




මූලාශ්‍රය : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රාදේශීය වශයෙන් ගත් කළ ගම්පහ නගරය යනු ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරය වන අතර දිස්ත්‍රිකයේ ප්‍රධාන නගර වලට මැදිව පිහිටි හා අභ්‍යන්තර මාර්ග ජාල හරහා එම නගර වලට මනාව සහසම්බන්ධ වන සහසම්බන්ධිත නගරයක් ලෙස ගම්පහ නගරය හඳුන්වා දිය හැකිය (රූප සටහන 2.9). ඒ අනුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර වලට ඇති ආසන්න දුර සහ ගමනාගමන කාලය පහත වගුව2.2 පරිදි වේ.

*රූප සටහන 2.9 : ගම්පහ නගරය ප්‍රාදේශීය මහාමාර්ග ජාලය ඔස්සේ හා දුම්රිය මාර්ගය ඔස්සේ ප්‍රාදේශීය නගර හා සම්බන්ධවන ආකාරය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, නා. සං.අ.

*වගුව 2.2 : දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර වලට ඇති දුර (Km)*

| ප්‍රධාන නගරය | ගම්පහ නගරයේ සිට ඇති දුර (කිලෝමීටර) |
|---|---|
| කොළඹ | 29 කි. මී |
| කටුනායක | 19 කි. මී |
| ජා ඇළ | 13 කි. මී |
| මීගමුව | 23 කි. මී |
| මිනුවන්ගොඩ | 14 කි. මී |
| බියගම | 24 කි. මී |
| නිට්ටඹුව | 16 කි. මී |
| මීරිගම | 23 කි. මී |

මූලාශ්‍රය : ගූගල් සිතියම් , 2021

### 2.3.3. පූර්ව සැලසුම්මය මැදිහත්වීම්

පූර්ව සැලසුම්මය මැදිහත්වීම් පිළිබඳ සළකා බැලීමේදී, ගම්පහ ප්‍රදේශය ක්‍රමානුකූල සැලැස්මක් යටතට ගැනෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1998 වර්ෂයේ සකස්කරන ලද කොළඹ මහ කලාපීය ව්‍යුහ සැලැස්ම (Colombo Metro Region Strcture Plan) මඟිනි. එම සැලැස්ම මඟින් මෙතෙක් කොළඹ ප්‍රදේශයට සීමාව පැවති නාගරික සැලසුම්මය මැදිහත් වීමෙන් ඔබ්බට ගොස්, කොළඹ ප්‍රදේශයෙන් පිටතට විහිදුණු කලාපයන් පිළිබඳ අවධානය යොමු කර ඇත. ඒ අනුව මෙම කලාපීය ව්‍යුහ සැලැස්ම තුළ කොළඹ ප්‍රදේශය හර කලාපය (Core Area) ලෙසත් තවත් හඳුනාගත් අනු ප්‍රධාන ප්‍රදේශ හයක් සංවර්ධක මධ්‍යස්ථාන (Growth Centers) ලෙසත් ව්‍යුහගත කර ඇති අතර, ගම්පහ ප්‍රදේශය මෙම කලාපීය සැලැස්ම තුළ සංවර්ධක මධ්‍යස්ථානයක් (A Growth Center) ලෙස හඳුනාගෙන පැවතීම පූර්ව සැලසුම් මැදිහත්වීමෙහිලා වැදගත් ස්ථානයක් ගනී. එම මහ කොළඹ කලාපීය ව්‍යුහ සැලැස්ම (Colombo Metro Region Strcture Plan) පහත රූප සටහන 2.10 මඟින් දක්වා ඇත.

එසේම ඉන් පසුව සිංගප්පූරු උපදේශක කණ්ඩායමකගේ සහයෝගීතාවයෙන් සකස් කරන ලද බස්නාහිර මෙගාපොලිස් සැලැස්ම (Western Megapolis Plan by CESMA – 2002/3) වර්ෂ 2002 දී සංකල්පගත කරන ලද අතර එහිදී මුළු බස්නාහිර පළාතම තනි කලාපයක් ලෙස සළකා සංකල්පිත සැලසුම් සකස් කරන ලදී. එහිදී අභ්‍යන්තර කවයක් සහ පිටත කවයක් (Inner Ring Township & Outer Ring Township) ලෙස කලාපය සැලසුම් කළ අතර ගම්පහ ප්‍රදේශය මෙම අභ්‍යන්තර කවයට නොහොත් inner Ring Township ප්‍රදේශයට අයත් විය. එම බස්නාහිර මෙගාපොලිස් සැලැස්ම (Western Megapolis Plan by CESMA – 2002/3) හි සංකල්පිත සැලැස්ම පහත රූප සටහන 2.11 මඟින් දක්වා ඇත.

*රූප සටහන 2.10 : කොළඹ මහ කලාපීය ව්‍යුහ සැලැස්ම (CMRSP ) - 1998*




*රූප සටහන 2.11 : බස්නාහිර මෙගාපොලිස් සැලැස්ම (CESMA Plan) - 2002/3*




මූලාශ්‍රය : මෙගාපොලිස් සැලැස්ම, බස්නාහිර පළාත් මහ සැලැස්ම - 2030, මෙගාපොලිස් සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, 2017

ඉහත සඳහන් කරන ලද කලාපීය මට්ටමේ මැදිහත් වීම් වලට අමතරව ගම්පහ නගරය මූලික කර ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුල් වරට ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි සැලැස්මක් සකස් කරන ලද අතර එම සැලැස්ම ගම්පහ නගර සංවර්ධන සැලැස්ම (2006-2026 ) ලෙස අංක 1585/27 හා 2009.01.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කොට ක්‍රියාත්මක කරන ලදී. එම සංවර්ධන සැලැස්මේ කලාපීකරණ සැලැස්ම පහත රූප සටහන 2.12 මඟින් දක්වා ඇත.

*රූප සටහන 2.12 : ගම්පහ නගර සංවර්ධන සැලැස්ම (2006-2026 ), කලාපීකරණ සැලැස්ම*




මූලාශ්‍රය : ගම්පහ නගර සංවර්ධන සැලැස්ම (2006-2026), ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ

### 2.3.4. ජාතික හා කලාපීය වැදගත්කම

ජාතික හා කලාපීය සැලසුම් වලින් ගම්පහ ප්‍රදේශයට ලැබී ඇති ප්‍රමුඛතාවය පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන් ජාතික හා කලාපීය සැලසුම් කිහිපයක් කෙරේ අවධානය යොමු කළ යුතුය.

ඒ අනුව මුළු දිවයිනම ආවරණය වන පරිදි සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම - 2048 (National Physical Plan) තුළින් ජනාවාස ධූරාවලියක් හඳුන්වා දීම මඟින් ශ්‍රී ලංකාවේ පවතින්නා වූ අවකාශීය ව්‍යුහයට මැදිහත් වීමට අදහස් කරයි. ජනාවාසවල භූගෝලීය, ඓතිහාසික, ක්‍රියාකාරී සහ ආර්ථික පැතිකඩ පාදක කොටගෙන මෙම වර්ගීකරණය නිර්මාණය වී ඇති අතර එමඟින් රටේ සියලුම ප්‍රධාන නගර , නගරබද ප්‍රදේශ, ව්‍යාපාරික කලාප හා ග්‍රාමීය ප්‍රදේශ එකිනෙක සම්බන්ධ කරනු ඇත. ඒ අනුව ජාතික භෞතික සැලැස්ම - 2048 මඟින් මූලික ජනාවාස වර්ග කිහිපයක් හඳුනාගෙන ඇත.

1. බහුමාන වාණිජ නගර (Multi- Dimentional Commercial Cities ) : *(ජාත්‍යන්තර සහ ජාතික ජාලයන් සම්බන්ධකිරීමේ මධ්‍යස්ථාන)*
2. ජාතික නගර (National Cities) : *(ඓතිහාසික, සමාජයීය හා ආර්ථික තත්ත්වයන් මත පදනම් වූ දිස්ත්‍රික් අගනගර)*
3. සම්බන්ධීකරණ නගර (Connecting Cities) : *(බහුමාන වාණිජ නගර හා ජාතික නගර සම්බන්ධ කරමින් එම නගරවලින් පිටවන අතිරික්ත ජනගහනය සඳහා වාසස්ථාන සොයනු ලබන නගර)*
4. නාගරික සාමූහික (Urban Agglomerations) : *(මන ලෙස සැලසුම් හා සංවර්ධනය කළ යුතු වන, ජාතික නගර හෝ නාගරික මධ්‍යස්ථානවල නාගරික ප්‍රදේශවලින් සමන්විත, අවිධිමත් ලෙස පැතිරයන නාගරීකරණයේ ප්‍රතිඵල ලෙස හඳුනාගන්නා ලද නාගරික සාමූහික)*
5. නාගරික මධ්‍යස්ථාන/ග්‍රාමීය පොකුරු (Urban Centres / Rural Clusters) *: (ග්‍රාමීය ජීවිතයට සුදුසු වන සහ තොරතුරු තාක්ෂණය, දැනුම හා සංචාරක සේවා සමඟින් ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික සහ හෝ කාර්මික අංශයන් එකක් හෝ කිහිපයක් මුල්කරගත් මධ්‍යස්ථාන)*

මින් ගම්පහ නගරය ජාතික නගරයක් ලෙස ජාතික භෞතික සැලැස්ම තුළ හඳුනාගෙන ඇති අතර ගම්පහ නගර ක්‍රියාකාරීත්වයේ ප්‍රධාන පැති ලෙස සේවා හා ගමනාගමනය හඳුනාගෙන ඇත. තවද මෙම ප්‍රදේශය බස්නාහිර පළාත් නාගරික සාමූහික (Urban Agglomerations) කලාපයට අයත් වේ. මෙම යෝජිත අවකාශීය ව්‍යුහ සැලැස්ම -2048 පහත රූප සටහන 2.13 මඟින් දක්වා ඇත.

එසේම වර්ෂ 2017 දී සකස් කරන ලද බස්නාහිර කලාපීය මෙගාපොලිස් ගමනාගමන මහ සැලැස්ම (Western Region Megapolis Transport Master Plan) මඟින් කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල නාගරික ගමනාගමනය මත දැඩි ලෙස රැඳී පවතින කලාපය හඳුනාගෙන මෙම සැලැස්ම සකස් කොට ඇති අතර එම සැලැස්ම තුළ ගම්පහ නගරය ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් ලෙසත් යක්කල, මිරිස්වත්ත, ගනේමුල්ල, වැලිවේරිය උප නාගරික මධ්‍යස්ථාන ලෙසත් හඳුනාගෙන ඇත.
එම බස්නාහිර කලාපීය මෙගාපොලිස් ගමනාගමන මහ සැලැස්මෙහි (Western Region Megapolis Transport Master Plan) අපේක්ෂිත නාගරික ව්‍යුහ සැලැස්ම රූප සටහන 2.14 මඟින් දක්වා ඇත.

තවද නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කර ඇති බස්නාහිර කලාපීය ව්‍යුහ කෙටුම්පත් සැලැස්ම - 2030 (Western Province Structure Draft Plan ) මගින් ගම්පහ ප්‍රදේශය හඳුනාගනු ලැබ ඇත්තේ කොළඹ හර ප්‍රදේශයෙන් (Core Area) අතිරික්ත වන ජනගහන හා සංවර්ධන පීඩනය ආකර්ෂණය කර ගත හැකි ආකාරයේ මධ්‍යම ඝනත්ව නේවාසික සහ මිශ්‍ර වාණිජ සංවර්ධනයකින් යුත් පිටත හර (Outer Core Area ) ප්‍රදේශයට අයත් ප්‍රදේශයක් ලෙසය. එම බස්නාහිර කලාපීය ව්‍යුහ කෙටුම්පත් සැලැස්ම - 2030 හි සංකල්පිත ව්‍යුහ සැලැස්ම රූප සටහන 2.15 මගින් දක්වා ඇත.



මූලාශ්‍රය: ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2023

රූප සටහන 2.14 : නාගරික ව්‍යුහ සැලැස්ම, බස්නාහිර කලාපීය මෙගාපොලිස් ගමනා




මූලාශ්‍රය: මෙගාපොලිස් සැලැස්ම, බස්නාහිර පළාත් ගමනාගමන මහ සැලැස්ම, මෙගාපොලිස් සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,2016

රූප සටහන 2.15 : බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්ම -2030




මූලාශ්‍රය: බස්නාහිර පළාත් අංශය, නා.සං.අ, 2017

මීට අමතරව අන්තර්ජාතික වශයෙන් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals ) දාහත මඟින් වර්ෂ 2030 වන විට ලෝකය තුළ නිරෝගී , සැමට යහපත් ජීවිතයක් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරයි. එම තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals ) සපුරා ගැනීමෙහි ලා එම ඉලක්කයන්ගේ නගර සංවර්ධනයට අදාළ ඉලක්කය වන තිරසාර නගර සහ ප්‍රජාවන් (Sustainable Cities & Communities) යන්න මුල් කොට ගෙන හුදකලා නොවූ, ආරක්ෂිත, ඕනෑම තත්ත්වයකට මුහුණ දිය හැකි නගර සහ ජනාවාස ඇති කිරීමේ පරමාර්ථය අනුව යමින් මෙම නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමද මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. එම තිරසාර සංවර්ධන ඉලක්කයන් රූප සටහන 2.16 මඟින් දක්වා ඇත.

*රූප සටහන 2.16 : තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals)*




මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින් : https://sdgs.un.org/goals, 2022

## 2.3.5. වත්මන් ගම්පහ

### 2.3.5.1. සමාජීය අංශය

#### අ. ජනගහනය

බස්නාහිර පළාත සමඟ සංසන්දනය කිරීමේදී කොළඹ හර ප්‍රදේශයේ තිබෙන ජනගහන ආකර්ෂණය ක්‍රම ක්‍රමයෙන් කොළඹට ආසන්නයේ ඇති ගම්පහ දිස්ත්‍රික්කයට අයත් නගර කරා ඒකරාශී වීම දැක ගත හැකිය. බස්නාහිර පළාත තුළ එම ජන ඝනත්ව ව්‍යාප්තිය පහත සිතියම2.3 මඟින් නිරූපණය වේ.

*සිතියම2.3: බස්නාහිර පළාත තුළ ජන ඝනත්ව ව්‍යාප්තිය, 2017*




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

සැකසුම : සැලසුම් කණ්ඩායම, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ

2019 වසර වන විට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු ජනගහනය ආසන්න වශයෙන් 227,000 කි. රූප සටහන 2.17 මඟින් දැක්වෙන පරිදි ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිළිවලින් කටාන , මහර , ජා -ඇල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැරුණු විට වැඩිම ජනගහනයක් ජීවත් වන ප්‍රදේශය ලෙස ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හඳුන්වා දිය හැක. වර්ග කිලෝමීටර 92 ක භූමි භාගයක් තුළ විසිරී පැතිර ඇති මෙම ජනගහනය ගම්පහ දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 8.5% කි. මෙම ජනගහනයෙන් 31% ක් (70,000 පමණ ) ගම්පහ නගර සභා බල ප්‍රදේශය තුළත්, 69% ක් (157,00 පමණ ) ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුලත් ලෙස ව්‍යාප්තව ඇත. ප්‍රදේශයේ ජන ඝනත්වය සලකා බැලූ විට ව.කි. 1 කට පුද්ගලයන් 2450 ක් පමණ වේ. ගම්පහ ප්‍රදේශයේ ජන ඝනත්වය සිතියම2.4 මඟින් නිරූපණය වේ.

*රූප සටහන 2.17 : ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ජනගහනය -2017*




මූලාශ්‍රය: ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2018

එමෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය තුළ ජනගහන වර්ධන අනුපාතිකය පිළිබඳව සලකා බැලීමේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජනගහන වර්ධන අනුපාතිකය 1.46% කි. එය පහත වගුව2.3 ඔස්සේ සංසන්දනාත්මකව දක්වා ඇත .

*වගුව 2.3 : ජනගහන වර්ධන අනුපාතය සංසන්දනය*

| | වර්ධන අනුපාතිකය (%) වර්ෂය (2011-2021) |
|---|---|
| ජාතික වර්ධන අනුපාතිකය | 0.75% |
| කොළඹ දිස්ත්‍රික්කය | 0.35% |
| ගම්පහ දිස්ත්‍රික්කය | 1.05% |
| ගම්පහ ප්‍රා.ලේ.කො බල ප්‍රදේශය | 1.46% |
| ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය | 0.80% |
| ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | 1.80% |

මූලාශ්‍රය: ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2018

එමෙන්ම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජනගහන පුරෝකථනය පිළිබඳ සැලකීමේදී ඉහත සඳහන් අන්දමට 1.46% ස්වභාවික වර්ධන අනුපාතයකින් ජනගහනය වර්ධනය වුවහොත් වර්ෂ 2033 වන විට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහනය 273,000 ක් පමණ වන බවට ගණනය කර ඇති අතර ඒ අනුව ජනගහන ඝනත්වය ව.කි. 1 කට පුද්ගලයන් 2950 ක් පමණ වේ.

*සිතියම2.4 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජන ඝනත්ව ව්‍යාප්තිය*




මූලාශ්‍රය: සැලසුම් දෙපාර්තමේන්තුව, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019

සැකසුම : සැලසුම් කණ්ඩායම, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සමාජ පසුබිම අධ්‍යනයය කිරීමේදී ජාතීන් අනුව ගත් කළ 99% ක්ම සිංහල වේ. එමෙන්ම ආගම අනුව ගත් විට 88% බෞද්ධයන් වන අතර 11% රෝමානු කතෝලික ප්‍රජාව වෙයි. එමෙන්ම ඉතිරි 1% ක ප්‍රමාණය අනෙකුත් කතෝලික ආගම් වලට අයත් වන්නන් වෙයි.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය සැලකීමේදී 48% ක් පුරුෂ පක්ෂයටද, 52% ක් කාන්තා පක්ෂයටද අයත් වේ. වයස් සංයුතිය ගත් කළ 22% ක ප්‍රමාණයක් වයස අවුරුදු 14 ට අඩු, ළමා ජනගහනය වන අතර 63 % ක් වයස අවුරුදු 15-59 ත් අතර වයස් බාණ්ඩයට අයත් වේ. එමෙන්ම 15% ක් වූ ජනගහනය වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටි ජනගහනය වේ. එසේම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මුළු යැපීම් අනුපාතිකය 58 % ක් වේ. ගම්පහ

## ආ. අධ්‍යාපනය

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අධ්‍යාපන තත්ත්වය පිලිබඳ සළකා බැලීමේදී ගම්පහ දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ වැඩිම සාක්ෂරතාවයක් සහිත දිස්ත්‍රික්කය ලෙස පැවතීම අධ්‍යාපනික මට්ටම අතින් වැදගත් තැනක් හිමිකර ගනී. ගම්පහ දිස්ත්‍රික්ක තුළ සාක්ෂරතාවය 98.5% ක් වේ. ජාතික සාක්ෂරතාවය හා සැසඳීමේදී මුළු ගම්පහ දිස්ත්‍රික්කය තුළම අධ්‍යාපනික මට්ටම ප්‍රශස්ත තත්ත්වයක පවතී. එය පහත වගුව2.4 මඟින් නිරූපණය කළ හැකිය.

*වගුව 2.4: ගම්පහ දිස්ත්‍රිකයේ අධ්‍යාපනය සාක්ෂරතාව*

| දර්ශකය | ගම්පහ දිස්ත්‍රික්කය (%) | ජාතික (%) |
|---|---|---|
| උපාධි හෝ ඉහළ | 7% | 2.5% |
| ඉංග්‍රීසි භාෂා කථනය | 34% | 20% |
| ඉංග්‍රීසි භාෂා ලිවීම සහ කියවීම | 41% | 26% |
| පරිගණක සාක්ෂරතාවය | 33.4% | 28.3% |
| සාක්ෂරතාවය | 98.5% | 93.2% |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2018

එමෙන්ම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ අධ්‍යාපනික මට්ටම ගත් කළ ජනගහනයෙන් 36% ද්විතික අධ්‍යාපන මට්ටම තුළ ද ඉන්පසු සෙසු බහුතරය සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ මට්ටමටද අයත් වේ. එම දත්ත විශ්ලේෂණයන් පහත රූප සටහන 2.18 මඟින් නිරූපනය කර ඇත.

*රූප සටහන අංක 2.18 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අධ්‍යාපනික මට්ටම*




මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2018

## ඇ. නිවාස

එසේම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස ඒකක 57,000 ක් පමණ පවතින අතර ඉන් 16,000 ක් පමණ ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළත්, 41,000 කට අධික අනෙකුත් නිවාස ප්‍රමාණය ගම්පහ ප්‍රදේශිය සභාව තුළත් විසිරී ඇත. ප්‍රදේශය තුළ සාමාන්‍ය නිවාස ඝනත්ව ව.කි. 1 කට නිවාස 620 ක් වන අතර නිවාස ඒකකයක ජිවත්වන සාමාන්‍ය පුද්ගලයන් ගණන 04 ක් වේ. නිවාස ඝනත්ව ව්‍යාප්තිය සංසන්දනය කිරීමේදී ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ හා වත්තල, ජා-ඇල සහ කඩවත නගර වලට මායිම්ව පිහිටි වූ ප්‍රදේශ තුළ නිවාස ඝනත්වය වැඩි බව පෙනී යයි. මෙම නිවාස ඝනත්ව ව්‍යාප්තිය සිතියම2.5 මඟින් නිරූපණය වේ. එසේම මෙම නිවාස වලින් 98% ක් තනි නිවාස හා තට්ටු නිවාස වන අතර ඉතිරි ප්‍රතිශතය උප ගෘහ, මහල් නිවාස, ද්විත්ව නිවාස, පේළි නිවාස හා පැල්පත් නිවාස වේ. එනයින් එළඹිය හැකි නිගමනය වන්නේ මෙම ප්‍රදේශය තුළ නිවාස ඒකකයකට හිමිවන භූමි පරිභෝජනය ප්‍රශස්ථ මට්ටමක පවතින බවය. එසේම මෙම නිවාස වලින් 88% ක් ස්ථිර නිවාස වන අතර, 14 % අර්ධ ස්ථිර නිවාස හා ඉතිරි 1% තාවකාලික නිවාස වේ.

*සිතියම2.5 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස ඝනත්වය*




මූලාශ්‍රය: සැලසුම් දෙපාර්තමේන්තුව, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019

සැකසුම : සැලසුම් කණ්ඩායම, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ

### ඈ. රැකියා නියුක්තිය

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය 63% ක් වන අතර ආර්ථික වශයෙන් සක්‍රිය නොවන ජනගහනය 37% කි. මෙම ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයෙන් 55% ක් රැකියා නියුක්ත ජනගහනය වන අතර, 45% රැකියා වියුක්ත ජනගහනය වෙයි.

එසේම මෙම රැකියා නියුක්ත ජනගහනය රැකියා වල ස්වභාවය අනුව පහත රූප සටහන 2.19 පරිදි වර්ගීකරණය කළ හැකිය. ඒ අනුව රැකියා නියුක්ත ජනගහනයෙන් 72% ක් පමණ රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා වල නියුතු අය වන අතර සෙසු 13 % ක් පමණ ස්වයං රැකියා ද, 10% ක් පමණ තාවකාලික රැකියාද, 5% ක් පමණ විදේශ රැකියා ද සිදු කරනු ලබයි.

*රූප සටහන අංක 2.19 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රැකියාවේ ස්වභාවය අනුව රැකියා නියුක්ත ජනගහනය*




මූලාශ්‍රය: සැලසුම් දෙපාර්තමේන්තුව, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019

## 2.3.5.2. භෞතික අංශය

### අ. භූමි පරිභෝජනය

ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භූමි පරිභෝජනය සලකා බැලීමේදී මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 92 ක් පමණ වන අතර එම භූමියෙන් මුළු සංවර්ධිත ප්‍රදේශය 59% කි. එම සංවර්ධිත ප්‍රදේශයෙන් 47% ක් ගෙවතු හා නේවාසික ප්‍රදේශ වේ. එමෙන්ම දැනට සංවර්ධන නොවූ නමුත් සංවර්ධන විභවතාවක් සහිත මුළු භූමි ප්‍රමාණය 15% ක් වන අතර සංවර්ධන කිරීමට නොහැකි පාරිසරික සංවේදී ප්‍රදේශය මුළු භූමි ප්‍රමාණයෙන් 26% කි. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භූමි පරිහරණ සිතියම පහත සිතියම2.14 මඟින් දක්වා ඇත . එසේම ඒ එක් එක් භූමි පරිභෝජනයන් ඉහත විස්තර කළ ආකාරයට සංවර්ධන විභවතාවන් අනුව වගුව2.5 මඟින් දක්වා ඇත.

*වගුව 2.5 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ භූමි පරිභෝජනය වර්ගීකරණය*

| භූමි පරිහරණය | භූමි ප්‍රමාණය (ව.කි) | මුළු භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|
| ගෙවතු /නේවාසික | | 47 |
| බැංකු සහ මුල්‍ය ,ව්‍යාපාරික, හෝටල් | | 1.3 |
| පරිපාලන , සෞඛ්‍ය , අධ්‍යාපනික , විනෝද උද්‍යාන , රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ,සමාජ/සංස්කෘතික /ආගමික මධ්‍යස්ථාන , උපයෝගීතා , හිස් ගොඩනැගිලි හා වෙනත් | | 1.7 |
| කර්මාන්ත | | 0.2 |
| මහ නගර සභා හා ප්‍රාදේශීය සභා මාර්ග , වෙනත්,මාර්ග , මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග , පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය අයත් මාර්ග , දුම්රිය මාර්ග, ප්‍රවාහන හා සම්බන්ධ වෙනත් ක්‍රියාකාරකම් සහිත ප්‍රදේශ. | | 03 |
| ගොඩනඟන ලද ප්‍රදේශය | 54 | 59% |
| පොල් | | 11 |
| වෙනත් වැවිලි | | 03 |
| රබර් | | 0.5 |
| භාවිත නොකළ ප්‍රදේශය | | 0.1 |
| හිස් ඉඩම් | | 01 |
| සංවර්ධනය කළ හැකි ප්‍රදේශය | 14 | 15% |
| අතහැර දැමූ කුඹුරු | | 0.5 |
| වගුරු | | 1.2 |
| කුඹුරු | | 22 |
| කළු ගල් | | 0.01 |
| ලඳු කැලෑ | | 0.8 |
| පාරිසරික සංවේදී | 24 | 26% |

මූලාශ්‍රය: භූ ගෝලීය තොරතුරු පද්ධති අංශය , නාගරික සංවර්ධන අධිකාරිය , 2019

එසේම ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එක් නිවාස ඒකකයක් විසින් පරිභෝජනය කරන අවම ගොඩ ඉඩම් භූමි ප්‍රමාණය පහත රූප සටහන 2.20 මඟින් නිරූපනය වන අතර නිවාස ඒකක වලින් 74% ක පමණ ප්‍රමාණයක් පර්චස් 40 ට අඩු භූමියක් පරිහරණය කරණු ලබයි. ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ අවම නේවාසික භූමි භාවිතය පර්චස් 06 ක් වුවද ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවම නේවාසික භූමි ප්‍රදේශය පර්චස් 10ක් වේ. කෙසේ නමුත් නේවාසික අනු බෙදුම් හැරුණු විට මෙම සැලසුම් බල ප්‍රදේශය තුළ තනි නිවාස ඒකකයක් විසින් මෙම අවම බිම් ප්‍රමාණයට සීමා නොවී ප්‍රශස්ත නේවාසික භූමි පරිභෝජනයක් සිදු කරනු ලබයි. එසේම පර්චස් 40-80 ත් අතර ගොඩ ඉඩම් භාවිත කරන නිවාස ඒකක 19% කුත්, පර්චස් 80 -

අක්කර 2 ත් අතර ගොඩ ඉඩම් භාවිත කරන නිවාස ඒකක 06% කුත් පැවතීම මගින් ඉහත නිගමනය තව දුරටත් සනාථ වේ. එසේම අනාගත නේවාසික ඉල්ලුම සැපයීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවයක් මෙම ප්‍රදේශය තුළ පවතින බවද මෙමගින් පැහැදිලි වේ.

*රූප සටහන 2.20 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිවාස ඒකකයක් විසින් පරිහරණය කරන ලබන ගොඩ ඉඩම් ප්‍රමාණය*




මූලාශ්‍රය: සැලසුම් අංශය, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , 2019

*සිතියම2.6 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ භූමි පරිභෝජන අවකාශීය සැලැස්ම*




මූලාශ්‍රය: භූ ගෝලීය තොරතුරු පද්ධති අංශය , නාගරික සංවර්ධන අධිකාරිය , 2019

සැකසුම : සැලසුම් කණ්ඩායම, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ

### ආ. ගමනාගමනය

ප්‍රවාහන පද්ධතිය පිළිබඳව සළකා බැලීමේදී එකිනෙකට සම්බන්ධ වූ මාර්ග පද්ධතියක් ගම්පහ ප්‍රදේශය තුළ දැකිය හැක. ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාත අනෙකුත් ප්‍රදේශ හා සම්බන්ධ වන ප්‍රධාන මාර්ග ජාල 07න් එක් මාර්ග ජාලයක් වන කොළඹ - නුවර මාර්ග ජාලය ගම්පහ ප්‍රදේශය හරහා ගමන් කිරීම ගමනාගමනය අතින් වැදගත් තැනක් හිමිකර ගනී. එසේම ගම්පහ නගරය හරහා ලංකාවේ ප්‍රධාන වාණිජ නගරය වන කොළඹ නගරය ඇතුළුව ප්‍රධාන නගර සඳහා  සහසම්බන්ධිත මාර්ග ජාලයක්  ඔස්සේ පහත වගුව2.6 පරිදි පිවිසුම් විවෘත වේ. ඒ අනුව, ගම්පහ - මිරිස්වත්ත මාර්ගයේ සිට නව කොළඹ මාර්ගය හරහා කඩුවෙල දෙසටත්, ගම්පහ - ජා- ඇල මාර්ගය හරහා ජා - ඇල නගරයට සහ අධිවේගී මාර්ගය හරහා කටුනායක දෙසටත්, ගම්පහ  - යක්කල මාර්ගය හරහා නුවර පාරට සහ නිට්ටඹුව දෙසටත්, ගනේමුල්ල - රාගම මාර්ගය හරහා රාගම දෙසටත්, ගම්පහ - මිනුවන්ගොඩ මාර්ගය හරහා මිනුවන්ගොඩ, දෙසටත් විහිදී යයි. එසේම අධිවේගී මාර්ග ජාලය තුළ රූප සටහන 2.21 දැක්වෙන පරිදි ප්‍රධාන අන්තර් හුවමාරු වලට ආසන්න දුරකින් ගම්පහ නගරය පිහිටා තිබීමද, ඉදිකෙරෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරුවක් ගම්පහ නගරය ආශ්‍රිතව ඉදිවීමද ගමනාගමනය තුළ වැදගත් ස්ථානයක් ගනී.

*රූප සටහන අංක 2.21 : සහසම්බන්ධිත මාර්ග ජාලය  ඔස්සේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වලට හා අවට ප්‍රධාන නගර වලට ඇති සම්බන්ධය හා සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින දුම්රියස්ථාන*




සැකසුම : සැලසුම් කණ්ඩායම, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ

*වගුව2.6 : සැලසුම් බල ප්‍රදේශය හා අවට ප්‍රධාන නගර වලට මහා මාර්ග ජාලය ඔස්සේ ඇති ඇති ආසන්න දුර*

| මාර්ග ජාලය | ගමනාන්තය | දුර (කි.මී) |
|---|---|---|
| කොළඹ -නුවර මාර්ගය ඔස්සේ | කොළඹ | 26 |
| | නිට්ටඹුව | 16 |
| | කඩවත | 11 |
| බැලුම්මහර සිට නව නුවර පාර ඔස්සේ | කඩුවෙල | 20 |
| ගම්පහ - ජා ඇළ මාර්ගය ඔස්සේ | ජා ඇළ | 14 |
| | කටුනායක | 21 |
| ගනේමුල්ල - රාගම මාර්ගය ඔස්සේ | රාගම | 8 |
| ගම්පහ - මිනුවන්ගොඩ මාර්ගය ඔස්සේ | මිනුවන්ගොඩ | 16 |

මූලාශ්‍රය : ගූගල් සිතියම් , 2021

එසේම, ගම්පහ නගරය තුළ ප්‍රධාන පොදු ප්‍රවාහන සේවා ලෙස බස් සේවාව හා දුම්රිය සේවාව පවතින අතර ගම්පහ බස් පර්යන්තය දැනට අන්තර් පළාත් 03 ක් සඳහා සහ පළාත ඇතුළත බස් රථ මාර්ග 24 ක් සඳහා සේවා සපයනු ලබයි. මුළු බස් රථ සංඛ්‍යාව 500ක් පමණ වන අතර දෛනිකව ගමන් වාර 1500කට අධික ප්‍රමාණයක් සිදු කරනු ලබයි. නගරයට ඇතුළු වන බොහෝ බස් රථ පෝෂක සේවා (Feeder Services ) බස් රථ වන අතර වන අතර මේ හේතුවෙන් ගම්පහ බස් පර්යන්තය ප්‍රධාන සංක්‍රමණ මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත.

එසේම දුම්රිය මාර්ග පද්ධතිය ගත් කළ ලංකාවේ ප්‍රධාන දුම්රිය මාර්ග ජාලයේ, ප්‍රධාන දුම්රිය නැවතුම්පලක් ලෙස ගම්පහ දුම්රිය ස්ථානය හඳුන්වාදිය හැකිය. එය කොළඹ සිට ගත් විට ප්‍රධාන දුම්රිය මාර්ග ජාලයේ 15 වන නැවතුම්පල වෙයි. ඊට අමතරව ගම්පහ සැලසුම් බල ප්‍රදේශය තුළ යාගොඩ, ගනේමුල්ල , බුළුගහගොඩ යන දුම්රිය ස්ථාන පිහිටා ඇති අතර ප්‍රදේශය පුරා විසිරී සිටින නේවාසික ජනගහනය සඳහා එම දුම්රිය ස්ථාන මඟින්ද ප්‍රවාහන සේවාවෙහි ලා විශාල කාර්යයක් සිදු කරනු ලබයි.

2014 ප්‍රධාන ප්‍රවාහන සැලැස්මට (Transport Master Plan - 2014 ) අනුව රූප සටහන 2.22 දැක්වෙන පරිදි දිනකට ගම්පහ දුම්රිය ස්ථානයේ සිට දිශාවන් දෙකටම යන මගීන් සංඛ්‍යාව 75,000 ක් පමණ වෙයි. එසේම රූප සටහන 2.23 පරිදි එම සැලැස්ම විසින් කරනු ලැබූ සමීක්ෂණයකට අනුව ගම්පහ නගරය දුම්රිය මාර්ග ජාලය තුළ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙසත්, නගරය තුළ දෛනික චාරිකා ජනනනය (Daily Trip Generation ) වීමට දුම්රිය ස්ථානය මූලික වන බවත් හඳුනාගෙන ඇත.

*රූප සටහන 2.22 : දුම්රියේ දෛනික මගී සංසරණය (දිශාවන් දෙක ඔස්සේ)*




මූලාශ්‍රය : Megapolis Transport Master Plan, Final Report, 2016

*රූප සටහන 2.23 : දුම්රිය මාර්ගය ඔස්සේ වැඩිම ගමනාගමනයක් සිදුවන මධ්‍යස්ථානයකි*



මූලාශ්‍රය : Megapolis Transport Master Plan, Final Report, 2016

### ඈ. අධ්‍යාපනය

අධ්‍යාපන පහසුකම් පිළිබඳව සැලකීමේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආවරණය වන පරිදි අධ්‍යාපන පහසුකම් විහිදී ඇති අතර ප්‍රශස්ත මට්ටමේ රජයේ පාසල් ගණනාවක් පිහිටා ඇත. ලංකාව පුරා විහිදී ඇති ජාතික පාසැල් 72 න් ජාතික පාසැල් 3 ක් ගම්පහ ප්‍රදේශයේ පිහිටා ඇත. එසේම එම පාසල් තුන 1ඒබී කාණ්ඩයට අයත් පාසල් වන අතර 1ඒබී කාණ්ඩයට අයත් පළාත් සභා පාසල් 07ක් ගම්පහ නගරය ආශ්‍රිතව පිහිටා ඇති අතර බාලක පාසල් 01ක් ද බාලිකා පාසල් 02ක්ද මිශ්‍ර පාසල් 45 ක් ද ඇතුළුව වගුව2.7 දැක්වෙන පරිදි ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශට අයත් මුළු පාසල් සංඛ්‍යාව 48කි. ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් අතුරින් වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් එනම් 46,000 අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් වල ඉගෙනුම ලබන අතර එය දිස්ත්‍රික්කයේ ප්‍රතිශතයක් ලෙස 13% කි. ගුරු ශිෂ්‍ය අනුපාතිකය 1: 22 කි. එසේම මෙම පාසල් බොහොමයක් ඇමුණුම 13 පරිදි ගම්පහ නගරය තුළටම කේන්ද්‍ර වී පවතී.

*වගුව2.7: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ පාසල් වර්ගීකරණය*

| පාසල | අයත් ශ්‍රේණි කාණ්ඩය | පාසල් ගණන | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජාතික | 1ඒබී | 03 | 542 | 12,460 |
| පළාත් | 1ඒබී | 07 | 538 | 12,617 |
| | 1සී | 04 | 317 | 7887 |
| | 2 ශ්‍රේණිය | 18 | 441 | 7678 |
| | 3 ශ්‍රේණිය | 16 | 234 | 5489 |
| මුළු එකතුව | | 48 | 2072 | 46,131 |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2019

එසේම, ප්‍රධාන පෙළේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික පාසල් 10 ක් පමණ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ පවතී. එම පාසල් වල සිසුන් 12,000 පමණ අධ්‍යාපනය ලබන අතර 750 කට අධික ගුරු සංඛ්‍යාවකගෙන් යුක්තය.

ඊට අමතරව තාක්ෂණික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන කාර්මික විද්‍යාලයක් යක්කල ප්‍රදේශයේ පිහිටා තිබීමත්, කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වික්‍රමආරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලද ගම්පහ යක්කල ප්‍රදේශය තුළ පිහිටා තිබීම ද මෙහි ලා වැදගත්වේ.

එසේම උපකාරක පන්ති සම්බන්ධයෙන් ගම්පහ නගරය විශේෂ ප්‍රසිද්ධියක් උසුලන අතර දෛනිකව උපකාරක පන්ති සඳහා නගරයට ඇදී එන සිසුන් සංඛ්‍යාව 40,000 ක් පමණ වේ.

### ඈ. සෞඛ්‍ය

සෞඛ්‍ය පහසුකම් පිළිබඳව සළකා බැලීමේදී, මූලික වශයෙන් ගම්පහ ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල ගම්පහ නගර මධ්‍යයේ පිහිටා ඇත. ඊට අමතරව ගණේමුල්ල නගරය තුළ රජයේ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකයක් පවතින අතර සැලසුම් බල ප්‍රදේශයේ පවතින ප්‍රධාන උප නගරයක් ලෙස එහි ජීවත් වන නේවාසික ජනගහනයට සෞඛ්‍ය සේවා සැලසීම සඳහා තව දුරටත් එම ප්‍රතිකාර ඒකකය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වෙයි. එසේම ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට ප්‍රසිද්ධියක් උසුලන වික්‍රමආරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලද රෝගීන් සඳහා නේවාසික හා බාහිර රෝගී ප්‍රතිකාර සිදු කරනු ලබයි. එම එක් එක් රෝහල් වල රෝහල් ධාරිතාවය හා වර්ෂයකට ලියාපදිංචි වන රෝගීන් සංඛ්‍යාව පහත වගුව2.8 මඟින් දක්වා ඇත.

ඊට අමතරව ගම්පහ ප්‍රදේශයට ආසන්නව පවතින ජාතික රෝහලක් ලෙස රාගම ශික්ෂණ රෝහලද ගම්පහ දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි තම සේවා සපයනු ලබයි. එසේම ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල මුල් කරගනිමින් ඒ අවට කලාපය සෞඛ්‍ය සේවා කලාපයක් ලෙස පෞද්ගලික රෝහල් සමූහයක් සහ රසායනාගාර සේවා රැසක් සමඟ වර්ධනය වන ආකාරය දැක ගත හැකිය.

*වගු අංක 2.8 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රජයේ රෝහල් වල ධාරිතාවය*

| පළාත් පාලන බල ප්‍රදේශය | රෝහලේ නම | වාට්ටු සංඛ්‍යාව | ඇදන් සංඛ්‍යාව | වර්ෂයකට ඇතුළත් කළ බාහිර රෝගීන් සංඛ්‍යාව | වර්ෂයකට ඇතුළත් කළ අභ්‍යන්තර රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ගම්පහ මහ නගර සභාව | ගම්පහ දිස්ත්‍රික් මූලික රෝහල | 20 | 833 | 356,824 | 100,720 |
| | වික්‍රමආරච්චි ආයුරුවේද ශික්ෂණ රෝහල | 04 | 105 | 1071 | 89,362 |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2020

### ඉ. පරිපාලන සේවා

ගම්පහ නගරය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරය ලෙස රජයේ ආයතන 75 කට අධික සංඛ්‍යාවක් කේන්ද්‍රගතව පවතින අතර ඒ හේතුවෙන් දෛනිකව ගම්පහ නගරයට ඇදී එන ආයතන සේවකයන් ප්‍රමාණය 4250 ක් පමණ වෙයි. මෙම රාජ්‍ය ආයතන වලින් ආයතන 50 කට වැඩි සංඛ්‍යාවක් එක් පරිපාලන කලාපයක් ලෙස ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ එක් පරිපාලන සංකීර්ණයකට කේන්ද්‍රගතව පැවතීම නගර සැලසුම්කරණය තුළ සාධනීය කරුණක් වේ. එසේම ඊට අමතරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයට ආසන්නයෙන් පිහිටි වලව්වත්ත රජයේ ඉඩම් තුළ තවත් රාජ්‍ය ආයතන 08 කට වඩා පිහිටා ඇත.

### ඊ. ජල සැපයුම

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පානීය ජලය ලබා ගනු ලබන මුලාශ්‍ර පහත පරිදි වගුව2.9 පරිදි වන අතර , මෙම ප්‍රදේශයේ නිවාස ඒකකයකට හිමි සාමන්‍යය භූමි පරිභෝජනය ප්‍රශස්ත මට්ටමක පැවතීම හේතුවෙන් ජනගහනයෙන් 83% සැලකිය යුතු ප්‍රතිශතයක් ආරක්‍ෂිත ළිං ජලය භාවිත කරයි.

*වගුව2.9 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ භාවිත කරන පානීය ජල මූලාශ්‍ර*

| පානීය ජල මූලාශ්‍රය | නිවාස ඒකක ගණන | ගම්පහ ප්‍රා.ලේ.කො. ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| ආරක්‍ෂිත ළිං | 42,584 | 83% |
| අනාරක්ෂිත ළිං | 616 | 01% |
| ප්‍රධාන නල ජලය | 5471 | 11% |
| ග්‍රාමීය ජල ව්‍යාපෘති | 1803 | 04% |
| නල ළිඳ | 824 | 02% |
| ස්වභාවික ජල මූලාශ්‍ර | 09 | - |
| බෝතල් කළ ජලය | 15 | - |
| වෙනත් | 177 | - |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2019

එසේම, දැනට ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පානීය ජල සැපයුම් ලබා දී ඇති ප්‍රදේශ පහත රූප සටහන 2.24 මඟින් නිරූපනය කර ඇත. ඒ අනුව ගම්පහ ජල සැපයුම් ව්‍යාපෘතියෙන්, ජා ඇළ ජල සැපයුම් ව්‍යාපෘතියෙන් හා යක්කල ජල සැපයුම් ව්‍යාපෘතීන් මඟින් පහත ප්‍රදේශ ආවරණය කරනු ලබයි.

*රූප සටහන 2.24 :සැලසුම් ප්‍රදේශය තුළ පවතින ජල ව්‍යාපෘති මඟින් ආවරණය වන ප්‍රදේශ*




මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, 2019

### ඍ. විදුලිය

විදුලි බල සැපයුම ගැන සලකා බැලීමේදී ගම්පහ ප්‍රදේශය තුළ 98% ක ගෘහ ඒකක ප්‍රමාණයක් ජාතික විදුලි ජාලයෙන් විදුලිය ලබා ගනු ලබයි.

### ඎ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ දිනකට එකතු වන කසළ ප්‍රමාණය පහත වගුව2.10 පරිදි වේ.

*වගු අංක 2.10 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ දිනකට එකතු වන කසළ ප්‍රමාණය*

| ජනගහනය | දිනකට ජනනය වන ඒක පුද්ගල කසළ ප්‍රමාණය (Kg) | දිනකට ජනනය වන මුළු කසළ ප්‍රමාණය (ටොන්) | දිනකට කසළ එකතු කිරීම (ටොන්) |
|---|---|---|---|
| ගම්පහ මහා නගර සභා සීමාව - 70,000 | 0.75 | 52 | 25 – 30 |
| ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව - 157,000 | 0.4 | 63 | 15 – 20 |
| එකතුව | | 115 | 40 |

මූලාශ්‍රය : ගම්පහ මහ නගර සභාව සහ ගම්පහ ප්‍රාදේශීය සභාව,2023

එසේම කසළ බැහැර කිරීම පිළිබඳ සැලකීමේදී දිනකට ගම්පහ මහා නගර සභා බල සීමාව තුළ ජනනය වන කසළ ප්‍රමාණය ටොන් 52 ක් පමණ වන අතර එකතු කරන කසළ ප්‍රමාණය දිනකට ටොන් 25-30 ක් පමණ වේ. එසේම ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දිනකට ජනනය වන කසළ ප්‍රමාණය ටොන් 6 ක් පමණ වන අතර දිනකට එකතු කරන කසළ ප්‍රමාණය ටොන් 15 - 20 ක් පමණ වේ. කසළ එකතු කිරීමේදී ඒවා වෙන් වෙන් වශයෙන් එකතු කරන අතර ගම්පහ මහා නගර සභාව විසින් එකතු කරන කසළ වලින් ප්‍රතිචක්‍රීකරණය කල හැකි නොදිරන කසල අලෙවි කිරීම සිදු කරන අතර නොදිරන අනෙකුත් කසල පුත්තලම් අරුවක්කාලු හොල්සිම් සමාගම වෙත යැවෙන අතර දිරන ඝන අපද්‍රව්‍ය දික්ඕවිට කොම්පෝස්ට් අංගනය වෙත රැගෙන යනු ලබයි.

එසේම ගම්පහ ප්‍රාදේශීය සභාව විසින් කසළ පොළවල් පැවැත්වීම මඟින් ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසල එකතු කොට අලෙවිය සිදු කරනු ලබන අතර අනෙකුත් දිරන නොදිරන කසල කෙරවළපිටිය කසල බලශක්ති (Waste to Energy ) ව්‍යාපෘතිය වෙත ගෙන යනු ලබයි.

ගම්පහ මහා නගර සභාව හා ගම්පහ ප්‍රාදේශීය සභාව තුළ කසල කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණයක් පැවතියද කසල එකතු කොට වෙන් කිරීම සඳහා නිශ්චිත භූමියක් නොමැති වීම හේතුවෙන් දුෂ්කර තාවයන්ට ලක්ව ඇත.

### 2.3.5.3 . ආර්ථික අංශය

ආර්ථික අංශය පිළිබඳව සළකා බැලීමේදී, එය මුලික කොටස් ත්‍රිත්වයක් යටතේ අධ්‍යනය කළ හැකිය. එනම් නිෂ්පාදන කර්මාන්ත ආර්ථිකය, කෘෂි ආර්ථිකය සහ සේවා ආර්ථිකය ලෙසය.

#### අ. නිෂ්පාදන කර්මාන්ත ආර්ථික අංශය

ඒ අනුව කර්මාන්ත ආර්ථිකය පිළිබදව විමසා බැලීමේදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන කර්මාන්ත කලාප හතක් පවතින නමුදු ගම්පහ සැලසුම් බල ප්‍රදේශය තුළ සුවිශේෂී කර්මාන්ත පර්ෂදයක් (Industrial Cluster) දැක ගත නොහැක. නමුත් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාවට අයත් වැලිවේරිය උප නගරයට ආසන්නයේ ඇති බියගම කර්මාන්ත පර්ෂදය සමඟ කර්මාන්ත බිහි වීමේ ප්‍රවණතාවක් වැලිවේරිය ප්‍රදේශය තුළින් පිළිඹිබු වේ. ඒ අතරින් අගය එකතු කරන ලද කෘෂි හා අනෙකුත් නිෂ්පාදන කර්මාන්ත වැදගත් තැනක් ගනී. කෙසේ වෙතත් දළ දේශීය නිෂ්පාදන ආර්ථිකයට සෘජු ලෙස දායක විය හැකි අන්දමේ කර්මාන්ත කලාපයක් දැනට ගම්පහ ප්‍රදේශය පදනම් කරගෙන බිහිවී නොමැති අතර ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාපිත වී ඇති කර්මාන්ත හා ගම්පහ දිස්ත්‍රික්කය හා සැසදීමේදී ස්ථාපිත කර්මාන්ත ප්‍රතිශතය පහත වගුව2.11 මඟින් දක්වා ඇත.

*වගුව2.11 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාපිත වී ඇති කර්මාන්ත*

| කර්මාන්තයේ ස්වභාවය | කර්මාන්ත ගණන | ගම්පහ දිස්ත්‍රික්කය තුල ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| පතල් කැණීම සහ ගල් කැණීම | 12 | 2.% |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 382 | 7.7% |
| රෙදිපිළි, ඇඳීම, ඇඟලුම් සහ සම් | 1037 | 10.4% |
| ලී නිෂ්පාදනය සහ ගෘහ භාණ්ඩ | 423 | 10.2% |
| රසායනික සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන | 99 | 7.4% |
| ලෝහමය සහ ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන | 120 | 3.1% |
| මූලික ලෝහ කර්මාන්තය | 322 | 10% |
| කඩදාසි නිෂ්පාදනය සහ මුද්‍රණය | 117 | 11.4% |
| අනෙකුත් නිෂ්පාදන | 254 | 14% |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2019

## ආ. කෘෂි ආර්ථික අංශය

ජාතික මට්ටමින් නොවූවද, ප්‍රාදේශීය මට්ටමෙන් සළකා බැලීමේදී කෘෂිකර්මාන්තයද ආර්ථිකයේ සැළකිය යුතු දායකත්වයක් සපයයි. මෙය මුළුමනින්ම නාගරීකරණය වූ ප්‍රදේශයක් වුවද තවමත් ඉතිරිව පවත්නා 25% ක් පමණ තෙත්බිම් ආශ්‍රිතව කරගෙන යනු ලබන වී ගොවිතැන හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ වාර්ෂික වී අස්වැන්න සඳහා 14% ක දායකත්වයක් සපයයි. රූප සටහන 2.25 දැක්වෙන පරිදි දොම්පේ සහ මීරිගම ප්‍රදේශය හැරුණු විට ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම වී වගාව වාර්තා වන්නේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි.

*රූප සටහන 2.25 : ගම්පහ දිස්ත්‍රික්කය තුළ වී වගා කරන ලද කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර )*




මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සංඛ්‍යා අත්පොත, 2018

එසේම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨශය තුළ අනෙකුත් භෝග වගාවන් පහත රූප සටහන අංක 2.26 දැක්වෙන පරිදි සීමිත වශයෙන් සිදු කරනු ලබන අතර වාණිජ පරමාර්ථයෙන් මහා පරිමාණ භෝග වගා සිදු කිරීම මෙම සැලසුම් බල ප්‍රදේශය තුළ නිරීක්ෂණය නොවේ.

*රූප සටහන 2.26 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන භෝග වගාවන්*




මූලාශ්‍රය : සැලසුම් අංශය, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2020

එසේම, කෘෂි ආර්ථිකය පිළිබඳ සළකා බැලීමේදී, සැලසුම් බල ප්‍රදේශය තුළ බැලුම්මහර , මුදුන්ගොඩ ප්‍රදේශ ආශ්‍රිතව ඉතා දිගු කලක සිට සිදු කරනු ලබන අන්නාසි වෙළඳාම විශේෂ වේ. ගම්පහ දිස්ත්‍රික්කයම සළකා බැලූ විට හෙක්ටයාර 10,000 අධික භූමි ප්‍රමාණයක මෙම අන්නාසි වගාව සිදු කරනු ලබයි. විශේෂයෙන්ම ගම්පහ සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව අන්නාසි වගාවට වඩා අන්නාසි වෙළඳාම සඳහා වැඩි නැඹුරුතාවයක් පවතින අතර ඉඹුල්ගොඩ, බැලුම්මහර , මුදුන්ගොඩ යන ප්‍රදේශ මූලික කර ගනිමින් මෙම අන්නාසි වෙළදාම පවුල් 2000 කට අධික සංඛ්‍යාවක් විසින් ජීවිකාව ලෙස සිදු කරගෙන යනු ලබයි. දශක පහකට අධික කාලයක් මුළුල්ලේ මෙම වෙළඳාම සිදුකෙරෙන අතර වර්තමානය වන විට මෙම ප්‍රදේශය තුළ අන්නාසි වෙළඳ සැල් 70 කට අධික ප්‍රමාණයක් පවතී. ලංකාවේ එක් ප්‍රධාන සංචාරක කොරිඩෝවක් වන කොළඹ- නුවර මාර්ගය දෙපස මෙම අන්නාසි වෙළඳ කලාපය පිහිටා පැවතීම මෙම වෙළඳාම තවදුරටත් පුළුල් කරමින් නව ක්‍රමවේදයන් ඔස්සේ වැඩි දියුණු කිරීම සඳහා පිටිවහලක් වනු ඇත.

*රූප සටහන 2.27 : බැලුම්මහර, මුදුන්ගොඩ ප්‍රදේශ වල සිදු කරගෙන යනු ලබන අන්නාසි වෙළඳදාම*







මූලාශ්‍රය : සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ , 2023

### ඇ. සේවා ආර්ථික අංශය

සමස්තයක් ලෙස ගම්පහ සැලසුම් බල ප්‍රදේශය සළකා බැලීමේදී, අනෙකුත් ආර්ථික අංශයන් ද්විත්වයට වඩා සේවා ආර්ථික අංශය කැපී පෙනෙයි. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරය ලෙස ආයතනික සේවා සපයනු ලබන ආයතනික සේවා වලින්ද, දුම්රිය හා බස්රථ ඔස්සේ පොදු ගමනාගමන සේවා මඟින්ද, අධ්‍යාපන සේවා මඟින්ද, බැංකු සේවා හා වෙළඳ සේවා මඟින්ද , ගම්පහ මූලික රෝහල මුල් කරගත් සෞඛ්‍ය සේවා මඟින්ද ප්‍රදේශයේ සේවා ආර්ථිකය සමන්විත වේ.

එසේම, පහත සිතියම2.7 දැක්වෙන පරිදි , ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරය ලෙස කොළඹ නගරය ප්‍රධාන වෙළඳ පර්ෂදයක් (Retail Cluster) ලෙස පවතින අතර බස්නාහිර කලාපයේ වෙළඳ හා වාණිජ අකර්ෂිත ස්ථාන (Retail Hotspot) සලකා බලන විට, කොළඹ,නුගේගොඩ , මහරගම , වත්තල, කැලණිය, කඩවත, කිරිබත්ගොඩ යන ප්‍රදේශවල වෙළඳ හා වාණිජ කටයුතුවල සිතියමේ දැක්වෙන පරිදි අවකශීයව ඒකරාශීවීමක් දක්නට ඇති අතර එය වෙළඳ හා වාණිජ සේවාවල විශාල තනි අකර්ෂිත ස්ථානයක් වර්ධනය කරනු ලබයි. නමුත් මීගමුව, ගම්පහ යන නගර සළකා බැලීමේදී, එම නගර, වෙන් වෙන් වශයෙන් තනිව

වෙළඳ හා වාණිජ පර්ෂදයන් ලෙස කොළඹ හර ප්‍රදේශයෙන් බැහැරව වර්ධනය වන ආකාරය දැකිය හැකි වීම නගර සංවර්ධනයෙහි ලා විභවතාවක් ලෙස හඳුනා ගත හැකිය .

*සිතියම2.7 :බස්නාහිර කලාපය තුළ වෙළඳ හා වාණිජ කටයුතු වල අවකාශීය ව්‍යාප්තිය*




සැකසුම: ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, නා.සං.අ

### 2.3.5.4. පාරිසරික අංශය

නිරිතදිග තැනිතලා ප්‍රදේශයේ පහතරට තෙත් කලාපයට අයත් වන්නා වු ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෙක්ටයාර් 9,384 කින් සමන්විත වන අතර බොහෝ ප්‍රදේශ තැනිතලා භූමි ස්වරූපයකින් සමන්විත මනරම් භූමියකට හිමිකම් කියනු ලැබේ. ප්‍රදේශය තුළ තැනින් තැනට වෙනස් වන්නා වු තැන් උසක් හඳුනා ගැනීමට ද හැකි වේ.ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අත්තනගලු ඔය ජල ද්‍රෝණියට අයත් වන අතර මෙම කොට්ඨාසයේ පවතින පාරිසරික තත්ත්වය ප්‍රධාන අංශ 04ක් ඔස්සේ විමසීමට හැකි වේ. එනම්,

1. පාරිසරික සංවේදී ප්‍රදේශ
2. ආපදා තත්ත්වය
3. ක්‍රීඩා පිටි හා උද්‍යාන සහ විවේක විනෝද පහසුකම් පිහිටි ස්ථාන
4. ආගමික, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික ස්ථාන

#### අ. පාරිසරික සංවේදී ප්‍රදේශ

වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 9300 ක් වු ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හෙක්ටයාර් 7100 (75%) ක් පමණ සංවර්ධිත හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය ලෙස සැලකිය හැකි අතර හෙක්ටයාර් 2282 (25%) ක් පමණ වූ භූමි ප්‍රමාණය පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස විශ්ලේෂණාත්මකව දැක්විය හැක. එම පාරිසරික සංවේදී ප්‍රදේශ පහත වගුව2.12 පරිදි වර්ගීකරණය කල හැක.

*වගුව2.12: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ*

| අනු අංකය | භාවිතය | ප්‍රමාණය (හෙක්:) |
|---|---|---|
| 1) | කුඹුරු වගා බිම් | 2018 |
| 2) | අත්හරින ලද කුඹුරු බිම් | 45 |
| 3) | වගුරු බිම් | 108 |
| 4) | ජල දේහයන් | 111 |
| එකතුව | | 2282 |

මූලාශ්‍රය: භූමි පරිහරණ සිතියම, භූ ගෝලීය හා තොරතුරු පද්ධති අංශය , නා.සං.අධි,2019

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු අර්ධයෙන් ගලා බස්නා ස්වාභාවික ජල මාර්ගයක් වශයෙන් අත්තනගලු ඔය වැදගත්ය. බටහිර, නැගෙනහිර, දකුණු අර්ධයෙන් ගලා බස්නා කුඩා ඇල මාර්ග කිහිපයක්ම අත්තනගලු ඔය හා සම්බන්ධ වේ. කොට්ඨාසයේ නැගෙනහිර මායිමෙන් ඌරුවල් ඔය ආරම්භ වී උතුරු සීමාවේදී අත්තනගලු ඔය හා සම්බන්ධ වේ. පහත සිතියම2.8 මඟින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශවල අවකාශීය ව්‍යාප්තිය දක්වා ඇත.

*සිතියම2.8 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිසර සංවේදී ප්‍රදේශ වල අවකාශීය ව්‍යාප්තිය*




මූලාශ්‍රය: පරිසර හා භූ දර්ශන අංශය, නා.සං.අධි, 2020

### ආ. ආපදා තත්ත්වයන්

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රධාන වශයෙන්ම හදුනාගත හැකි ප්‍රධාන ආපදා තත්ත්වය වන්නේ ජල ගැලීම් තත්ත්වයයි.

ප්‍රදේශයේ ජල ගැලීම් ආපදා තත්ත්වයට ප්‍රධාන සාධකය වන්නේ ප්‍රදේශය හරහා ගලා බසින අත්තනගලු ඔය පිටාර ගැලීමත් එමඟින් අත්තනගලු ඔය ද්‍රෝණිය ආශ්‍රිතව පවතින පහත් බිම් ප්‍රදේශ ජලයෙන් යටවීමත්ය. මෙය බොහෝ දුරට මැයි සහ ඔක්තෝබර් මාස වල වර්ෂාපතනයේ උපරිම කාලපරිච්ඡේද දෙක තුළ දැඩි බලපෑමක් එල්ල කරයි.

රූප සටහන 2.28 දැක්වෙන පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාපවහන කාණු සහ ඇළ වේලි සුද්ධ පවිත්‍ර නොකිරීම මෙම තත්ත්වයට දැඩි ලෙස බලපා ඇති අතර ගම්පහ දිස්ත්‍රික්කයේ ජලය බැස යන අත්තනගලු ඔයේ ප්‍රධාන ඇළ වන අලි ඔය, උරුවල් ඔය, යාරු ඇළ, කළු ඇළ, කුණ්ඩිවිල ඇළ මේ අතරින් ප්‍රධාන තැනක් ගනී.

*රූප සටහන 2.28 : කුණ්ඩිවිල ඇළ මාර්ගය කැලෑ බිහිවී ඇති ආකාරය*





මූලාශ්‍රය: ක්ෂේත්‍ර පරීක්ෂණ, සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ , 2022

2004-2021 කාලසීමාව සැලකීමේදී ජල ගැලීම් සිදුවීම් සෑම වසරකම මෙම ප්‍රදේශයෙන් වාර්තා වේ. මෙහිදී වැඩිම පිරිසක් ආපදාවට ලක්වී ඇති ආසන්න වසර ලෙස 2010 වසර දැක්විය හැක. එම වසරේදී 15,200 කට ආසන්න ජනතාවක් මේ හේතුවෙන් පීඩාවට පත්වී ඇත. අවම පුද්ගල හානි සංඛ්‍යාවක් වාර්තා වන්නේ 2015 වර්ෂයේ වන අතර එය පුද්ගලයන් 153 කි. 2004-2018 කාලසීමාව තුළ ජල ගැලීම් හේතුවෙන් සිදුවී ඇති සමස්ථ පුද්ගල හානි සංඛ්‍යාව 45,741 කි. 2004-2018 කාලසීමාව තුල ජලගැලීම් මඟින් සිදුව ඇති සමස්ත පූර්ණ නිවාස හානි සංඛ්‍යාව 45 වන අතර අර්ධ නිවාස හානි සංඛ්‍යාව 208 වැනි ඉතා ඉහළ අගයකි. මෙමඟින් කිරිඳිවිට, අකරවිට, මාකෙවිට උතුර, මහිපාලගොඩ, පහලගම, බැන්ඩියමුල්ල උතුරු, බැන්ඩියමුල්ල බටහිර, බැන්ඩියමුල්ල නැගෙනහිර, අඹන්විට, ඉහළගම නැගෙනහිර, ඉහළගම බටහිර, කරණෑයකමුල්ල, කොස්ඕවිට, මැදගම 02, මැදගම 04, ගෝනගහ 01, ගෝනගහ 02, වැලිකඩ, මොරැන්න, ගම්පහ අළුත්ගම උතුර, රත්මල්විට, අළුත්ගම බෝගමුව උතුර, තිබ්බොටුගොඩ, මාකිලංගමුව, මාබිම යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වැඩි බලපෑමකට ලක්ව තිබේ. ගම්පහ නාගරික බල ප්‍රදේශයේ 2021 වර්ෂයේදී සිදු වූ ජල ගැලීමෙන් ආපදාවට ලක්වූ ප්‍රදේශ ලෙස ගම්පහ - ජා-ඇල මාර්ගය, ගම්පහ මිනුවන්ගොඩ මාර්ගය, කිරිදිවැල -ගණේමුල්ල

මාර්ගය , කිරිදිවිට, අකරවිට, මාකේවිට, ඉහළගම, මැදගම සහ පහළගම ප්‍රදේශ සදහන් කල හැකිය. මේ මඟින් සිදුවූ පුද්ගල හානි සහ නිවාස හානි සංඛ්‍යාව පිලිබඳ වැඩි විස්තර රූප සටහන 2.29 හා 2.30 මඟින් දක්වා ඇති අතර ජල ගැලීම් හේතුවෙන් ආපදාවට ලක්වන ප්‍රදේශ සිතියම2.9 මඟින් දක්වා ඇත.

*රූප සටහන 2.29 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජල ගැලීම් සිදු වූ ග්‍රාම නිලධාරී කොට්ඨාශ හා පුද්ගල සංඛ්‍යාව*




මූලාශ්‍රය :- ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - 2021

*රූප සටහන 2.30 : ගම්පහ ප්‍රදේශය තුළ සිදුවන ගංවතුර තත්ත්වය*



මූලාශ්‍රය : ගම්පහ - ජා ඇළ මාර්ගය , අන්තර්ජාලය ඇසුරින් , 2023 නොවැම්බර්

*සිතියම 2.9 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ගංවතුර ආපදාවට ලක්වන ප්‍රදේශ*




මූලාශ්‍රය: පරිසර හා භූ දර්ශන අංශය, නා.සං.අධි , 2021

එසේම පහත රූප සටහන 2.31 දැක්වෙන අධ්‍යනය මඟින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ ගංවතුර ආපදා අවධානම වර්ෂාපතනය හා ගංවතුර මට්ටම සැලකිල්ලට ගෙන වර්ගීකරණය කර ඇත.

*රූප සටහන 2.31 : ගංවතුර අවධානම් වර්ගීකරණය*




| Risk level | Water level (m) | Rainfall (mm) |
|---|---|---|
| Normal level | < 4.4 | <100 |
| Minor level | 4.4-5.5 | 100-120 |
| Major level | > 5.5 | 120< |

මූලාශ්‍රය : *GIS based Approach for Planning the Evacuation Process During Flash Floods: Case Study for Gampaha Divisional Secretariat Division, Sri Lanka* , Edirisinghe, E. A. K. R. a, Pussella, P. G. R. N. I. *a,b , Vidarshana, W. D. M b

### ඇ. ක්‍රීඩා පිටි, උද්‍යාන සහ විවේක විනෝද පහසුකම් පිහිටි ස්ථාන

ඍජු හා වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. ඍජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය. එනම්, ක්‍රීඩාකිරීම, පිහිනීම, දිවීම, ඇවිදීම, බෝට්ටු පැදීම, සම්ප්‍රදායික මසුන් ඇල්ලීම නිදසුන් ලෙස දැක්විය හැක. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉහත අවශ්‍යතාවන්ගෙන් කිහිපයක් සපුරා ගත හැකි අතර, එම ස්ථානයන්ගේ අවකාශීය ව්‍යාප්තිය සිතියම2.10 මඟින් හා එම ස්ථාන පිළිබඳව විස්තර වගුව2.13 මඟින් සහ දක්වා ඇත.

*සිතියම2.10: ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටි , එළිමහන් විනෝද උද්‍යාන පවතින ස්ථාන වල අවකාශීය සිතියම*




මූලාශ්‍රය: පරිසර හා භූ දර්ශන අංශය, නා.සං.අධි , 2021

*වගුව2.13 : ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෘජු විනෝද පහසුකම් සපුරා ගත හැකි ස්ථාන*

| අනු අංකය | උද්‍යාන වර්ගය | සංඛ්‍යාව | ප්‍රමාණය(හෙක්:) |
|---|---|---|---|
| 01. | පවතින ඉතා කුඩා උද්‍යාන (EPP) | 13 | 1.05 |
| 02. | පවතින කුඩා උද්‍යාන (EMP) | 12 | 6.50 |
| 03. | පවතින අසල උද්‍යාන (ELP) | 01 | 1.07 |
| 04. | පවතින ප්‍රජා උද්‍යාන (ECP) | 01 | 3.20 |
| 05. | රේඛීය උද්‍යාන (ELiP) | 01 | 0.41 |
| | එකතුව | | 12.23 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (නා.සං.අ.) - 2019

ඒ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැනට හෙක්ටයාර් 12.23 ක් පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා විවෘත භූමි ලෙස පවතින අතර වර්තමාන ජනගහනය සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් ලෙස ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි පහසුකම් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නොමැති අතර දැනට පවතින ස්ථානවලද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින සෘජු හා වක්‍ර විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන පිළිබඳ විස්තරාත්මක විස්තරය ඇමුණුම 14 මඟින් දක්වා ඇත.

# 03



## පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

# පරිච්ඡේදය 03
# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

## 3.1 හැඳින්වීම

මූලික අධ්‍යනයන්ගෙන් පසුව නගර සැලසුම්කරණයේදී සලකා බැලිය යුතු වැදගත්ම සාධකය වනුයේ සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවයයි. නගර සැලසුමේ දිශානතිය මෙහෙයවීමේ තීරණාත්මක සාධකය වන්නේ එයයි. එනම්, මේ යටතේ, තෝරාගන්නා ලද අධ්‍යයන ප්‍රදේශයට සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය විවිධ මං ඔස්සේ විමසා බලනු ලබයි. එහිදී, අධ්‍යයන ප්‍රදේශය තුළ දක්නට ලැබෙන ගැටළු හා විභවතා මැනවින් හඳුනාගැනීම සිදුකරන අතර, එමගින් සංවර්ධන සැලැස්මේ ඉදිරි දැක්ම, ඉලක්ක සහ අභිමතාර්ථ ඇතුළත් සංවර්ධන සැලසුම් රාමුව සැකසීම සඳහා අවශ්‍යය මූලික අඩිතාලම සපයනු ලබයි.

ඒ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මූලික කරුණු 03ක් යටතේ ගැනෙන අතර එම මූලික කරුණු 03 යටතේ ප්‍රදේශය තුළ පවතින ගැටළු සහ විභවතා විශ්ලේෂණය කොට ඇත.

1. පවතින නගර සංවර්ධන සැලැස්ම (2006-2026) ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට පමණක් සීමා වී පැවතීම සහ ප්‍රදේශයේ සංවර්ධන පීඩනය අනුව යාවත්කාලීන නොවීම හා ඒ ආශ්‍රිතව පැන නැගී ඇති නාගරික ගැටළු.

2. ගම්පහ ප්‍රදේශය තුළ විභවතාවන් රැසක් පැවතියද ඒවා නිසි සංවර්ධන දිශානතියකට යොමු නොවීම හේතුවෙන් අඩපණ වූ නගරයක් බවට පත්ව පැවතීම.

3. අනාගතයේදී සුසමාදර්ශී වෙනසකට තුඩු දෙන ගම්පහ නගරය පිළිබඳ දැනට පවතින ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රමුඛතා.

## 3.2 හඳුනාගත් ගැටළු

### 3.2.1 පවතින සංවර්ධන සැලැස්ම සංවර්ධන පීඩනය හා යාවත්කාලීන නොවීම

2009 වර්ෂයේ ජනවාරි 23 වන සිකුරාදා දින අංක 1585/27 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම හා සැලසුම් රෙගුලාසි (2006-2026) බලාත්මක කරන ලදී. ඒ අනුව තෙත් බිම් හා ජල මාර්ග හැරුණු කොට ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය, කලාපීකරණ සැලැස්ම තුළ ප්‍රධාන කලාප හයකට වෙන් කරන ලදී.පිළිවලින් එම කලාප වනුයේ ප්‍රාථමික නේවාසික කලාපය, මිශ්‍ර නේවාසික කලාපය, මිශ්‍ර සංවර්ධන කලාපය, පරිපාලන හා ආයතනික කලාපය, වාණිජ කලාපය හා අධ්‍යාපන කලාපයයි. එය පහත රූප සටහන 3.1 මඟින් දැක්වේ.

*රූප සටහන 3.1 : කලාපීකරණ සැලැස්ම - ගම්පහ සංවර්ධන සැලැස්ම (2006-2026)*




මූලාශ්‍රය : ගම්පහ සංවර්ධන සැලැස්ම (2006-2026 ), නාගරික සංවර්ධන අධිකාරිය, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය.

නමුත් වර්තමාන භූමි පරිභෝජනය සලකා බැලීමේදී ගම්පහ මහා නගර සභා සීමාව තුළ පවතින ප්‍රාථමික නේවාසික කලාප ප්‍රධාන මාර්ග ජාල මූලික කොට ගෙන සීඝ්‍ර වශයෙන් වාණිජ භාවිතයන් බවට පත්ව ඇත. පහත රූප සටහන 3.2 මඟින් දැක්වෙන්නේ ගම්පහ - යක්කල මාර්ගය ඉදිරිපිට ප්‍රාථමික නේවාසික කලාපයට අයත් ප්‍රදේශයක් වාණිජ භාවිතයන්ට පත් වී ඇති ආකාරයයි.

***රූප සටහන 3.2 : ගම්පහ පවතින කලාපීකරණ සැලැස්ම හා භාවිතයන් මල සිදු වී ඇති වෙනස්කම්***




මූලාශ්‍රය : ගූගල් සිතියම් 2007 හා 2021

මූලාශ්‍රය : ගම්පහ - යක්කල පාර , ගූගල් සිතියම්, 2022

අනෙක් අතට පවතින නගර සංවර්ධන සැලැස්ම ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට පමණක් සීමා වුවද, සීඝ්‍රයෙන් සිදු වෙමින් යන නාගරීකරණය විධිමත් කිරීම සඳහා මුළු ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටම බල පැවැත්වෙන පරිදි ගම්පහ සංවර්ධන

සැලැස්ම සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ. එමෙන්ම, 2001.02.30 වන දින අංක 1172/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට පත් කිරීමෙන් පසුව 2016.09.09 වන දින අංක 1983/30 වන ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් මුළු ගම්පහ දිස්ත්‍රික්කයම නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් වූ අතර විධිමත් නාගරික සැලසුම්කරණයක් සඳහා අවශ්‍ය වන නෛතිකභාවය ඒ සමඟ හිමි විය.

එමෙන්ම, දැනට පවතින නගර සංවර්ධන සැලැස්ම පහත රූප සටහන 3.3 හි දැක්වෙන පරිදි නගර මධ්‍ය කේන්ද්‍ර කොට ගනිමින් ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර ඉන් ඔබ්බටගිය නේවාසික, කර්මාන්ත, කෘෂිකාර්මික, වාණිජ, පාරිසරික ලෙස වඩා පුළුල් පරාසයක් තුළ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ව්‍යාපෘති හඳුනා ගැනීම මෙම නව සංවර්ධන සැලසුමේ ප්‍රධානතම අවශ්‍යතාවයක් ලෙස පෙන්වා දිය හැකිය.

*රූප සටහන 3.3 : ගම්පහ නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් හඳුනා ගත් ව්‍යාපෘති*




මූලාශ්‍රය : ගම්පහ සංවර්ධන සැලැස්ම (2006-2026 ), නාගරික සංවර්ධන අධිකාරිය, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය.

එසේම, මුළු ගම්පහ ප්‍රදේශයම ආවරණය වන පරිදි සංවර්ධන සැලැස්මක් නොමැති වීමෙන් ප්‍රදේශය තුළ උද්ගත වී ඇති මූලික අනු ගැටළු කිහිපයක් පහත පරිදි පෙන්වා දිය හැකිය.

i. ප්‍රධාන පරිපාලන අගනගරයක ස්වරූපය ගම්පහ නගරය තුළින් දිස් නොවීම.

ගම්පහ නගරය යනු ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරයයි. ගම්පහ දිස්ත්‍රික්කය යනු මිලියන 2 කට අධික ජනගහනයක් ජීවත් වන දිස්ත්‍රික්කයකි. එනම් කොළඹ දිස්ත්‍රික්කයට පසුව ඒ හා සමාන ජනගහනයකින් යුක්ත දිස්ත්‍රික්කය වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයයි. එය ලංකාවේ මුළු ජනගහනයෙන් 11% ක ප්‍රතිශතයකි. එවැනි පසුබිමක් තුළ ගම්පහ පරිපාලන අගනගරයට විවිධ සේවා හා අවශ්‍යතා සඳහා දිනකට ඇදී එන ජනගහනය ලක්ෂ දෙක ඉක්මවා යයි. නමුත් නගරය තුළ දක්නට ඇති අවිධිමත් නාගරීකරණය නිදසුන් ලෙස, අවිධිමත් ලෙස ගොඩනැගී ඇති නාගරික අවකාශ, කාණු පද්ධති, පදික වේදිකාවන්හි වෙළදාම් කටයුතු කිරීම, නගරයේ සෑම තැනකම නගර අලංකරණයට හානි වන පරිදි පෝස්ටර් හා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම, පවතින භූ දර්ශන ප්‍රදේශ නිසියාකාරව නඩත්තු නොකිරීම ඇතුළු හේතු ගණනාවක් නිසා ගම්පහ පරිපාලන අගනගරය තුළ අගනගරයක තිබිය යුතු විධිමත් හා ආකර්ශනීය බව දක්නට නොමැත. එය පහත රූප සටහන 3.4 මඟින් දක්වා ඇත.

*රූප සටහන 3.4 : අගනගරීය ලාක්ෂණිකයන් නැති වීමට හේතු වී තිබෙන ඌන නාගරික අවකාශයන්*

විධිමත් ලෙස භාවිත නොකරන ලද අවකාශයන්



පදික වේදිකා වල වෙළදාම් සිදු කිරීම



නගර අලංකරණයට බාධා වන පරිදි නගරය පුරා සවිකර ඇති දැන්වීම් පුවරු




වැසි ජල කාණු පද්ධති සහ පදික වේදිකාවල පවතින දුර්වල තත්ත්වය










පවතින නගර භූ දර්ශන ප්‍රදේශ විධිමත් ආකාරයට නඩත්තු නොකිරීම



ප්‍රධාන මංසන්ධිවල පවතින යල් පැන ගිය වටරවුම් ව්‍යුහයන්



පදිකයන්ට බාධාවන ලෙස පවතින භෞතික සාධක සහ ක්‍රමවත් නොවූ දැන්වීම් පුවරු මඟින් සිදුවන දෘශ්‍ය දූෂණය (Visual Pollution)




නගර ආශ්‍රිතව පවතින දුම්රිය සංරක්ෂණ කලාප නිසි පරිදි නඩත්තු නොවීම



මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ , 2022

ii. නගරය තුළ මහජනතාවට සිදුවන අපහසුතා හා නගරයේ වාණිජ වටිනාකමට සිදුව ඇති හානිය.

පෙර සඳහන් කළ පරිදි ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරය ලෙස ගම්පහ නගරයට හිමිවන්නේ සුවිශේෂී වැදගත්කමකි.පරිපාලන සේවා හා අනෙකුත් සේවා, ප්‍රවාහන, අධ්‍යාපනික කටයුතු සඳහා නගරයට ඇදී එන ජනතාව නගරයේ පවතින අවිධිමත් ස්වරූපය නිසා දැඩි අපහසුතාවලට පත් වෙයි. එයින් ප්‍රධානතම කරුණක් වන්නේ මහා මාර්ග වල පවතින තදබදය හා පදිකයන්ගේ ගමනාගමනයට සිදුවන බාධාවන්ය. ගම්පහ නගරයට ප්‍රධාන වශයෙන් මාර්ග ජාල 7 ක් ඔස්සේ පිවිසිය හැකිය. එම මාර්ග ජාල පහත රූප සටහන 3.5 දැක්වෙන පරිදි වේ.

*රූප සටහන 3.5 : ගම්පහ නගරයට ඇතුළුවන ප්‍රධාන මාර්ග ජාල*




මූලාශ්‍රය : ගූගල් සිතියම්

ඒ අනුව දිනකට ගම්පහ නගරයට පැමිණෙන සහ පිටවන මුළු වාහන ප්‍රමාණය ආසන්න වශයෙන් 103, 000 ඉක්මවා යයි. පහත වගුව 3.1 එය සවිස්තරව දක්වා ඇත.

*වගුව3.1 : ගම්පහ නගරය තුළට දිනකට පැමිණෙන සහ පිටවන වාහන ගණන*

| මහා මාර්ග ජාලය | ඇතුළුවීම | පිට වීම | මුළු වාහන ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මිනුවන්ගොඩ - ගම්පහ පරණ පාර | 2580 | 1956 | 4536 |
| 2. මිනුවන්ගොඩ - ගම්පහ නව පාර | 8200 | 8936 | 17136 |
| 3. ජා -ඇල ගම්පහ පාර | 6992 | 6248 | 13240 |
| 4. යක්කල - ගම්පහ පාර | 8152 | 7580 | 15732 |
| 5. ගම්පහ - මිරිස්වත්ත පාර | 8156 | 8932 | 17088 |
| 6. නුවර පාර ( ගම්පහ හරහා යන) | 14168 | 11368 | 25536 |
| 7. ගම්පහ - ඔරුතොට පාර | 5516 | 4564 | 10080 |
| මුළු වාහන සංඛ්‍යාව | 53764 | 49584 | 103,348 |

මූලාශ්‍රය : රථ වාහන සමීක්ෂණය 2020 ජුනි මස, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අධි

විශේෂයෙන්ම පහත රූප සටහන 3.6 දැක්වෙන පරිදි උදෑසන 7.00 -9.00 ත් අතර නගරයට රථවාහන විශාල වශයෙන් ඇතුළු වන අතර සවස 4.00-5.00 ත් අතර කාලය තුළ වැනි රථවාහන ප්‍රමාණයක් නගරයෙන් පිටව යයි. එසේම නගරයට පැමිණෙන වාහන සංයුතිය පිලිබදව සැලකීමේදී රූප සටහන 3.7 හි දැක්වෙන පරිදි 35% මෝටර් බයිසිකල්ද, 27% මෝටර් රථද, 18% ක් ත්‍රිරෝද රථද වන අතර මෙලෙස දවසේ කාර්යබහුල කාල පරාසය තුළ (Peak Hours) වැඩි වශයෙන් පැමිණේ.

*රූප සටහන 3.6 :ගම්පහ නගරයට දෛනිකව ඇතුළුවන හා පිටවන වාහන සංඛ්‍යාව කාලපරාස සමග විශ්ලේෂණය කිරීම*




| | 6.00 a.m - 7.00 a.m | 7.00 a.m - 8.00 a.m | 8.00 a.m - 9.00 a.m | 12.00 p.m - 1.00 p.m | 1.00 p.m - 2.00 p.m | 4.00 p.m - 5.00 p.m | 5.00 p.m - 6.00 p.m |
|---|---|---|---|---|---|---|---|
| In Flow | 8428 | 9584 | 9352 | 5772 | 6180 | 7488 | 6260 |
| Out Flow | 6136 | 8188 | 7648 | 6484 | 6644 | 7764 | 6720 |

මූලාශ්‍රය : රථ වාහන සමීක්ෂණය 2020 ජුනි මස, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අධි

*රූප සටහන 3.7 : ගම්පහ නගරයට පැමිණෙන රථවාහන වල සංයුතිය*




මූලාශ්‍රය : රථ වාහන සමීක්ෂණය 2020 ජුනි මස, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අධි

මෙලෙස සැලකිය යුතු රථවාහන ධාරිතාවන් පවතින මාර්ග ජාලයන්හි හා නගර මධ්‍යන්හි මාර්ග දෙපස රථ වාහන නවතා තැබීම නගරය තුළ දක්නට ලැබෙන විශාල ගැටළුවකි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ බොහොමයක් වෙළඳ සැල් සඳහා ප්‍රමාණවත් රථ වාහන ගාල් නොමැති වීමත් ධාරිතාවට ප්‍රමාණවත් තරම් පොදු රථ ගාල් නගරය තුළ නොමැති වීමත්ය. නගරය තුළ දැනට ඇත්තේ එක් පොදු රථ ගාලක් පමණක් වන අතර එහි ගාල් කළ හැකි උපරිම රථ වාහන සංඛ්‍යාව 50කි. එය කිසිසේත්ම පවතින ඉල්ලුමට ප්‍රමාණවත් නොවේ. එය පහත දක්වා ඇති රූප සටහන 3.8 හා සහ රූප සටහන 3.9 මඟින් දක්වා ඇත.

*රූප සටහන 3.8 : ගම්පහ නගර මධ්‍යය තුළ දවස පුරා පවතින වාහන නැවතුම් ඉල්ලුම*







මූලාශ්‍රය : Site Planning Project, University of Moratuwa, Department of town & country planning/23th July 2019

*රූප සටහන 3.9 : ගම්පහ නගරය තුළ පැය 3-4 පමණ දක්වා පවතින රථවාහන නැවතුම් ඉල්ලුම*






ඒ අනුව නගරයේ පවතින මෙම අවිධිමත් රථවාහන නැවතීමේ ස්වභාවය ගම්පහ නගර මධ්‍යය තුළ පිහිටි ප්‍රධාන මාර්ගයක් වන බෞධාලෝක මාවත අධ්‍යනය මඟින් ඇමුණුම අංක 05 ඔස්සේ දක්වා ඇත.

එමෙන්ම පදික වේදිකා විධිමත් ලෙස සකස් නොකිරීමත්, පදික වේදිකා මත සිදු කරන ලද වෙළඳාම්, සේවා කලාපයෙන් බැහැරව පදික වේදිකා මත ඉදිකර ඇති විදුලි හා දුරකථන රැහැන් මගින්ට නගරය තුළ සුවපහසුවෙන් ගමන් කිරීමට බාධා පමුණුවා ඇත.

එසේම දැඩි වාණිජමය වටිනාකමක් ඇති නගර මධ්‍යය තුළ පවතින ගරා වැටුණු, පරණ ගොඩනැගිලි නගරයෙහි වාණිජ වටිනාකම අවම කොට ඇත. රූප සටහන අංක 3.10 හි දැක්වෙන පදිරි නගර මධ්‍ය තුළ පවතින ඌන භාවිත, ගරා වැටුණු ගොඩනැගිලි නිසා නගර මධ්‍ය තුළට වැඩි වාණිජ හා මහජන ආකර්ෂණයක් ඇති ආයෝජනයන් ගෙන්වා ගැනීමට අපොහොසත් වී ඇත.

රූප සටහන 3.10 : ගම්පහ නගර මධ්‍යය තුළ පවතින තත්ත්වය



Activate Windows
Go to Settings to activate Windows.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2022

### iii. ප්‍රමාණවත් පොදු එළිමහන් අවකාශයන් නොමැති වීම.

215000 පමණ ජනගහනයෙන් ජීවත් වන ගම්පහ ප්‍රදේශය තුළ නේවාසික භාවිතය සඳහා වැඩි ඉල්ලුමක් පවතී. භූමි පරිභෝජනය සලකා බැලීමේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුළු භූමි ප්‍රමාණයෙන් 47% පමණ නේවාසික භාවිතයන් වේ. නේවාසික ජනගහනය හා සමාන ක්‍රියාකාරී ජනගහනයක්ද පවතින ගම්පහ ප්‍රදේශය තුළ පොදු භූමි ප්‍රමාණය හෙක්ටයාර 14ක් වන අතර දැනට සිටින ජනගහනය අනුව එම ප්‍රමාණය හෙක්ටයාර 220ක් පමණ විය යුතුය. නමුත් පොදු එළිමහන් අවකාශ වල විශාල රික්තකයන් මේ අනුව පෙනී යයි.

### iv. වාර්ෂිකව ඇති වන ගංවතුර තත්ත්වය

තෙත් කලාපීය වෙරළබඩ තැනිතලා ප්‍රදේශයකට අයත් ගම්පහ ප්‍රධාන වශයෙන් අධික වැසි සමයන්හි අත්තනගලු ඔය පිටාර ගැලීම නිසා වාර්ෂිකව ගංවතුර තත්ත්වයකට මුහුණ පායි. ගංවතුර බලපෑමට හසුවන ප්‍රදේශ හා මහා මාර්ග ලෙස ගම්පහ -ජා ඇල මාර්ගය, ගම්පහ - මිනුවන්ගොඩ මාර්ගය, කිරිදිවැල - ගනේමුල්ල මාර්ගය හා කිරිදිවිට, අකරවිට, මාකෙවිට, ඉහළගම, මැදගම, පහළ ගම යන ග්‍රාම නිලධාරී වසම් පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම 2016 වසර තුළ පුද්ගලයන් 4857ත් 2018 වර්ෂය තුළ පුද්ගලයන් 5035ත් ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත්ව ඇති අතර 2021 වර්ෂය තුළ පෙර වර්ෂයකට වඩා ගංවතුර මට්ටමෙහි ඉහළ යාමක් සහ අවතැන් ප්‍රදේශ වැඩි වීමත් දක්නට ලැබෙයි.

### v. ගම්පහ ප්‍රදේශයට අයත් ප්‍රධාන මංසන්ධීන් තුළ සිදුවන අවිධිමත් නාගරීකරණය

ගම්පහ ප්‍රධාන නගර මධ්‍ය හැරුණු කොට ගෙන සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන ප්‍රධාන මංසන්ධීන් ( Main Nodes) කිහිපයක් දක්නට ලැබේ. ඒවා නම් යක්කල, මිරිස්වත්ත, වැලිවේරිය හා ගනේමුල්ලයි. මෙයින් යක්කල හා මිරිස්වත්ත පහත රූප සටහන් අංක 3.11 දක්වා ඇති පරිදි එකිනෙකට ඉතා සම්බන්ධව පිහිටා ඇති අතර අනෙකුත් මංසන්ධීන් වන අතර විශේෂයෙන්ම ගම්පහ ප්‍රධාන නගරයෙන් වෙන් ව ස්වාධීන මධ්‍යයයන් දෙකක් ලෙස සේවා ලබා ගන්නා සැලකිය යුතු ජනගහනයක් සිටියද රට සරිලන සේවා සහ පහසුකම් මෙම මධ්‍යයයන් දෙක තුළ දක්නට නොලැබීමද මෙහි ලා ගත යුතු ප්‍රධාන ගැටළුවකි. නිදසුන් ලෙස සැලකිය යතු මහී ජනතාවන් භාවිතා කරන ගනේමුල්ල මංසන්ධිය සඳහා විධිමත් බස් නැවතුම් පොළක්, රථ වාහන ගාල් නොමැතිකමත් වැලිවේරිය මංසන්ධිය අවිධිමත් ලෙස ගරා වැටුණු මංසන්ධියක ස්වරූපය ගැනීමත් පෙන්වා දිය හැක.

*රූප සටහන 3.11 :ගම්පහ සැලසුම් බල ප්‍රදේශය තුළ ගනේමුල්ල සහ වැලිවේරිය උප නගර වල ක්‍රියාකාරිත්වය අවකාශීය වශයෙන්*




සැකසුම: ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, නා .සං.අධි, 2022

*රූප සටහන 3.12 ගනේමුල්ල බස්රථ නැවතුම් ප්‍රදේශය*



*රූප සටහන 3.13 වැලිවේරිය මංසන්ධිය තුළ දක්නට ඇති ඌන සංවර්ධනය*



## 3.3 හඳුනාගත් විභවතා

### 3.3.1 ජාතික ප්‍රතිපත්ති, ජාතික සැලසුම් , ජාතික ව්‍යාපෘති තුළින් ගම්පහ ප්‍රදේශයට හිමිවන සාධනීය බලපෑම

#### i. ජාතික ප්‍රතිපත්ති හා සැලසුම්

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය මූලික වශයෙන් මෙරට භෞතික සංවර්ධනය මෙන්ම රටේ භෞතික සැලසුම් ක්‍රියාවලීන් අරමුණු කොටගෙන සකස් කර ඇති අතර භූමියේ සිදුකරන වෙනස්කම් , ජනාවාස ප්‍රතිස්ථාපනය කිරීම හා ව්‍යාප්ත කිරීම, මානව ක්‍රියාකාරකම් ස්ථානගත කිරීම හා පුනස්ථාපනය කිරීම , භෞතික යටිතල පහසුකම් ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීම හා භූමිය පාදක කොටගත් උරුමයන් හෝ සම්පත් සංරක්ෂණය කිරීම හා නගා සිටුවීම වැනි දෑ භෞතික සංවර්ධනයට අයත් වේ.

ජාතික භෞතික සැලැස්ම යනු ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියෙන් ව්‍යුත්පන්න වූ සමස්ත ජාතික මට්ටමේ මාර්ගෝපදේශක රාමුවක් වන අතර, එමඟින් ජාතික මට්ටමින් ඉඩම් පරිහරණ කලාප පුළුල් ලෙස වර්ගීකරණය කිරීම, අවශ්‍යතාවය අනුව කලාපීය හෝ ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම සහ හඳුනාගත් භෞතික සංවර්ධන කටයුතු සඳහා භූමිය ප්‍රමාණයෙන් පෙන්නුම් කිරීම මෙන්ම මෙම භෞතික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා අදාල ක්‍රමවේදයන් කලාපීය, ප්‍රාදේශීය හා ව්‍යාපෘති පාදක කරගත් සැලසුම් මඟින්ස්ථාපිත කිරීම සිදු කරනු ලබයි.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ නාගරික සහ ග්‍රාමීය සීමා බිඳ දමමින් දිවයින පුරා එක හා සමානව සේවා හා යටිතල පහසුකම් සැපයීමෙන් ජාතික අවකාශීය ක්‍රමයේ නව ප්‍රවේශයන් ඇති කිරීම අපේක්ෂා කරයි. මෙම සන්දර්භය තුළ ලංකාවේ ප්‍රධාන වරායන් හා ප්‍රධාන ගුවන් තොටුපල දෙක සම්බන්ධ කරමින් සහ සියලු වාණිජ කලාප ඒකාබද්ධ කරමින් බහු මාන වාණිජ නගර හඳුන්වා දී ඇත. මෙම බහුමාන වාණිජ වාණිජ නගර කොළඹ, යාපනය, ත්‍රිකුණාමලය, හම්බන්තොට යන නගර පදනම් කොටගෙන කොළඹ වරාය සහ කටුනායක ගුවන්තොටුපල, හම්බන්තොට වරාය සහ මත්තල ගුවන්තොටුපල, හම්බන්තොට වරාය සහ මත්තල ගුවන්තොටුපල, කන්කසන්තුරේ වරාය සහ මත්තල ඒකාබද්ධ කරමින් සංවර්ධනය කෙරේ. මේවා ජාතික අවකාශීය පද්ධතිය සැදීම සඳහා මූලික වන අතර මෙම සිව් මාන නගර පදනම් කරගෙන ප්‍රධාන වාණිජ නගර ලෙස කොළඹ, හම්බන්තොට, යාපනය, ත්‍රිකුණාමලය සංවර්ධනය වේ. මෙම බහුමාන වාණිජ නගර වරාය හා ගුවන්තොටුපල වලින් සමන්විත වන බැවින් ඒවා ජාතික හා ජාත්‍යන්තර ජාලයේ සම්බන්ධක මධ්‍යස්ථාන බවට පත් වෙයි.

ඒ හැරුණු විට දැනටමත් බහුමාන වාණිජ නගර ලෙස හඳුනාගෙන ඇති නගර හැර සෙසු දිස්ත්‍රික්ක 21 හි අගනගර ජාතික නගර වේ. ඒ අනුව ගම්පහ නගරය රටේ ජාතික නගරයක් ලෙස සංවර්ධනය කෙරෙන අතර අනාගතයේදී ඒකාබද්ධ ජාතික අවකාශීය පද්ධතියට සුදුසු නගරයක් බිහි කිරීම සඳහා ගම්පහ නගරයට අවශ්‍ය සැලසුම් සහගත මැදිහත් වීම ලබා දීම වැදගත් වේ.

*රූප සටහන 3.14 බහුමාන වාණිජ නගර සමඟ ජාතික නගරයක් ලෙස ගම්පහ නගරයේ අවකාශීය පිහිටීම*




සැකසුම: ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, නා.සං .අධි.

මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම - 2048 , වාර්තාව

## ii. ජාතික ව්‍යාපෘති

දැනට ක්‍රියාත්මක මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය රටේ ප්‍රමුඛතා ව්‍යාපෘතියක් වන අතර එය ගම්පහ නගර සීමාව තුළ දක්ෂිණ අන්තර් හුවමාරුව සහ උතුරු අන්තර් හුවමාරුව නමින් අන්තර් හුවමාරු දෙකක් ස්ථාපිත කිරීමට නියමිතය. උතුරු අන්තර් හුවමාරුව ගම්පහ- ජා ඇල මාර්ගය ඔස්සේ දකුණු අන්තර් හුවමාරුව ගම්පහ - යක්කල මාර්ගය ඔස්සේද ස්ථාපිත කෙරේ. මෙම ව්‍යාපෘතිය තුළින් ඉඩමයේ වටිනාකම මෙන්ම ප්‍රදේශයේ නේවාසික ඉල්ලුමද ඉහළ යනු ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමෙන් අනතුරුව වසරක් පාසා අන්තර් හුවමාරු අතර සිදුවන වාහන ධාරිතාව පුරෝකථන කර ඇති අතර, ඒ අනුව කඩවත - ගම්පහ අන්තර් හුවමාරුව අතර ඉහළම වාහන ධාරිතාවය වාර්තාවන අතර එය 2021 දී දිනකට වාහන 12,449 ත් ලෙස ද 2026 සිට 2036 වසර සඳහා පිළිවෙළින් වාහන 21,629

සිට 53,529 ක් දක්වා ඉහළ යන බව දක්වා ඇත. එමෙන්ම ගම්පහ -වේයන්ගොඩ අන්තර් හුවමාරු අතර 2021 දී දිනකට වාහන 6817 සිට 2026 සහ 2036 වසර වන විට පිළිවෙළින් දිනකට වාහන 9617 සිට 23,212 දක්වා ඉහළ යන බව සඳහන් වේ.

*රූප සටහන 3.15 : ඉදිකෙරෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගය හා එම මාර්ගය ඔස්සේ අපේක්ෂිත අන්තර් හුවමාරු අතර දිනකට අපේක්ෂිත වාහන සංඛ්‍යාව*




| Interchange | Interchange | 2021 | 2026 | 2036 |
|---|---|---|---|---|
| Kadawatha | Gampaha | 12,449 | 21,629 | 53,529 |
| Gampaha | Veyangoda | 6,817 | 9,617 | 23,212 |
| Veyangoda | Mirigama S | 6,053 | 8,624 | 23,331 |
| Mirigama S | Mirigama N | 5,312 | 7,608 | 22,883 |
| Mirigama N | Nakulugamuwa | 7,003 | 10,230 | 28,952 |
| Nakulugamuwa | Pothuhara | 6,989 | 10,306 | 25,669 |
| Pothuhara | Dambokka | 4,569 | 6,671 | 18,110 |
| Dambokka | Kurunegala | 4,941 | 7,172 | 18,540 |
| Kurunegala | Rideegama | 5,399 | 7,535 | 17,766 |
| Rideegama | Melsiripura | 5,769 | 8,222 | 18,580 |
| Melsiripura | Galewela | 4,806 | 7,035 | 16,596 |
| Galewela | Dambulla (A-9) IC | 3,889 | 5,732 | 14,036 |
| Dambulla (A-9) IC | Dambulla | 2,415 | 3,626 | 9,680 |
| Mirigama N | Ambepussa | 5,661 | 7,051 | 11,911 |
| Pothuhara | Polgahawela | 2,420 | 3,435 | 7,558 |
| Polgahawela | Rambukkana | 3,627 | 5,145 | 10,786 |
| Rambukkana | Galagedara | 3,621 | 5,182 | 10,907 |

මූලාශ්‍රය: EIA Report of CKE by RDA

යෝජිත විදුලි දුම්රිය ව්‍යාපෘතිය තවත් ප්‍රධාන ජාතික තලයේ ව්‍යාපෘතියක් වන අතර එය ඉදිරියේදී ගම්පහ නගරයට විශාල සාධනීය බලපෑමක් එල්ල කරනු ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන වශයෙන් අංශ 08ක් සංවර්ධනය කිරීමට යෝජිත අතර ගම්පහ දුම්රිය ස්ථානය රාගම - වේයන්ගොඩ යටතේ පවතී. දැනට පවතින දුම්රිය මාර්ග 2ක දුම්රිය මාර්ග3ක් කිරීමටත් පැයට කි.මී.100ක වේගයකින් ධාවනය කිරීමටත් අපේක්ෂා කෙරේ. මෙම විදුලි දුම්රිය ව්‍යාපෘතියේ ප්‍රධාන දුම්රිය ස්ථානයක් ලෙස ගම්පහ දුම්රිය ස්ථානය හඳුනාගෙන ඇති අතර වර්තමානයේ පවා දිනකට මගීන් 75000 ක් ඉක්මවා යන ගම්පහ දුම්රියපළ මෙම ව්‍යාපෘතිය හරහා මඟින් 125,000 ක දක්වා මගී ආකර්ෂණයක් 2025 වර්ෂය වන විට ලබා ගැනීමට අපේක්ෂා කරයි.

*රූප සටහන 3.16 : යෝජිත විදුලි දුම්රිය ව්‍යාපෘතිය*




මූලාශ්‍රය: Final Feasibility Study Report for Main Line, Coastal Line and Puttalam Line – Volume I

*වගුව3.2: විදුලි දුම්රිය ව්‍යාපෘතියත් සමග අපේක්ෂිත මගීන් සංඛ්‍යාව*

| Line | Indicator | 2025 | 2035 |
|---|---|---|---|
| **Main Line** | Max. PPHPD | 43,618 | 52,167 |
| | Daily Sectional Passenger Trips | | |
| | Maradana Dematagoda | 419,405 | 501,603 |
| | Ragama - Walpola | 231,669 | 278,452 |
| | **Gampaha - Daraluwa** | **115,788** | **138,588** |
| | Total Daily Passenger Trips | 500,516 | 566,839 |
| **Coastal Line** | Max. PPHPD | 37,877 | 45,677 |
| | Daily Sectional Passenger Trips | | |
| | Fort – Secretariat Halt | 364,200 | 439,198 |
| | Rathmalana - Angulana | 226,327 | 263,564 |
| | Total Daily Passenger Trips | 504,587 | 597,074 |
| **Puttalam Line** | Max. PPHPD | 18,278 | 22,197 |
| | Daily Sectional Passenger Trips | | |
| | Ragama - Peralanda | 175,744 | 213,436 |
| | Ja – Ela - Thudella | 104,841 | 130,822 |
| | Seeduwa - Liyanagemulla | 98,831 | 121,166 |
| | Total Daily Passenger Trips | 203,023 | 248,311 |

මූලාශ්‍රය: Final Feasibility Study Report for Main Line, Coastal Line and Puttalam Line – Volume I

එමෙන්ම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හා විදුලි දුම්රිය ව්‍යාපෘතිය ඒකාබද්ධ කරමින් ගම්පහ නගරය තුළ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් (MMT) ඉදිකිරීමට යෝජිතය. ගම්පහ - කොළඹ බස්නැවතුම්පළ ප්‍රදේශය සහ ගම්පහ දුම්රියපළ යා කරමින් එම මුළු භූමි ප්‍රදේශය තුළ මෙම බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමට නියමිත අතර මෙම ව්‍යාපෘතියත් සමග ගම්පහ නගරය තුළ විශාල සංවර්ධනයක් සිදු වනු ඇත.

ගම්පහ නගරය තුළ ප්‍රවාහනය මුල් කොට ගනිමින් සිදු වන ජාතික තලයේ ව්‍යාපෘති මඟින් විශාල මගී ජනගහනයක් මෙන්ම නේවාසික ජනගහන කේන්ද්‍රයක් බවට ගම්පහ ප්‍රදේශය පත්වනු ඇත.

### 3.3.2 පරිපාලන හා අධ්‍යාපනික හා සෞඛ්‍ය කේන්ද්‍රස්ථානයක් වීම සහ අනාගත නේවාසික ඉල්ලීම.

ගම්පහ දිස්ත්‍රික්යේ පරිපාලන අගනගරය වන ගම්පහ නගර සීමාව තුළ රජයේ ආයතන සහ සේවා ආයතන 75කට අධික සංඛ්‍යාවක් ස්ථාපිත වී ඇත. එසේම එම ආයතනවලින් බොහොමයක් එකම කලාපයක් තුළ ස්ථාපිත වී ඇත. එසේම එම ආයතන වලින් බොහොමයක් එකම කලාපයක් තුළ ස්ථාපිත වී පැවතීමද සැලසුම්කරණයේ දී වැදගත් සාධකයක් වනු ඇත. පරිපාලන නගරය සඳහා දිනපතා පැමිණෙන නිලධාරීන් සංඛ්‍යාව 4000 ඉක්මවන අතර අධ්‍යාපනික කටයුතු සඳහා ගම්පහ නගරය ප්‍රසිද්ධියක් උසුලයි.

විශේෂයෙන්ම ජාතික මට්ටමේ හා පළාත් මට්ටමේ පාසල් 4ක්, ඇතුළු පාසල් 48ක් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත වී ඇති අතර මෙයින් ජනප්‍රිය පාසල් රැසක් නගරය තුළට කේන්ද්‍රගතව ඇත. ඒ අනුව පාසල් කටයුතු සඳහා දිනකට නගරයට ඇදී එන සිසුන් සංඛ්‍යාව 25000 ඉක්මවයි. එමෙන්ම උපකාරක පන්ති සඳහා වඩාත් ප්‍රසිද්ධියක් උසුලන ගම්පහ නගරය තුළ විශාල උපකාරක පන්ති පර්ශදයක් ඇතුළු තවත් උපකාරක පන්ති පර්ෂදයන් බිහි වී ඇත. මේ උපකාරක පන්ති සඳහා දිවයිනේ නන් දෙසින් දිනකට නගරයට පැමිණෙන සිසුන් සංඛ්‍යාව 40,000 ක් පමණ වෙයි.

සෞඛ්‍ය සේවා අතින් ගත කළ ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාපිත දිස්ත්‍රික් මහා රෝහල් දෙකෙන් එක් මහා රෝහලක් ලෙස ගම්පහ දිස්ත්‍රික් මහා රෝහල ස්ථාපිත වී පැවතීමත්, වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල සහ විශ්ව විද්‍යාලය ගම්පහ නගරය තුළ පැවතීමත් මෙම සෞඛ්‍ය සේවා වටා ගොඩනැගී ඇති සෞඛ්‍ය සේවා පර්ෂදයනුත් ගම්පහ ප්‍රාදේශීය වශයෙන් ඉහළින් ඔසවා තබයි.

එසේම, ජාතික මට්ටමේ ප්‍රවාහන සංවර්ධනයන් සහ අධ්‍යාපන ආයතන මෙන්ම, කොළඹ අගනගරයට ආසන්නව පිහිටා තිබීමත් සහ රජයේ ජාතික මට්ටමේ මැදිහත් වීම් සමඟ නුදුරු අනාගතයේදී මෙම ප්‍රදේශය වඩාත් ඉල්ලුමට ලක්වන ප්‍රදේශයක් වනු ඇත.

Jones Lang Lasalle Property Consultant (Lanka) Pvt LTD (JLL) 2017 වර්ෂයේදී කරන ලද සමීක්ෂණයකට අනුව කොළඹ සහ ඒ අවට තදාසන්න ප්‍රදේශ වල නිවාස මිලදී ගැනීමට හැකියාව ඇත්තේ (Affordability) ඉහළම අදායමක් උපයන කුටුම්බයන්ගෙන් 20%කට පමණි. රුපියල් මිලියන 0.3ක සාමාන්‍ය මාසික අදායමක් ඇති ඉහළම 10%ක කුටුම්බයන්ටද ලබාගත හැක්කේ දෙවන ශ්‍රේණියේ ප්‍රදේශයක පිහිටි නිදනකාමර 02කින් සමන්විත පහළ මධ්‍යම පන්තික නිවසක් පමණි. එබැවින් මධ්‍යම අදායමක් ලබන බහුතර ජනගහනය දෛනිකව කොළඹ අගනුවරට ඉක්මනින් ළඟා වියහැකි ප්‍රවාහන ජාලයක් පවතින, නිවාස මිල දැරිය හැකි ප්‍රදේශයන් තෝරා ගනු ලබයි. ඒ බව 2017 වර්ෂයේදී Lamudi.lk වෙබ් අඩවිය මඟින් සිදුකර ඇති සමීක්ෂණයෙන් තහවුරු වෙයි. එම සමීක්ෂණය අනුව කොළඹ සහ නුවරට පසුව වැඩිම පිරිසක් තම නේවාසික ස්ථානය ලෙස විමසා බලා ඇත්තේ ගම්පහ ප්‍රදේශයයි. එමෙන්ම එම සමීක්ෂණයට අනුව ගම්පහ ප්‍රදේශයේ දේපළ වෙළඳාම් තුළ වැඩි වශයෙන් ජනතාව විමසීමට ලක් කර තිබෙන්නේ නිවාස හා ඉඩම් පිලිබඳ වේ. ඒ අනුව ගම්පහ

ප්‍රදේශය තුළ නේවාසික ආකර්ශණයක් පැවතීමද සංවර්ධනයේදී විභවතාවයක් ලෙස සැලකිය හැකිය. එසේම බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම - 2030 තුළින් ගම්පහ ප්‍රදේශය මධ්‍ය ඝණත්ව නේවාසික හා මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස හඳුනාගෙන ඇති අතර එයින් කොළඹ නගරයෙන් පිටතට යන ඉල්ලුම ගම්පහ ප්‍රදේශයට ඒකරාශී කිරීම අරමුණු කරන අතර එය අනාගත නේවාසික ඉල්ලුම තවදුරටත් සනාථ කරයි.

*වගුව 3.2 : ගම්පහ සහ කොළඹ නගර වල නිවාස මිලෙහි දැරිය හැකි බව (Housing Affordability)*

| නගරය | නේවාසික දේපළ වර්ගය | වියදම රු.මිලියන |
|---|---|---|
| කොළඹ 03 | සුඛෝපභෝගී මහල් නිවාසය | 100 - 150 |
| | නිදන කාමර 2ක් හෝ 3ක් සහිත නවීන නිවස | වැඩි 30 |
| ගම්පහ | සුඛෝපභෝගී මහල් නිවාසය | 20 – 30 |
| | නිදන කාමර 2ක් හෝ 3ක් සහිත නවීන නිවස | 10 - 15 |
| | මධ්‍යම පාන්තික නිවාස | 5 - 10 |

මූලාශ්‍රය : Lamudi.lk Survey, අන්තර්ජාලය , 2017

# 04

## පරිච්ඡේදය

# සංවර්ධන සැලසුම් රාමුව



# 4 වන පරිච්ඡේදය
# සංවර්ධන සැලසුම් රාමුව

## 4.1 දැක්ම

"සියනෑවේ පිබිදෙන හරිත අගනගරය "

"The Siyane, Flourish Green Capital"

## 4.2 දැක්මේ ප්‍රකාශනය

එකිනෙක ගැලපුණු, එකිනෙක සමතුලිතය වන භූමි භාවිතයන් සහිත, පරිපාලන අගනගරයක තිබිය යුතු අත්‍යන්ත ලාක්ෂණිකයන් කැටිකොට ගත්, එමෙන්ම නේවාසික නගරයක් ලෙස සජීවී වෙමින් හා වාණිජ, ආයතනික, සමාජීය සේවා සමඟ සංකලනය වූ ප්‍රශස්ත ආර්ථික පදනමක් ඇති ලංකාවේ පළමු පෙළ නගරයක් බවට පත්කිරීම.

## 4.3 ඉලක්ක

### ඉලක්ක 01

*ප්‍රධාන නගරයේ සහ උප නගරවල ආර්ථිකය නැවත නගා සිටුවිය හැකි විවිනුවත්, ගතික නගර මධ්‍යයන් ඇති කිරීම.*

### ඉලක්ක 02

*අග නගරයක ලාක්ෂණිකයන් මැනවින් පිළිබිඹු වන පරිදි සාධනීය සේවාවක් ලබා දීම හා හරිතවත් සුවදායී නාගරීකරණයක් ඇති කිරීම.*

### ඉලක්ක 03

*ගොඩනැගෙමින් පවතින නේවාසික සංවර්ධනය සඳහා වඩාත් උසස් ජීවන තත්ත්වයක් ඇති කිරීම උදෙසා අවශ්‍ය වන පහසුකම් හා සේවා වලින් සමන්විත වන නාගරීකරණයක් ඇති කිරීම.*

## 4.4 පරමාර්ථ

### ඉලක්ක 01

*නාගරික ආර්ථිකය පුනර්ජීවනය කිරීම අරමුණු කරගත් ඉතා ගතික සහ ජවසම්පන්න මධ්‍යම නගර කේන්ද්‍රයක් සහ ඒ අවට චන්ද්‍රිකා නගර සංවර්ධනය කිරීම .*

#### පරමාර්ථ

i. 2033 වන විට වාණිජමය ඉඩම් භාවිතය 10% දක්වා වැඩි කිරීමට පහසුකම් සැලසීම (පවතින 3%)

ii. අවිධිමත් ලෙස සිදු කර ඇති අධ්‍යාපනික පර්ෂදයන් භාවිත කරමින්, හෙක්ටයාර 20 භූමියක් තුළ පෞද්ගලික අංශයේ අධ්‍යාපන ත්‍රිකෝණයක් 2033 වන විට ඇති කිරීම

iii. තෝරාගත් සංවර්ධනය කල හැකි භූමීන් හෙක්ටයාර 100ක් තුළ දූෂ්‍ය කාරක නොවන කර්මාන්ත කලාප ස්ථාපිත කිරීම මඟින් ජාතික භෞතික සැලැස්ම තුළ කර්මාන්ත ප්‍රවර්ධන කිරීම සඳහා 10%ක දායකත්වයක් සැපයීම .

iv. ප්‍රවාහනය මූලික කරගත් අගනගර සංවර්ධනයක් ඇති කිරීම සහ එකිනෙක තරගකාරී උප නගර ත්‍රිත්වයක් සංවර්ධනය කිරීම.

v. කෘෂි-පරිසර හා ආයුර්වේද පදනම් කරගත් රැකියා අවස්ථා උත්පාදනය කිරීම මඟින් ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම.

## ඉලක්ක 02

*අග නගරයක ලාක්ෂණිකයන් මැනවින් පිළිබිඹු වන පරිදි සාධනීය සේවාවක් ලබා දීම හා හරිතවත් සුවදායී නාගරීකරණයක් ඇති කිරීම.*

### පරමාර්ථ

i. ගම්පහ දිස්ත්‍රික්කයේ වැසියන් සඳහා ඵලදායි මහජන සේවාවක් සැපයීම අරමුණු කරගත් පරිපාලන පර්ෂදයක් සංවර්ධනය කිරීම.

ii. නාගරික සැලසුම් මැදිහත්වීම් තුළින් සිත් ඇදගන්නා සුළු අගනගර ස්වභාවයක් පවත්වා ගැනීම.

iii. 2033 වන විට හරිත පරිසරය හා අවට පරිසර-සංස්කෘතික දර්ශනයන් උපයෝගී කරගනිමින් අගනුවර ප්‍රතිරූපය පොහොසත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම. (නගර හරිත ආවරණය 20% කින් වැඩි කිරීම )

iv. 2033 වන විට ගංවතුර පාලන උපායමාර්ග හරහා ගංවතුර තත්ත්වයන්ට ඔරොත්තු දෙන නගරයක් ගොඩනැගීම.

## ඉලක්ක 03

*ජීවන තත්ත්වයෙහි විභව වැඩිදියුණු කිරීමක් සහතික කරමින් නේවාසික පරිසරය ඉහළ නැංවීම සඳහා නාගරික සැලසුම් ප්‍රවර්ධනය කිරීම.*

### Objectives - පරමාර්ථ

i. ජාතික භෞතික සැලැස්ම තුළ 2048 වන විට බස්නාහිර නාගරික කලාපයෙන් අපේක්ෂිත 25% ජනගහනයෙන් 6% ප්‍රමාණයක් සඳහා නේවාසික පහසුකම් සැලසීම .

ii. 2033 වන විට සැලසුම් බල ප්‍රදේශයේ අපේක්ෂිත සංවර්ධනය අවශ්‍ය වන පරිදි 100% ක් ජල සම්පාදන, විදුලි සැපයුම, මලාපවහන සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති ඇතුළු භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

iii. 2033 වන විට අවම හෙක්ටයාර 20 අවකාශයන් තුළ පොදු විවෘත විනෝදාත්මක අවකාශයන්ගෙන් යුත් ධූරාවලි ජාලයක් නිර්මාණය කිරීම.

iv. 2033 වන විට පදිකයන් සඳහා මුලිකත්වය දෙමින් ප්‍රධාන නගරය තුළ සහ අනෙකුත් උප ප්‍රධාන නගර තුළ ඇවිදීමේ හැකියාව වැඩිදියුණු කිරීම.

# 05

## පරිච්ඡේදය



# ශදුඅත (SWOT) විශ්ලේෂණය

# 5 වන පරිච්ඡේදය
# ශදුඅත විශ්ලේෂණය

*ඉලක්ක 01 : නාගරික ආර්ථිකය පුනර්ජීවනය කිරීම අරමුණු කරගත් ඉතා ගතික සහ ජවසම්පන්න මධ්‍යම නගර කේන්ද්‍රයක් සහ ඒ අවට චන්ද්‍රිකා නගර සංවර්ධනය කිරීම .*

## S ශක්තින්

- බස්නාහිර පළාතේ නාගරික ධුරාවලියට අනුව ගම්පහ නගරය පළමු පෙළ නගරයක් ලෙස හඳුනාගෙන පැවතීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ පෞද්ගලික උපකාරක පන්ති පර්ෂද පැවතීම හා සිසුන් 40,000 කට අධික සංඛ්‍යාවක් එම සේවා ලබා ගැනීම සඳහා දිනකට නගරයට පැමිණීම.
- රාජ්‍ය සහ පෞද්ගලික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව
  *- වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - ආයුර්වේද ඖෂධ: වාට්ටු 4 : ඇඳන් ධාරිතාව 107*
  *- ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල - වාට්ටු 20: ඇඳන් ධාරිතාව 781*
  *- පුද්ගලික රෝහල් හා රසායනාගාර පර්ෂද ගම්පහ දිස්ත්‍රික් මූලික රෝහලට යාබදව පිහිටා තිබීම.*
- ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය 57% ක වන අතර එයින් 78% ක ප්‍රතිශතයක් රැකියා නියුතු පුද්ගලයන් වීම.
- ජනගහනයෙන් 70%ක් රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වන අතර 25%ක් පමණ තමන්ගේම ව්‍යාපාර වල නිරත වන්නන් වේ.
- ප්‍රදේශයේ ප්‍රධානතම කෘෂි කාර්මික ක්‍රියාකාරකම ලෙස වී ගොවිතැන පැවතීම හා ගම්පහ දිස්ත්‍රික්කයේ වී අස්වැනෙන් 14% ක දායකත්වයක් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුලින් ලබා දීම හා දොම්පේ හා මීරිගමට පසුව ගම්පහ දිස්ත්‍රික්කයේ තෙවන විශාලම වී අස්වැන්න ගම්පහ ප්‍රා.ලේ.කො ලබා දීම.
- ගම්පහ - බැලුම්මහර - අන්නාසි සඳහා ප්‍රචලිත වීම හා එම ප්‍රදේශයේ පවුල් 2000ක් පමණ අන්නාසි වගාව ආශ්‍රිත ආර්ථික කටයුතු සිදු කිරීම.
- දැනට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුල සංවර්ධිත ප්‍රදේශය 59% ක් වන අතර සංවර්ධනය කළ හැකි මුළු භූමි ප්‍රමාණය 15% කි.

## W දුර්වලතා

- රැකියා විරහිතය ජනගහනය 22% ක් වන අතර ජනගහනයෙන් 43% ක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවේ.
- නගර මධ්‍යයේ ඌන උපයෝගිතා සහ අබලන් තත්ත්වය නගර ප්‍රතිරූපය දුර්වල කර ආර්ථික වටිනාකම අඩු කරයි

## O අවස්ථා

- ප්‍රවාහන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ගම්පහ නගරය සඳහා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට යෝජනා කර තිබීම.

## T තර්ජන

- කඩවත, කිරිබත්ගොඩ, නිට්ටඹුව වැනි අවට ප්‍රදේශවල තරඟකාරී වාණිජ නගර පර්ෂද වල වර්ධනය

*ඉලක්ක 02: අග නගරයක ලාක්ෂණිකයන් මැනවින් පිළිබිඹු වන පරිදි සාධනීය සේවාවක් ලබා දීම හා හරිතවත් සුවදායී නාගරීකරණයක් ඇති කිරීම.*

## S ශක්තීන්

- ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනුවර භූමිකාව

*- නගර සීමාව තුළ රාජ්‍ය ආයතන 75කට අධික සංඛ්‍යාවක් කේන්ද්‍ර ගතව පැවතීම.*
*- 4250 රාජ්‍ය සේවකයින් දිනපතා ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට සංකේන්ද්‍රණය වී ඇත.*

- හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

*- පාරිසරික වටිනාකම - ශාක විශේෂ 500 කින් හෙනරත්ගොඩ උද්‍යානය සමන්විත වේ.*

- නගරයේ ආර්ථිකය සේවා සහ ව්‍යාපාරික අංශය මත පදනම් වේ.

*- නගරයට දිනකට ආසන්න වශයෙන් 200,000 ක්‍රියාකාරී ජනගහනයක් ඇත. 2035 වන විට පුරෝකථනය කරන ලද ක්‍රියාකාරී ජනගහනය 303,000 (ප්‍රවාහන ප්‍රධාන සැලැස්ම - 2014)*

*- පරිසර සංවේදී ප්‍රදේශය ලෙස සැලකෙන මුළු භූමි ප්‍රමාණයෙන් 27%ක් වන හෙක්ටයාර 2551ක් වන අතර ඉන් 26%ක් (හෙක්ටයාර 2438ක්) කුඹුරු ඉඩම් වේ. මේවා ගංවතුර රඳවා තබා ගන්නා ජල රැදවුම් ප්‍රදේශ ලෙස නගරයට ගංවතුරෙන් වන බලපෑම අවම කරයි.*

- වොලි බෝල් ක්‍රීඩාව සඳහා ගම්පහ ප්‍රදේශය ජාතික වශයෙන් ඉමහත් කීර්තියක් උසුලයි

## W දුර්වලතා

- නගර මධ්‍යයන තුළ වාහන නැවැත්වීමේ සහ පදික මාර්ග නොමැති වීම හා දුර්වල නඩත්තුව, කාණු පද්ධති වල අක්‍රමවත් භාවය , දෘශ්‍ය බාධක (Visual Barriers), දෘශ්‍ය දූෂණය (Visual Pollution), ඌන ප්‍රයෝජනයට නොගත් අවකාශයන්, ඇවිදීමේ මාර්ගවල වීදි වෙළෙන්දන්ගේ අවිධිමත් භාවය නිසා මහජනතාවට සිදුවන අපහසුතාවය .
- ගම්පහ නගර මධ්‍යය තුළ මෝලවත්ත සහ UC වත්ත නමැති ප්‍රදේශ තුල අඩු අදායම් නිවාස ඒකක 80ක් පමණ පිහිටා තිබීම.

## O අවස්ථා

- ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිපත්තිවල බලපෑම
- ගම්පහ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශය සංස්කෘතික, පාරිසරික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් සංචාරක ස්ථානවලින් මායිම් වී ඇත.

*- අස්ගිරි රජ මහා විහාරය*
*- වාරණ රජ මහා විහාරය*
*- පිළිකුත්තුව /මාලිගාතැන්න රජ මහා විහාර*

## T තර්ජන

- ගම්පහ දෙසට නාගරික පීඩනය වැඩිවීම හා පරිසර සංවේදී ප්‍රදේශවලට හානි කිරීමේ ප්‍රවණතාවක් හා තෙත්බිම් ආක්‍රමණය ඉහළ ගොස් ඇත.

*ඉලක්ක 03: ජීවන තත්ත්වයෙහි විභව වැඩිදියුණු කිරීමක් සහතික කරමින් නේවාසික පරිසරය ඉහළ නැංවීම සඳහා නාගරික සැලසුම් ප්‍රවර්ධනය කිරීම.*

## S ශක්තීන්

- ගම්පහ දුම්රිය ස්ථානය

*- ප්‍රධාන දුම්රිය ස්ථානය සහ ප්‍රධාන මාර්ගයේ 15 වන නැවතුම*
*- දිනකට මගීන් 75,000 කට වැඩි පිරිසකට පහසුකම් සැලසීම (ප්‍රවාහන ප්‍රධාන සැලැස්ම - 2014)*
*- නගරය තුළ දෛනික ගමන්වාර ජනනය කිරීමේ ප්‍රමුඛ සාධකය ලෙස ක්‍රියා කිරීම*
*- බුළුගහගොඩ, ගනේමුල්ල, යාගොඩ දුම්රිය ස්ථාන: නේවාසික ප්‍රදේශය පදනම් කරගත් දුම්රිය නැවතුම් (දෛනික මගීන් 5000-8000 ත් අතර ප්‍රමාණයකි)*

- ජන සංයුතිය සහ ධනාත්මක වර්ධන වේගය

*- ගම්පහ ප්‍රදේශයේ සමස්ත ජනගහනය ආසන්න වශයෙන් 229,000 කි.*
*- එය කටාන, මහර සහ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ජනගහනයෙන් පසු ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම වාර්තාගත ජනගහනය වේ. එය ගම්පහ දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 8.5% කි.*
*- ගම්පහ දිස්ත්‍රික්කයේ ඉහළම වර්ධන වේගය ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් 1.46%ක් පමණ වාර්තා විය.*

- අධ්‍යාපන පහසුකම් සහ ඉහළම සාක්ෂරතා අනුපාතය

*- සමස්ත ශ්‍රී ලංකාවෙන් වැඩිම සාක්ෂරතා අනුපාතය ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය සාක්ෂරතා අනුපාතයෙන් 98.5% කි.*
*- 4 - ජාතික පාසල් / 3 - 1 AB කාණ්ඩයේ පාසල් / 07 - පළාත් සභා පාසල්*
*- ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මුළු පාසල් සංඛ්‍යාව 48 කි*
*- වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල සහ විශ්වවිද්‍යාලය*
*- කාර්මික විද්‍යාලය - ගම්පහ කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ.*

- වත්මන් පවතින නිවාස සහ අවකාශ පරිහරණය

*- නිවාසවලින් 85%ක් තනි නිවාස කාණ්ඩයට අයත් වන අතර නිවාසවලින් 14%ක් දෙමහල් නිවාසවලට අයත් වේ.*

- සුදුසු දේශගුණික තත්ත්වය

*- අඩු තෙත් කලාපීය තැනිතලා සහ වාර්ෂික වර්ෂාපතනය 1700 - 2400 මි.මී*

- අන්තර් කලාපීය මාර්ග සම්බන්ධ කිරීම

*- A 1 මාර්ග තීරය*
*- දිනකට බස්රථ 500 කට අධික ප්‍රමාණයක් බස් මාර්ග 27ක් හා ගමන් වාර 1500ක් ආවරණය කරනු ලැබේ.*
*- ගම්පහ සිට මහරගම සහ බත්තරමුල්ල දක්වා සෘජු අධිවේගී මාර්ග බස් රථ, කඩවත අන්තර් හුවමාරුවට ආසන්නව අන්තර් කලාප සහ අභ්‍යන්තර ප්‍රදේශ තුළ ප්‍රවාහන ජාලය වැඩි කර ඇත.*

- යටිතල පහසුකම් ලබා ගැනීමේ හැකියාව

## W දුර්වලතා

- සාමාන්‍ය ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ ආවරණය 60% ක් පමණ වන අතර පළාත් පාලන ආයතන දෙක සඳහාම කසළ වෙන් කිරීම හා කොපොස්ට් නිපදවීම සඳහා සුදුසු භූමියක් නොමැති වීම.
- පොදු විවෘත අවකාශ අවශ්‍යතාවය හෙක්ටයාර 220ක් පමණ වන නමුත් දැනට පවතින විවෘත අවකාශය හෙක්ටයාර 14කට (පුද්ගලයින් 1000කට හෙක්ටයාර 1කට) සීමා වී ඇත.

## O අවස්ථා

- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
- යෝජිත දුම්රිය විදුලි ව්‍යාපෘතිය
- අනාගත නේවාසික ඉල්ලුම

## T තර්ජන

- පිරිපහදු නොකළ අපද්‍රව්‍ය සහ අපජලය ජල දේහ වෙත බැහැර කිරීම.
- අත්තනගලු ඔයේ වාර්ෂික ගංවතුර තත්ත්වය
  - *2008, 2010, 2021 ගංවතුර හේතුවෙන් පිළිවෙළින් පුද්ගලයින් 11768, 15200,10112 ක් පමණ අවතැන් විය.*

# 06

# පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්ම

# පරිච්ඡේදය 06
# සංවර්ධන සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

රූප සටහන 6.1 සංකල්පිත සැලැස්ම




මූලාශ්‍රය: ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023

“සියනෑවේ පිබිදෙන හරිත අගනගරය” යන දැක්ම පෙරටුකොටගෙන ගොඩනැගෙන ගම්පහ නගර සංවර්ධන සැලැස්ම තුළ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයම, එනම් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි ඒකාබද්ධ සංකල්පිත සැලැස්මක් නිර්මාණය කර ඇති අතර සංකල්පිත සැලැස්ම මුල්කොට ගෙන ගොඩනැගෙන උපාය මාර්ග හා ව්‍යාපෘති හඳුනාගැනීමේදී, මෙම පළාත් පාලන බල ප්‍රදේශ සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රමුඛතා ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

මෙහිදී, සංකල්පිත සැලැස්ම වශයෙන් අදහස් කරණු ලබන්නේ ඉදිරි වසර දහය සඳහා අප මෙහෙයවනු ලබන දැක්ම හා එම දැක්ම මූලික කරගත් ඉලක්ක හා පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ මූලික සංකල්පයයි. එනම්, මෙම සංකල්පිත සැලැස්ම තුළින් නගරය පිළිබඳ අපගේ අනාගත දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා වන උපාය මාර්ග හඳුනාගැනීමට හැකියාව ඇත.

ඒ අනුව, මෙම සංකල්පය ප්‍රධාන වශයෙන් එකිනෙකට සමාන්තරව ගමන් කරන ගමනාගමන කොරිඩෝ (Transit Corridor) තුනක් ඔස්සේ සහ ප්‍රධාන නගරය ප්‍රමුඛ චන්ද්‍රිකා නගර තුනක් ඔස්සේ ගොඩනැගෙයි. එම සමාන්තර ගමනාගමන කොරිඩෝ තුන වන්නේ කොළඹ- නුවර ප්‍රධාන මාර්ග කොරිඩෝව, කොළඹ - නුවර ප්‍රධාන දුම්රිය මාර්ගය සහ ගොඩනැගෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගයයි. එසේම මෙම කොරිඩෝ ත්‍රිත්වයෙන් කොළඹ- නුවර ප්‍රධාන මාර්ග කොරිඩෝව වාණිජ කොරිඩෝවක් ලෙසත්, දුම්රිය මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ග නේවාසික කොරිඩෝ ලෙසත්, වැඩිදියුණු කිරීම අපේක්ෂා කරයි. එසේම, ගම්පහ ප්‍රධාන දුම්රියපළ සමඟ දැනටමත් ගමනාගමනයේ කේන්ද්‍රස්ථානයක් වී ඇති ගම්පහ නගරය, මධ්‍යම අධිවේගී මාර්ගයේ එක් අන්තර් හුවමාරුවක් ස්ථාපිත වන ප්‍රධාන නගරයක් ලෙස, යෝජිත විදුලි දුම්රිය ව්‍යාපෘතිය මඟින් හඳුනාගෙන ඇති ප්‍රධාන දුම්රිය නැවතුම්පළක් ලෙස හා ගම්පහ නගර මධ්‍යට යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය යන විභවතා සැලකිල්ලට ගනිමින් මෙම නගරය ගමනාගමනය මුල්කොටගත් සංවර්ධනයක් (Transport Oriented Development) සහිත නගරයක් ලෙස හඳුනා ගැනුණු අතර මෙය ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ පවතින මව් නගර (The Parent City) ලෙස සංවර්ධනය කරන ලබන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අග නගරය ලෙස අගනගර ලාක්ෂනිකයන් පිළිබිඹු කෙරෙන නගරයක් බවට පත් කෙරෙනු ඇත.

එසේම, මව් නගරය ආසන්නයේම පවතින චන්ද්‍රිකා නගර (Satellite Towns) කිහිපයක්ද හඳුනා ගැනුණු අතර, ඒ ඒ චන්ද්‍රිකා නගර වල ස්වභාවය අනුව සහ විභවතාවන් අනුව එම චන්ද්‍රිකා නගර එකිනෙකට වෙනස් සංකල්ප යටතේ සංවර්ධන කිරීම සිදුකෙරේ. මෙහිදී චන්ද්‍රිකා නගරයක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ ප්‍රධාන නගරයක් ආසන්නයේ බිහිවන, යම් මට්ටමක් තුළ ස්වාධීන සහ ස්වයන්පෝෂිත්වයක් ගොඩනගා ගනු ලබන උප නගරයන්ය. ඒ අනුව කොළඹ- නුවර ප්‍රධාන වාණිජ කොරිඩෝවේ පිහිටා ඇති යක්කල චන්ද්‍රිකා නගරය වාණිජ නගරයක් (Business Satellite) ලෙස වාණිජ ආකර්ෂණය ග්‍රහණය කරගැනීමටත්, ප්‍රධාන දුම්රිය ස්ථානයක් වන ගනේමුල්ල සහ ගනේමුල්ල- කඩවත මාර්ගය සමඟ කඩවත අධිවේගී මාර්ගයට හා කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයට පවතින ආසන්න දුර හේතු කොටගෙන, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ ඉහළ ජනගනත්වයකින් යුත් නගරයක් ලෙස සැළකෙන ගනේමුල්ල නගරය, මව් නගරයෙන් වෙන්වූ ස්වයං පෝෂිත නගරයක් ලෙස එකී නේවාසික ජනගහනයට පෝෂක ප්‍රදේශයක් ලෙස සේවාව සපයන නේවාසික නගරක් (Dormitory Satellite) ලෙසත්, කොළඹ- නව නුවර මාර්ගය හරහා වැටී ඇති කොළඹට ආසන්න මාර්ග කොරිඩෝවක සහ බියගම ආයෝජන කලාපයට ආසන්නයෙන්ම පිහිටි නේවාසික නගරයක් ලෙස විධිමත් සේවා පර්ෂදයක් ඔස්සේ සංවර්ධනය කිරීමේ අදිටනින් වැලිවේරිය චන්ද්‍රිකා නගරය සේවා චන්ද්‍රිකා නගරයක් (Service Satellite) ලෙසත් සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

එසේම ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ ආර්ථිකයට වටිනාකමක් ලබා දියහැකි ප්‍රදේශ සහ එම ආර්ථික වටිනාකම් ග්‍රහණය කරගනු ලබන උපයා මාර්ගද ඉදිරියේදී උපායමාර්ගය සැලසුම් තුළින් විස්තර කෙරෙන අතර මෙම ප්‍රධාන නගරය සහ සෙසු චන්ද්‍රිකා නගර සංවර්ධනයන් පාදක කොටගෙන ගොඩනැගෙන පෝෂක ප්‍රදේශන් තුළ විවිධ ඝනත්වයන්ගෙන් යුතුව වර්ධනය වන නේවාසික ප්‍රදේශයන් ස්ථාපිත වනු ඇත.

## 6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම

ගම්පහ සැලසුම් බල ප්‍රදේශය අනාගතයේදී හරිත අගනගරයක් ලෙස සංවර්ධනය කිරීමේදී යෝජිත ආර්ථික, පාරිසරික සහ අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලසුම් හරහා ක්‍රියාවට නැංවීමට නියමිත උපාය මාර්ගික ව්‍යාපෘති තුළින් බිහිවන නාගරික ආකෘතියේ පිළිබිඹුව යෝජිත භූමි පරිහරණ සැලැස්ම හරහා නිරූපණය කෙරේ.

ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ සමස්ථ භූමි පරිහරණ සැලැස්ම මූලික වශයෙන් ගමනාගමනය මුල් වූ අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපකින්ද, එනම් එම කලාපයට අයත්වන්නේ ගම්පහ නගර මධ්‍යයේ සිට උපරිම දුර කිලෝමීටර 1ක් පමණ වපසරියකින් යුත් ප්‍රදේශයකි. මෙම ප්‍රදේශය ගමනාගමනය මුල් කොටගත් සංගත සංවර්ධනයක්( Compact Development) අපේක්ෂා කරන ප්‍රදේශයකි. තිරස් මිශ්‍ර සංවර්ධනයක් සහිත මෙම ප්‍රදේශය පොදු ගමනාගමන පහසුකම් සහිත, පදික ගමනාගමනයට වැඩි ඉඩක් ලබා දෙන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කෙරෙන අතර මෙම සංකල්පය පිළිබඳව වැඩිදුරටත් ආර්ථික උපාය මාර්ගය තුළ විස්තර කරනු ලැබේ.

එසේම මෙම අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපයට යාබදව පිහිටි කලාපය වන්නේ අධි ඝනත්ව ආයතනික කලාපය වන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරය ලෙස සැලකෙන ගම්පහ නගරය තුළ පවතින රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයකින් යුත් පර්ෂදයක් (Cluster) මෙම කලාපය තුළ දක්නට ලැබෙන අතර තවදුරටත් ආයතනික හා නේවාසික යන භාවිතයන් මෙම කලාපය තුළ වැඩි වශයෙන් දිරිගන්වනු ලැබේ.

තවද, මෙම අධි ඝනත්ව ආයතනික කලාපයට යාබදව අධි ඝනත්ව නේවාසික කලාපය පිහිටා ඇති අතර, කුඹුරු ඉඩම් සහිත සංවේදී තෙත් බිම් කලාපයක් සමඟ පිහිටා ඇති අධි ඝනත්ව නේවාසික කලාපයට යාබදව පිහිටි කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු නේවාසික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.




එසේම, ගම්පහ මහනගර සභා බල ප්‍රදේශයට අයත් වන කොළඹ - නුවර මාර්ග කොරිඩෝව දෙපස භූමිය මිරිස්වත්ත සිට යක්කල උප නගරය වන තෙක් අධි ඝනත්වයෙන් යුතු වාණිජ කලාපයක් ලෙස ප්‍රවර්ධනය කෙරෙන අතර තෙත්බිම් සංවේදී කලාපයක් සමඟ ඇති ගම්පහ යක්කල ආයුර්වේද පර්ෂදය ප්‍රධාන සංචාරක කොරිඩෝවක් ලෙස සැලකෙන කොළඹ-නුවර මාර්ගයේ දෙස් විදෙස් සංචාරක ගිමන් පළක් ලෙස ප්‍රචලිත කිරීමේ අරමුණෙන් මධ්‍යම ඝනත්ව සංචාරක කලාපයක් ලෙස ප්‍රවර්ධනය කෙරෙන අතර ඊට යාබදව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට මායිම්ව පිහිටා ඇති කලාපය මධ්‍යම ඝනත්වයකින් යුත් වාණිජ කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.




එසේම, ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සමස්ථ භූමි පරිහරණ සැලැස්ම මූලික වශයෙන් අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලපයකින්ද, එනම් ගනේමුල්ල නගරය කේන්ද්‍ර කොටගෙන ඇති මෙම කලාපය ගනේමුල්ල දුම්රිය ස්ථානයත්, ගනේමුල්ල ප්‍රධාන බස් නැවතුම්පලත් සහ කඩවත- ගනේමුල්ල මාර්ගය හරහා කඩවත අන්තර් හුවමාරුවට ඉතා ආසන්නයේ පිහිටා ඇති බැවින් ඉහළ ජනගහන ආකර්ශනයක් පවතින ප්‍රදේශයක් වන අතර එම ප්‍රදේශය වාණිජ, ආයතනික,සේවා, නේවාසික යන භාවිතයන් මුල්කොටගත් අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.




තවද මෙම අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය වට කොට ගෙන විවිධ ඝනත්වයන්ගෙන් යුත් නේවාසික කලාප 3ක් ප්‍රවර්ධනය කරන අතර බුළුගහගොඩ දුම්රිය ස්ථානය කේන්ද්‍ර කොටගෙන මධ්‍යම ඝනත්ව නේවාසික සංවර්ධනයක් සහ ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට මායිම් වන ඔරුතොට, මොරගොඩ ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් තවත් මධ්‍යම ඝනත්ව නේවාසික කලාපයක් සහ රට පහළින් පිහිටා ඇති කඩවත අන්තර් හුවමාරුවට ආසන්නව පිහිටා ඇති කලාපය දැනට පවතින නේවාසික ආකර්ෂණය පදනම්කොටගෙන හා සංවර්ධන විභවතාව පදනම් කොටගෙන අධි ඝනත්වයකින් යුතු නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

එසේම, කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය හරහා මිරිස්වත්ත, යක්කල අධි ඝනත්ව කලාපයට මායිම්ව පිහිටා ඇති කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු වාණිජ කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරෙන අතර නව කොළඹ නුවර මාර්ගය හරහා වැටී ඇති වැලිවේරිය ප්‍රදේශය බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයට යාබඳව පිහිටා ඇති ප්‍රදේශයක් වන අතර මෙම ප්‍රදේශය සේවා පර්ෂදයක් ලෙස විධිමත් සංවර්ධනයක් කරා මෙහෙයවීම අරමුණු කෙරෙන අතර පවතින කෘෂි නිෂ්පාදන කර්මාන්ත විභවතාවන් සැලකිල්ලට ගනිමින් පරිසර හිතකාමී කෘෂිකාර්මික නිෂ්පාදන කර්මාන්ත ආර්ථිකයක් මෙම කලාපය තුළ ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, මෙම ප්‍රදේශයට ඍජු සහ වක්‍ර රැකියා අවස්ථාද බිහි කෙරෙන දේශීය සහ බහු ජාතික සමාගම් මඟින් පාලනය වන කර්මාන්ත ආයෝජන අවස්ථා පුළුල් කිරීම අපේක්ෂා කෙරේ.

එසේම ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඉහළ පෙදෙස එනම්, මාකෙවිට, කිරිඳිවිට , අකරවිට ආදී ප්‍රදේශ අත්තනගලු ඔය ජල පෝෂක ප්‍රදේශයට අයත් අධි සංවේදී, වාර්ෂික ගංවතුර තත්ත්වයෙන් දැඩි බලපෑමක් ඇති කෙරෙන අධි සංවේදී කලාපයක් ලෙස

පරිසර සංවේදිතා දර්ශක විශ්ලේෂණයේදී පෙනී ගිය අතර එම පරිසර සංවේදීතාවය සැලකිල්ලට ගෙන අඩු ඝනත්ව නේවාසික කලාපයක් ලෙස මෙම කලාපය සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.



*සිතියම6.1 : යෝජිත භූමි පරිහරණ සැලැස්ම - ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, බ.ප අ - නා.සං.අධි. 2022

*සිතියම6.2 : යෝජිත භූමි පරිහරණ සැලැස්ම - ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, බ.ප අ - නා.සං.අධි. 2022

## 6.3 අපරවුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම

### 6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම

සේවා සැලැස්ම යටතේ සමාජීය සහ භෞතික යටිතල පහසුකම් පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර මෙහිදී සමාජීය යටිතල පහසුකම් යටතට සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතාකරණ, අධ්‍යාපන, සෞඛ්‍ය පහසුකම් සම්බන්ධව විශ්ලේෂණයන් සිදු කර ඇත. භෞතික යටිතල පහසුකම් යටතට ප්‍රවාහන, ජල සැපයුම, විදුලිය සැපයුම, ප්‍රවාහන සහ මාර්ග සංවර්ධන, අපජල, මළාපවහනය සහ කාණු පද්ධති, කසළ කළමනාකරණය සහ වෙනත් පහසුකම් පිළිබඳව සාකච්ඡා කෙරේ.

#### 6.3.1.1. යෝජිත නාගරික සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතාකරණ සැලැස්ම

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ පවතින නාගරික සේවා මධ්‍යස්ථාන, ප්‍රධාන නගර, උප නගර, ප්‍රමුඛතා මංසන්ධින් සහ අතුරු මංසන්ධින් ලෙස මාර්ග සම්බන්ධක (Connectivity Analysis) විශ්ලේෂණය හරහා හඳුනාගන්නා ලදී.

ඒ අනුව පවතින ප්‍රධාන නගර , උප නගර සහ මංසන්ධින් යෝජිත අනාගත සංවර්ධන දිශානතිය මඟින් ප්‍රමුඛතාවය මත වර්ගීකරණයට ලක් කළ අතර එම නාගරික සේවා මධ්‍යස්ථාන උපාය මාර්ගික ව්‍යාපෘති හරහා නේවාසික හා සංසරණ ජනගහනයේ සේවා අවශ්‍යතාවය උදෙසා සංවර්ධනය කිරීම මෙහිදී සිදු වේ. මෙහිදී ගමනාගමනය මුල් කොටගත් ප්‍රධාන නගරය හෙවත් සංකල්පිත සැලැස්ම තුළ සාකච්චා කරන ලද මව් නගරයට අමතරව ප්‍රධාන වශයෙන්ම රට සමගාමීව ගොඩනැගෙන චන්ද්‍රිකා නගර (Satellite Townships) හා ඒ හා ඒකාබද්ධ වන ප්‍රමුඛතා මංසන්ධින් මෙම සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතාකරණ සැලැස්ම මඟින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතාකරණ සැලැස්මේදී සංවර්ධන පීඩන දර්ශකය, පාරිසරික සංවේදිතා දර්ශකය පදනම් කරගෙන සිදු කළ ඝනත්ව කලාපීකරණය (Density Zoning) උපයෝගී කොට ගනු ලැබුණු අතර එම ඝනත්ව කලාපීකරණයට අනුව අනාගතයේදී ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දිරිගැන්වීමට අපේක්ෂා කරන මූලික භාවිතයන් වන මිශ්‍ර සංවර්ධන කලාප, ආයතනික කලාප, නේවාසික කලාප, වාණිජ කලාප, කෘෂි නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත කලාප, ආයුර්වේද පර්ෂදය පදනම් කරගත් සංචාරක කලාප යනාදී භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මූලිකවම හඳුනාගනු ලැබිණි. ඉහත විශ්ලේෂණයේ ප්‍රතිඵල සමග සංවර්ධන විභවතා දර්ශකය, මෙන්ම අධි සංවේදී පාරිසරික විශ්ලේෂණයත්, ජීවත් වීමට යෝග්‍ය පරිසර දර්ශකයත් සංයුක්ත කරමින් වඩා වැඩි අතිච්ඡදනය සහිත (Overlaying) මංසන්ධින් හා උප නගර හඳුනාගන්නා ලදී. ඒ අනුව පවතින නාගරික සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතාකරණය සිදුකර ඇත. එය පහත සිතියම මඟින් නිරූපණය කර ඇත. මෙම ප්‍රමුඛතාකරණය පාදක කරගනිමින් සංකල්පිත සැලැස්ම සහ කලාපීකරණ සැලැස්ම ඔස්සේ ගම්පහ නගරය මව් නගරය ලෙස ( The Parent City) ලෙස ගමන්ගමන්ය මුල් වූ, සංගත සහ මිශ්‍ර භාවිතයක් සහිත සේවා මධ්‍යස්ථානයක් ලෙස ගොඩනැගෙන අතර ඒ හා සමගාමීව දැනටමත් ස්වාධීන නගරක් ලෙස ගොඩනැගෙන ගනේමුල්ල නගරයද එම ප්‍රදේශය තුළ ඉහළ ජන ඝනත්වයකින් වර්ධනය වන නේවාසික ජනගහනයට සේවා සැපයිය හැකි සේවා මධ්‍යස්ථානයක් ලෙස තව දුරටත් වැඩි දියුණු කිරීම අපේක්ෂා කරන අතර ඒ අනුව ගම්පහ නගර සහ ගනේමුල්ල නගරය පළමු ප්‍රමුඛතා නගර ලෙස මෙම සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගෙන ඇත.

එසේම, සංකල්පිත සැලැස්ම තුළින් හඳුනා ගත් අනෙකුත් චන්ද්‍රිකා නගර (Satellite Townships) වන ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට අයත් යක්කල උප නගරය සහ ගම්පහ ප්‍රදේශීය සභා බල ප්‍රදේශයට අයත් වැලිවේරිය උප නගර කේන්ද්‍ර කොට ගෙන ඒ ඒ සංවර්ධන විභවතා අනුව ගොඩ නැගුනු කලාපීකරණයන්ට අනුව යක්කල උප නගරය අධි ඝනත්ව වාණිජ කලාපයක් ලෙසට සහ වැලිවේරිය නගරය කෘෂි නිෂ්පාදන පදනම් කර ගත් මධ්‍යම ඝනතව කර්මාන්ත කලාපයක් ලෙස සහ සේවා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන අතර ඒ අතර මැද ගොඩ නැගී වර්ධනය වන මිරිස්වත්ත සහ බැලුම්මහර මංසන්ධීන් මේ එක් එක් සේවා මධ්‍යස්ථාන සහ චන්ද්‍රිකා නගර අතර පිහිටි පොකුරු නගර (Cluster Townships) ලෙස වර්ධනය වන අතර මෙම යක්කල , වැලිවේරිය, මිරිස්වත්ත සහ බැලුම්මහර යන චන්ද්‍රිකා උප නගර සහ ප්‍රධාන මංසන්ධීන් දෙවන ප්‍රමුඛතා මට්ටමට අයත් උප නගර හා මංසන්ධීන් ලෙස මෙම සංවර්ධන සැලැස්ම තුළ හඳුනාගෙන ඇත.

එසේම, කුඩා මංසන්ධීන් ලෙස ක්‍රියාත්මක වන කොළඹ - නව නුවර පාරේ පිහිටි රත්නපස්වල මංසන්ධිය , කොළඹ- නුවර ප්‍රධාන මාර්ගයේ පිහිටි කිරිල්ලවල මංසන්ධිය සහ ගම්පහ- යක්කල මාර්ගයේ පිහිටි ඉඳිගොල්ල මංසන්ධිය, ගම්පහ - ජා ඇළ මාර්ගයේ පිහිටි මාකෙවිට මංසන්ධිය තෙවන ප්‍රමුඛතා මංසන්ධීන් ලෙසත්, බුළුගහගොඩ, කළුවල මංසන්ධිය සිව්වන මට්ටමේ මංසන්ධීන් ලෙසත් හඳුනාගෙන ඇත.

වගුව 6.1. ප්‍රමුඛතා මට්ටම අනුව නාගරික මධ්‍යස්ථාන ධුරාවලිය

| නගරය/ මංසන්ධිය | ප්‍රමුඛතා මට්ටම |
|---|---|
| ගම්පහ | පළමු ප්‍රමුඛතාවය |
| ගනේමුල්ල | |
| යක්කල | දෙවන ප්‍රමුඛතාවය |
| මිරිස්වත්ත | |
| බැලුම්මහර | |
| වැලිවේරිය | |
| ඉඳිගොල්ල | තෙවන ප්‍රමුඛතාවය |
| රත්නපස්වල | |
| කිරිල්ලවල | |
| මාකෙවිට | |
| කළුවල හංදිය | සිව්වන ප්‍රමුඛතාවය |
| බුළුගහගොඩ | |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023

ඉහත වගුව 6.3 මඟින් දක්වා ඇති ප්‍රමුඛතා මට්ටම අනුව නාගරික මධ්‍යස්ථාන ධුරාවලිය සිතියම 6.3 මඟින් නිරූපණය කර ඇත..

*සිතියම 6.3 : යෝජිත ප්‍රමුඛතා මට්ටම අනුව නාගරික මධ්‍යස්ථාන ධුරාවලිය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, බ.ප අ - නා.සං.අධි. 2023

### 6.3.1.2. අධ්‍යාපන පහසුකම්

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ, එනම් ගම්පහ මහනගර සභා බල සීමාව හා ගම්පහ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සමාජීය අපරව්‍යුහ පහසුකම් යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පහසුකම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී, පාසල් වර්ගීකරණය තුළ ජාතික හා පළාත් සභා පාසල් ඇතුළු මුළු පාසල් 48 ක් පවතී. එම සියලුම පාසල්වල පරිපාලනමය කටයුතු ගම්පහ අධ්‍යාපන කොට්ඨාශය යටතේ සිදු වේ. මෙහි එක් බාලක පාසලක් සහ බාලිකා පාසල් 3 ක් ද, මිශ්‍ර පාසල් 44 ක් සමඟ මුළු පාසල් 48ක් පවතී. ඉගෙනුම ලබන මාධ්‍ය වශයෙන් සිංහල මාධ්‍ය පාසල් 41 ක් ද , සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය පාසල් 7 ක් ද ලෙස වර්ගීකරණය කළ හැක. එපමණක් නොව මේ වන විට ප්‍රදේශයේ අර්ධ රාජ්‍ය පාසල් 02ක් ඇතුළුව පුද්ගලික හා ජාත්‍යන්තර පාසල් 10ක් පමණ දක්නට ලැබේ.

පූර්ව ළමාවිය සංවර්ධනය කිරීමේ ආයතන 141 ක් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ මේ වන විටත් ලියාපදිංචි වී ඇති අතර එය නේවාසික ජනගහනයෙන් පුද්ගලයන් 2500කට එක් මධ්‍යස්ථානයක් යන සම්මතයට අනුකූල වුවහොත් වර්‍තමාන හා අනාගත අවශ්‍යතා මේ වන විටත් ප්‍රදේශය තුළ සපුරා ඇති බව පැහැදිලි වේ. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ වසරකට ප්‍රාථමික අධ්‍යාපනය සඳහා යොමු වන ප්‍රමාණය 2018 වර්ෂයේ දත්ත වලට අනුකූලව 2479 ක් පමණ වන අතර ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අවශ්‍ය කෙරෙන පාසල් වල පිහිටීම මූලිකවම ප්‍රදේශයේ වර්තමාන හා අනාගත ජනගහනයට සාපේක්ෂව ප්‍රශස්ත මට්ටමක පවතින බව ප්‍රාථමික පාසල් සේවා ප්‍රදේශ විශ්ලේෂණය අනුව සනාථ වේ. එම විශ්ලේෂණය සඳහා කිලෝ මීටර එකක පරිධියක් සහිත සේවා ප්‍රදේශයක් ආවරණය කර ඇත.

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ පිහිටි ද්විතීක අධ්‍යාපන ආයතනවල පිහිටීමේ සිට කිලෝමීටර තුනක පරිධියක් යටතේ සිදු කළ සේවා ප්‍රදේශ විශ්ලේෂණය අනුව ප්‍රදේශයම ආවරණය වන පරිදි ද්විතීක අධ්‍යාපන පහසුකම්හි ව්‍යාප්ත වීම හඳුනාගෙන ඇත. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ වත්මන් ජනගහනය 237,000ක් පමණ වාර්තා වී ඇති අතර අධ්‍යාපන අමාත්‍යංශයේ දත්ත අනුව වාර්තා වී ඇති පාසල් අධ්‍යාපන ජනගහනය 46,131 කි. එය ප්‍රතිශතයක් ලෙස ප්‍රදේශයේ නේවාසික ජනගහනයෙන් 19% ක් වන අතර 2033 වන විට අපේක්ෂිත ජනගහනයෙන් 64,790 ක පාසල් අධ්‍යාපන ජනගහනයක් අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව සිතියම 6.4 හි දැක්වෙන ලෙස පවතින ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපන පහසුකම් සහ ඒවායේ සේවා ප්‍රදේශ යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ වත්මන් හා අනාගත අවශ්‍යතා උදෙසා අධ්‍යාපන පහසුකම් ප්‍රශස්ත මට්ටමක පවතින බව තහවුරු කළ හැකි අතර පාසල් සඳහා පවතින පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

*සිතියම 6.4 : පාසල් අධ්‍යාපන පහසුකම් සහ ඒවායේ සේවා ප්‍රදේශ විශ්ලේෂණය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, බ.ප අ - නා.සං.අධි. 2022

### 6.3.1.3. සෞඛ්‍ය පහසුකම්

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ පවතින සෞඛ්‍ය පහසුකම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී, ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල ප්‍රධාන සේවාවක් සපයයි . එහි වාට්ටු 20 ක් සහ ඇඳන් 825 ක ධාරිතාවයක් පවතින අතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2022 වර්ෂයේ දත්ත අනුව එම වසර තුළ බාහිර රෝගීන් 322,000 කටත්, අභ්‍යන්තර රෝගීන් 110,500 කටත් සේවා සපයා ඇත.

එසේම, ගම්පහ දිස්ත්‍රික්කයේ රාගම පිහිටි ලංකාවේ ප්‍රධාන රෝහලක් වන උතුරු කොළඹ ශික්ෂණ රෝහල (CNTH) ගම්පහ නගරයේ සිට කිලෝමීටර 15 ක පමණ දුරකින් පිහිටා ඇති අතර එම ජාතික රෝහල තුළින්ද මෙම ප්‍රදේශයේ නේවාසික ජනගහනය විසින් සෞඛ්‍ය සේවා පහසුකම් ලබා ගනී. ඒ අනුව, සෞඛ්‍ය පහසුකම් පිළිබඳ සැලසුම්මය මැදිහත්වීම පිළිබඳ සොයා බැලීමේදී, රජයේ දිස්ත්‍රික් මහ රෝහල් සහ ජාතික රෝහල් වල සිට අවම සේවා පරිධිය නිරීක්ෂණය කිරීමේදී, දිස්ත්‍රික් මහ රෝහලක් වන ගම්පහ රෝහලෙහි කිලෝමීටර 05ක සේවා පරිධිය තුළින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 90% ක ප්‍රමාණයකට වැඩි ප්‍රතිශතයක් ආවරණය වන අතර ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහළ කොටසේ පිහිටා ඇති ගනේමුල්ල, බුළුගහගොඩ යන ප්‍රදේශයන් ඇතුළු සෙසු ප්‍රදේශයන් ජාතික රෝහලක් වන රාගම ශික්ෂණ රෝහලේ සිට කිලෝමීටර 10 ක සේවා ප්‍රදේශ පරිධියෙන් ආවරණය වෙයි. වැලිවේරිය උප නගරය තුළ රජයේ ප්‍රාථමික ප්‍රතිකාර ඒකකයක් පවත්වාගෙන යයි. ඒ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ රජයේ නව රෝහලක් ඇති කිරීමේ අවශ්‍යතාවයක් නොමැති වුවද පවතින රජයේ රෝහලෙහි අවශ්‍ය සංවර්ධනයන් හඳුනාගෙන සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙයට අමතරව ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ද පවතින අතර මෙම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් ගම්පහ ප්‍රාදේශීය කොට්ඨාශ බල ප්‍රදේශය අවරණය වන පරිදි මාතෘ සහ ළදරු සායන පවත්වයි. ඊට අමතරව, මේ වන විට ප්‍රදේශයේ විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික් රෝහල අවට ප්‍රදේශ වල සහ රාගම ශික්ෂණ රෝහලත් සමඟ පෞද්ගලික රෝහල් සහ රසායනාගාර පර්ෂදයක් දක්නට ලැබෙන අතර ප්‍රදේශය ආවරණය කරමින් පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන පිහිටා ඇත. එසේම ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී, ගම්පහ යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල ස්ථාපිතව ඇති අතර එහි වාට්ටු 4 ක් ඇඳන් 107ක ධාරිතාවයක් පවතින අතර දිනකට බාහිර රෝගීන් 200 කට පමණ සහ දිනකට නේවාසික රෝගීන් 03 නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුලත් කරගනු ලබයි .

ඒ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින සෞඛ්‍ය සේවා පහසුකම් විශ්ලේෂණය සිතියම පහතින් දක්වා ඇත.

*සිතියම 6.5 : සෞඛ්‍ය පහසුකම් සහ ඒවායේ සේවා ප්‍රදේශ විශ්ලේෂණය*




සැකසුම : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, බ.ප අ - නා.සං.අධි.

### 6.3.2. මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම

#### 6.3.2.1. මාර්ග සහ ප්‍රවාහන සැලැස්මක වැදගත්කම

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවාහන මාර්ග හතෙන් එකක් වන කොළඹ - නුවර මාර්ගය හරහා වැටී ඇති ඉතා විශිෂ්ට ජාතික සහ කලාපීය මාර්ග සම්බන්ධතාවයන් සහිත ප්‍රදේශයක් ලෙස සඳහන් කළ හැක. එසේම කලාපීය වශයෙන් වැදගත් මහා මාර්ග රැසක් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා ගමන් කරයි. ඒ අතර ජා- ඇල - ඒකල - යක්කල මාර්ගයද , නව නුවර මාර්ගයද , ගම්පහ - මිනුවන්ගොඩ මාර්ගයද, ගනේමුල්ල - රාගම මාර්ගයද, ගනේමුල්ල - කඩවත මාර්ගය ද වැදගත් වේ. එසේම ගම්පහ ප්‍රදේශය තුල එකින් එක සම්බන්ධ වූ ප්‍රාදේශීය මාර්ග ජාලයක්ද පවතින අතර ගම්පහ නගර මධ්‍යය තුල පදිකයන්ගේ ඇවිදීමේ හැකියාව වැඩි කළ හැකි කොටු මාර්ග ජාලයක්ද (Grid Pattern Road Network) පිහිටා ඇත. ඒ අනුව ඉහළ නේවාසික ජනගහනයක් ජීවත් වන හා වැඩි නේවාසික ඉල්ලුමක් පවතින මෙම ප්‍රදේශය තුළ ජනතාවට පහසුවෙන් ගමනාගමනය සිදු කල හැකි අන්දමින් හා ගමනාගමනයේදී දැනට පවතින ගැටළු මග හරවා ගනිමින් ඒවාට තිරසාර විසඳුම් ලබා දීම මාර්ග හා ප්‍රවාහන සැලැස්මක් සෑදීමේ මූලික අරමුණ වේ.

#### 6.3.2.2. මහා මාර්ග සංවර්ධන තීර සහ මාර්ග ධූරාවලිය

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව තුළ අපේක්ෂිත සංකල්පිත සැලැස්මට අනුව මව් නගරය එනම් ගම්පහ නගර මධ්‍යය ගමනාගමනය මුල් කර ගත් නගරයක් ලෙස සංවර්ධනය වන අතර ගනේමුල්ල, යක්කල, වැලිවේරිය යන චන්ද්‍රිකා නගර පිළිවෙලින් නේවාසික චන්ද්‍රිකා නගර (Domitory Satellite Township), වාණිජ චන්ද්‍රිකා නගරය (Business Satellite Township) , සේවා චන්ද්‍රිකා නගර (Service Satellite Township) ලෙස සංවර්ධනය කිරීම යෝජිත අතර එහිදී අපරවයුහ පහසුකම් යටතේ එන මාර්ග සංවර්ධන සැලැස්ම විශේෂ තැනක් ගනී. විශේෂයෙන්ම රථවාහන ප්‍රමුඛතා මාර්ග සඳහා වැඩි ඉඩ කඩක් වෙන් වන අප රට තුළ මාර්ග පද්ධති සැකසීමේදී පදිකයන් සඳහාද ප්‍රමුඛතාවය දීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව එක් එක් මාර්ගයන්ගේ ප්‍රමුඛතාවය අනුව එම මාර්ග වල රථවාහන මංතීරු, පදික මංතීරු හා සේවා කලාප වෙන්විය යුතු ආකාරය පිළිබඳව උපාය මාර්ග ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති පිළිබඳ විස්තර කිරීම් වලදී දක්වා ඇත. පහත දක්වා ඇති ප්‍රමුඛතා ලැයිස්තුව පරිදි ඒ ඒ මාර්ග වලට අදාළ යෝජිත පළල අටවන පරිච්ඡේදය තුළදී විස්තරාත්මකව දක්වා ඇත. එසේම මධ්‍යම අධිවේගී මාර්ගය හා යෝජිත ගම්පහ අන්තර් භුවමාරුව මෙන්ම දුම්රිය සේවා අන්තර්ග්‍රහණය කරමින් යෝජිත ප්‍රවාහන සැලසුම් හා අපරවයුහ ව්‍යාපෘති පිලිබදව මෙම පරිච්ඡේදයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම යටතේ දක්වා ඇත.

*වගුව 6.2 : මහාමාර්ග ප්‍රමුඛතාකරණය*

| මාර්ග කාණ්ඩය | මාර්ගයේ නම |
|---|---|
| පළමුවන ප්‍රමුඛතාවය | A 01 කොළඹ - නුවර මාර්ගය<br>A 33 ජා ඇල - ඒකල මාර්ගය |

| | |
|---|---|
| දෙවන ප්‍රමුඛතාවය | B 12 - අලුත්ගම - විගඩ මාර්ගය<br>B 58 - කඩවත - ගනේමුල්ල මාර්ගය (බියන්විල - ගනේමුල්ල)<br>B 161 - ඉඹුල්ගොඩ - වැලිවේරිය මාර්ගය<br>B 214 - වැලිවේරිය - ගම්පහ මාර්ගය (කැළණිය - මුදුන්ගොඩ)<br>B 225- කිරිඳිවිට -අස්සැන්නවත්ත මාර්ගය<br>B 226 - කිරිඳිවිට - ගනේමුල්ල මාර්ගය<br>B 288 - මිනුවන්ගොඩ-ගම්පහ - මිරිස්වත්ත මාර්ගය (නව මිනුවන්ගොඩ - ගම්පහ)<br>B 292 - මිරිස්වත්ත - වතුරගම මාර්ගය<br>B 472 - වැලිවේරිය - කිරිඳිවැල මාර්ගය<br>B 479 - යක්කල - රදාවාන මාර්ගය<br>B 569 - මේරිබිසෝ මාවත (ගම්පහ දුම්රියපොළ පිවිසුම් මාර්ගය)<br>B 570 - ඔරුතොට මාර්ගය (මුදුන්ගොඩ - ගම්පහ)<br>උසාවි පාර<br>බෞද්ධාලෝක මාවත<br>මිනුවන්ගොඩ- ගම්පහ පරණ මාර්ගය |
| තෙවන ප්‍රමුඛතාවය | අළුත්ගම - කොස්හේන<br>බදුවතුගොඩ - කරණැකමුල්ල<br>බණ්ඩාරවත්ත- මිරිස්වත්ත<br>බණ්ඩාරවත්ත- ඉහලගම<br>බොල්ලත පල්ලිය පාර<br>ගලහිටියාව - කුඩාබොල්ලත<br>ගණේමුල්ල - බටුවත්ත<br>ගණේමුල්ල - බුළුගහගොඩ<br>ගොඩගෙදර පන්සල පාර<br>හොරගොල්ල - මාකිලංගමුව<br>ඉහලයාගොඩ අළුත්පාර<br>ඉඹුල්ගොඩ -පහලයාගොඩ<br>ඉඹුල්ගොඩ - ගණේමුල්ල<br>ඉදිගොල්ල - මෝරුපල<br>ඉඹුල්ගොඩ - ඉහලයාගොඩ - මොරගොඩ<br>ජා ඇල - හොරගොල්ල |

| | |
|---|---|
| | කදාන -ගණේමුල්ල<br>කසගහවත්ත - ඉහලගම<br>නැදුන්ගහහේන - ඇඹරළුව<br>පහලගම- රත්මල්විට- මාකිලංගමුව<br>පරකන්දෙනිය - හෙට්ටිකන්ද<br>පරකන්දෙනිය - කොස්සින්න - ගණේමුල්ල<br>පෙරේරා මාවත<br>ඌරුවල - වැලිවේරිය<br>වැලිගම්පිටිය - ගණේමුල්ල<br>යාගොඩ - තොණ්ඩුව<br><br>උසාවි පාර<br>බෞද්ධාලෝක මාවත<br>ශ්‍රී සරණංකර මාවත<br>මංගල මාවත<br>මාර්කට් වීදිය<br>මහ වීදිය<br>සිරිකුරුස පාර (Y.M.B.A මාර්ග 02 )<br>විද්‍යාල මාවත (යසෝදරා දේවී බා.ම.වි විද්‍යාලය අසල)<br>නන්දන මාවත<br>ආනන්ද මාවත<br>කල්‍යාණී මාවත<br>ශ්‍රී බෝධි මාවත<br>හංසගිරි පාර<br>පල්ලිය පාර (මොරගොඩ සිට ගම්පහ) |
| සිව්වන ප්‍රමුඛතාවය | ප්‍රාදේශීය සභා මාර්ග හා මහා නගර සභා මාර්ග |
| පස්වන ප්‍රමුඛතාවය | වෙනත් මාර්ග |

### 6.3.3. ජල සැපයුම් සැලැස්ම

නගරයක් සඳහා ජල සැපයුම් සැලසුමක් අවශ්‍ය වන්නේ, එම නගරයේ ජනතාවට පවතින ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ පරිසරය, ආර්ථිකය සහ සෞඛ්‍යය මට්ටම් රැකගෙන ජලයේ පරිභරණය කළමනාකරණය කිරීම සඳහාය. එබැවින් ජල සැපයුම් සැලැස්ම මඟින් වත්මන් හා අනාගත පුරවැසියන් සඳහා අඛණ්ඩ සෞඛ්‍යාරක්ෂිත ජල සැපයුමක් ලබා දීමට අපේක්ෂා කෙරේ. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් අනුගමනය කරනු ලබන පිළිගත් ප්‍රමිතීන් වලට අනුව වර්තමාන සහ අනාගත නේවාසික ජනගහනය උපයෝගී කොටගෙන ඒ ඒ සංවර්ධන කලාප වලට අනුරූපව වත්මන් ජල අවශ්‍යතාවය සහ අනාගත ජල අවශ්‍යතාවය පහත පරිදි ගණනය කොට ඇත.

*වගුව 6.3: ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවතින හා අනාගත ජල ඉල්ලුම*

| යෝජිත සංවර්ධන කලාපය | 2023 වර්ෂයේ නේවාසික ජනගහනය | 2023 වර්ෂයේ මුළු ජල ඉල්ලුම (ML/D) | 2033 සඳහා යෝජිත ජනගහනය | 2033 වර්ෂයේ මුළු ජල ඉල්ලුම (ML/D) |
|---|---|---|---|---|
| අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1) | 4130 | 0.74 | 15000 | 2.69 |
| අධි ඝනත්ව ආයතනික කලාපය (I1 ) | 19423 | 3.48 | 30000 | 5.38 |
| අධි ඝනත්ව නේවාසික කලාපය (R1) | 10156 | 1.82 | 25000 | 4.48 |
| අධි ඝනත්ව වාණිජ කලාපය (C1) | 18006 | 3.23 | 25000 | 4.48 |
| මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) | 5041 | 0.90 | 7000 | 1.25 |
| මධ්‍යම ඝනත්ව සංචාරක කලාපය (T2) | 2007 | 0.36 | 3000 | 0.53 |
| මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2) | 9802 | 1.75 | 15000 | 2.69 |
| එකතුව | **68,565** | **12.30** | 120,000 | **21.52** |

*වගුව 6.4 : ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින හා අනාගත ජල ඉල්ලුම*

| යෝජිත සංවර්ධන කලාපය | 2023 වර්ෂයේ නේවාසික ජනගහනය | 2023 වර්ෂයේ මුළු ජල ඉල්ලුම (ML/D) | 2033 සඳහා යෝජිත ජනගහනය | 2023 වර්ෂයේ මුළු ජල ඉල්ලුම (ML/D) |
|---|---|---|---|---|
| අඩු ඝනත්ව නේවාසික කලාපය (R3) | 19113 | 3.42 | 25000 | 4.48 |
| අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1) | 35275 | 6.32 | 50000 | 8.97 |
| මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) -II | 13676 | 2.45 | 15000 | 2.69 |
| මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) -I | 23036 | 4.13 | 15000 | 2.69 |
| අධි ඝනත්ව නේවාසික කලාපය (R1) | 20865 | 3.74 | 40000 | 7.17 |
| මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2) | 32415 | 5.81 | 50000 | 8.97 |
| මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය (In 2) | 24737 | 4.43 | 35000 | 6.27 |
| එකතුව | **169,117** | **30.33** | 230,000 | **41.26** |

එසේම ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ ආයතනික සැලැස්ම (Cooperate Plan ) - 2020-2025 අනුව කැලණි දකුණු ගංඉවුර (KRB II) ජල සැපයුම් ව්‍යාපෘතියේ දෙවන අදියර - උතුරු කොළඹ සහ ගම්පහ කලාපයේ කාර්මික

කලාප සහ වේගයෙන් සංවර්ධනය වන නාගරික ප්‍රදේශවල වාසය කරන 1.5 මිලියනකට අධික පුද්ගලයන්ට දිනකට ජල සැපයුම් කිරීමට අපේක්ෂිතය. එසේම ගම්පහ මිනුවන්ගොඩ ජල සැපයුම් ව්‍යාපෘතිය (GAMISP) මඟින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ජල අවශ්‍යතාවයෙන් සැලකියයුතු ප්‍රමාණයක් ආවරණය වේ.

එසේම දිස්ත්‍රික්කයක් ලෙස සලකා බැලීමේදී ගම්පහ දිස්ත්‍රික්කය සඳහා දැනට 49.8% ක ජල සැපයුම් ආවරණයක් ලැබෙන අතර 2025 වර්ෂය වන විට එය 88.3% දක්වා වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

*රූප සටහන 6.1: 2030 වර්ෂය වන විට ක්‍රියාත්මක වන සහ ක්‍රියාත්මක වීමට යෝජිත ජල සැපයුම් යෝජනා ක්‍රම*




Ongoing & Proposed Water Supply Schemes facilitated by 2030 in Gampaha District

මූලාශ්‍රය: ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය, 2019

### 6.3.4. විදුලි සැපයුම් සැලැස්ම

විධිමත් විදුලි සැපයුම එදිනෙදා මිනිස් ජීවිතයට අත්‍යවශ්‍ය වන සම්පතක් වන අතර විශේෂයෙන් ම සිසුයෙන් දියුණුවන තාක්ෂණික සමාජයක, ප්‍රමාණවත් විදුලි සැපයුම අත්‍යවශ්‍ය අංගයකි. අඛණ්ඩ විදුලි සැපයුමක් මඟින් එදිනදා මිනිස් ජිවිතයේ සංකීර්ණතාවය අවම කර ගැනීමට පහසු වන අතරම සන්නිවේදනය, කර්මාන්තශාලා සහ සෞඛ්‍ය සේවා ඇතුළු ක්ෂේත්‍ර රැසක පැවැත්මට අත්‍යවශ්‍ය මූලික ශක්ති ප්‍රභවයකි . විදුලි බල අවශ්‍යතාවය නිසි ආරක්ෂාකාරී සැපයුමකින් හා පවත්නා අවස්ථාවන්ට ගැලපෙන ලෙස කළමනාකරණය කිරීම ආර්ථික සංවර්ධනයෙහි ලා ඉතා වැදගත් වේ.

දැනට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ විදුලි සැපයුමෙන් 98% ක් ජාතික විදුලිබල පද්ධතිය - 220kV මඟින් ආවරණය වුවද අනාගත විදුලි බල ඉල්ලුම සළකා සහ තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමෙහිලා විකල්ප බලශක්තීන් වෙත නැඹුරු වීම ඉතා වැදගත් වේ. ඒ අනුව ප්‍රාදේශීය වශයෙන් විකල්ප බලශක්තීන් ලෙස ක්‍රියාත්මක කිරීමට ඉහල විභවතාවක් පවතින ප්‍රජා මූලික බලශක්ති උත්පාදන ව්‍යාපෘතියක් ලෙස සූර්ය පැනල ව්‍යාපෘතීන් හඳුනා ගත හැකි අතර ජාතික ප්‍රතිපත්තියක් යටතේ ගෘහ, ආගමික ස්ථාන, හෝටල්, වාණිජ ආයතන සහ කර්මාන්තවල වහල මත සූර්ය බලාගාර (Solar Power) ඇති කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මඟින් රටේ දෛනික විදුලි බල උත්පාදනයට විශාල දායකත්වයක් ලබා දිය හැකි අතර ආර්ථික වාසි රැසක් එමඟින් ළඟා කරගත හැක.

එසේම කෘෂිකාර්මික අපද්‍රව්‍ය, වගා ඉතිරි කැබලි සහ දැව මඟින් ජෛව ස්කන්ධ ශක්තිය යොදා ගනිමින් කුඩා පරිමාණ විදුලි බලාගාරවලට යොදාගත හැකි අතර එය පරිසර හිතකාමී පිළිවෙතක් ද වේ. රට අමතරව අපද්‍රව්‍ය බලශක්තියක් (Waste to Energy ) ලෙස භාවිත කිරීමේ විභවතාවක් පවතින අතර දැනටමත් ගම්පහ මහා නගර සභාව විසින් හා ගම්පහ ප්‍රාදේශීය සභාව විසින් කෙරවළපිටිය අපද්‍රව්‍ය බලශක්ති බලාගාරය වෙත කසල යවනු ලබයි.

ඒ අනුව ගම්පහ ප්‍රදේශය තුළ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි ඉහත බලශක්ති විභවතාවන් අවශ්‍ය ආයතනික රාමුවක් තුළ ජාතික ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කිරීම තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමෙහි ල ඉතා වැදගත් වේ.

### 6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම

නාගරික ප්‍රදේශවල සෞඛ්‍යය, සනීපාරක්ෂාව සහ තිරසාර බව පවත්වා ගැනීම සඳහා අපද්‍රව්‍ය සහ අපජල පවිත්‍රාගාර තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. නගර වර්ධනය වන විට, කුටුම්භ, කර්මාන්ත සහ වාණිජ ආයතන මගින් ජනනය වන අපජල පරිමාව වැඩි වන අතර, ඵලදායී පිරිපහදු කිරීම අත්‍යවශ්‍ය වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සකස් කරන ලද “2021-2030 සනීපාරක්ෂක ප්‍රධාන සැලැස්මට” අනුව ප්‍රමුඛතා ලැයිස්තුගත නගර 20 ක් සඳහා ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර ගම්පහ නගරය එම ව්‍යාපෘති අතර වේ. ඒ සඳහා ගම්පහ නගරය ආසන්නයේ අක්කර 3-5ක පමණ ඉඩමක් අවශ්‍ය වන අතර මේ දක්වා ඒ සඳහා සුදුසු ඉඩමක් සොයා ගැනීම දුෂ්කර වී ඇත. කෙසේ වෙතත් ශීඝ්‍ර නාගරීකරණය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වන අතර ඒ සඳහා සුදුදු භූමියක් තෝරාගැනීමේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පහත සඳහන් නිර්නායක ඉදිරිපත් කර ඇත.

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුළු බිම් ප්‍රමාණය - අක්කර 3 සිට 5 දක්වා
- ආවරණ කලාපය තුළ පිහිටා තිබිය යුතුය.

- අපවහන බැහැර කරන ස්ථානයකට ආසන්නව පිහිටා තිබිය යුතුය
- ගංවතුරට ගොදුරු නොවන ස්ථානයක පිහිටා තිබිය යුතුය
- අධික ජනාකීර්ණ ප්‍රදේශවලින් වෙන් විය යුතුය

එසේම මෙම ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන රූප සටහන් අංක 6.2 මඟින් දැක්වෙන ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 21 ක් ආවරණ කිරීමට බලාපොරොත්තු වන අතර පහත වගු අංක 6.5 දැක්වෙන පරිදි සැලසුම් කටයුතු සිදුකර ඇත.

*රූප සටහන 6.2 : ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ ආවරණය කිරීමට අපේක්ෂිත ග්‍රාම නිලධාරී කොට්ඨාශ*




මූලාශ්‍රය: ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, 2021

*වගුව 6.5 :අපේක්ෂිත පිරිපහදු පරිමාව*

| | |
|---|---|
| ව්‍යාපෘති ආවරණ ප්‍රදේශ | ගම්පහ මහ නගර සභාව - ග්‍රා.නි.කො 21 |
| පිරිපහදු බලාගාරයේ ධාරිතාව | 15,000 m3/දිනකට |
| පොම්පාගාර ගණන | 17 |
| නල ජාල වල දිග | ගුරුත්වාකර්ෂණ ජාලයේ දිග (Gravity Mains) -30 km |
| | රයිඩර් මේන්ස් (Rider Mains) -61 km |
| | පොම්ප කිරීමේ ජාලය (Pumping Mains) - 6 km |

මූලාශ්‍රය: ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, 2021

### 6.3.6. කසළ කළමනාකරණ සැලැස්ම

පිරිසිදු, සෞඛ්‍ය සම්පන්න සහ තිරසාර නාගරික පරිසරයක් පවත්වා ගැනීම සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. රෝග පැතිරීම වැළැක්වීම, සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සහ ජලයෙන් බෝවන රෝග වැනි අපද්‍රව්‍ය සමුච්චය වීම හා සම්බන්ධ අවදානම් අවම කිරීම මගින් මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා එය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. පාරිසරික වශයෙන්, එය වාතය, ජලය සහ පාංශු දූෂණය අවම කිරීමට උපකාරී වේ, ගොඩකිරීම් වලින් (Land Filling) වන මීතේන් විමෝචනය අවම කරයි, සහ අනතුරුදායක අපද්‍රවය වලින් පරිසර පද්ධති ආරක්ෂා කරයි.

ආර්ථික වශයෙන්, නිසි අපද්‍රව්‍ය කළමනාකරණය රැකියා උත්පාදනය කිරීමටත්, නාගරික නඩත්තු වියදම් අඩු කිරීමටත් ප්‍රතිචක්‍රීකරණය සහ හරිත කර්මාන්ත සඳහා ආයෝජන ආකර්ෂණය කිරීමටත් ඉවහල් වේ. එසේම ප්‍රතිචක්‍රීකරණය, ද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සහ කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීම මගින් සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය කරනු ලැබේ. එසේම කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය නගර පිරිසිදුව තබා ගැනීම, නීතිවිරෝධී ලෙස බැහැර කිරීම වැළැක්වීම සහ නාගරික ආකර්ෂණය වැඩි දියුණු කිරීම, ඉහළ දේපළ වටිනාකම් සහ ව්‍යාපාරික අවස්ථා වැඩි කිරීමට හේතු වේ. තවද අපද්‍රව්‍ය රෙගුලාසිවලට අනුකූල වීම නගර නීතිමය ප්‍රමිතීන්ට අනුකූල වීම සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වැනි ගෝලීය තිරසාර ඉලක්ක සඳහා දායක වීම සහතික කරනු ලැබේ.

ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හරිත හා වඩා තිරසාර අනාගතයක් සහතික කරන අතරම සෞඛ්‍ය සම්පන්න, වඩා ජීවත්විය හැකි සහ ආර්ථික වශයෙන් ජවසම්පන්න නගර ගොඩනැගීමේ ප්‍රධාන සාධකයකි.
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වර්තමාන ඝන අපද්‍රවය ජනනනය වීම පහත පරිදි දැක්විය හැක.

*වගුව 6.6 :ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජනනය වන කසල ප්‍රමාණය*

| ජනගහනය | දිනකට ජනනය වන ඒක පුද්ගල කසළ ප්‍රමාණය (Kg) | දිනකට ජනනය වන මුළු කසළ ප්‍රමාණය (ටොන්) | දිනකට කසළ එකතු කිරීම (ටොන්) |
|---|---|---|---|
| ගම්පහ මහ නගර සභා සීමාව | 0.75 | 51.6 | 25 – 30 |
| ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව | 0.4 | 62.9 | 15 – 20 |
| එකතුව | | 106 | 40 |

මූලාශ්‍රය: ගම්පහ මහා නගර සභාව / ගම්පහ ප්‍රාදේශීය සභාව , 2021

තවද 2033 වර්ෂය වන විට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජනනය වන කැලිකසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 130 - 150 ත් අතර ප්‍රමාණයක් පමණ වන බව ගණනය කිරීම් සිදුකර ඇත. ගම්පහ මහා නගර සභාව හා ගම්පහ ප්‍රාදේශීය සභාව තුළ දැනටමත් කසල කළමනාකරණය කරීමේ යාන්ත්‍රණයක් පැවතියද කසල එකතු කොට වෙන් කිරීම සඳහා නිශ්චිත භූමියක් නොමැති වීම ගැටළුවක් වන අතර ඒ සඳහා සුදුසු භූමියක් යෝජනා කිරීම අත්‍යාවශ්‍ය වේ.

ඝන අපද්‍රවය කළමනාකරණ සැලැස්ම පිළිබඳ සලකා බැලීමේදී 4R (Reduce, Reuse, Recycle, Recover) සංකල්පය මඟින් 60% ක් ද , Waste to energy මගින් 30% ක් ද land filling මඟින් 10% ප්‍රමාණයක්ද කළමනාකරණය කිරීමට අපේක්ෂා කරයි.

ඒ අනුව 4R ක්‍රමය මඟින් පහත පරිදි කසල ජනනය වීම අවම කරගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග නිසි ප්‍රතිපත්ති රාමුවක් තුළ ක්‍රියාත්මක කළ හැක.

*වගුව 6.7 : 4R සංකල්පය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය*

| 4R සංකල්පය | ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය |
|---|---|
| 1. අවම කිරීම (Reduse) (අපද්‍රව්‍ය ජනනය අවම කිරීම) | ▪ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් - තනි භාවිත ප්ලාස්ටික්, ආහාර අපද්‍රව්‍ය සහ අධික ඇසුරුම් අඩු කිරීම පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම.<br>▪ පරිසර හිතකාමී ප්‍රතිපත්ති - ප්ලාස්ටික් බෑග් තහනම් කිරීම හෝ බදු පැනවීම, ජෛව හායනයට ලක්විය හැකි ඇසුරුම් භාවිතා කිරීමට ව්‍යාපාර දිරිමත් කිරීම.<br>▪ හරිත ප්‍රසම්පාදනය (Green Procument) - රජයේ සහ ආයතනික මිලදී ගැනීම් වලදී තිරසාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.<br>▪ සුහුරු නගර සැලසුම් කිරීම (Smart City) - ඇසුරුම් අපද්‍රව්‍ය අඩු කිරීම සඳහා තොග මිලදී ගැනීම් සහ නැවත පිරවුම් ස්ථාන ((Refilling Station) දිරිමත් කිරීම. |
| 2. නැවත භාවිතා කිරීම (Reuse) (නිෂ්පාදනවල ආයු කාලය දීර්ඝ කිරීම) | ▪ නැවත භාවිතා කළ සාප්පු සහ අලුත්වැඩියා මධ්‍යස්ථාන (Second-Hand Shops & Repair Centers ) - ඉලෙක්ට්‍රොනික උපකරණ, ගෘහ භාණ්ඩ සහ ඇඳුම් සඳහා සකසුරුවම් ගබඩා සහ අලුත්වැඩියා සේවා ප්‍රවර්ධනය කිරීම.<br>▪ ප්‍රජා හුවමාරු අවස්ථා ප්‍රචලිත කිරීම (Community Swap Events) - පුරවැසියන්ට භාවිතා කළ අයිතම හුවමාරු කර ගත හැකි ස්ථාන සංවිධානය කිරීම.<br>▪ නැවත පිරවීමේ සහ ආපසු ලබා දීමේ පද්ධති - ඉවත දැමිය හැකි ඇසුරුම් අඩු කිරීම සඳහා ජලය, ඩිටර්ජන්ට් සහ සිල්ලර බඩු වැනි ද්‍රව්‍ය සඳහා නැවත පිරවීමේ ස්ථාන දිරිමත් කිරීම.<br>▪ නැවත භාවිතා කළ හැකි පොදු යටිතල පහසුකම් - බෝතල් කළ ජල භාවිතය අඩු කිරීම සඳහා පානීය ජල පහසුකම් ස්ථාපනය කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීම. |
| 3. ප්‍රතිචක්‍රීකරණය (Recycle) (අපද්‍රව්‍ය මගින් නව ද්‍රව්‍ය නිෂ්පාදනය) | ▪ කාර්යක්ෂම අපද්‍රව්‍ය වෙන් කිරීම - කඩදාසි, ප්ලාස්ටික්, වීදුරු, ලෝහ සහ කාබනික අපද්‍රව්‍ය සඳහා වර්ණ කේතනය කළ බඳුන් ලබා දීම.<br>▪ ප්‍රතිචක්‍රීකරණය දිරිගැන්වීම් - ප්‍රතිචක්‍රීකරණය කරන පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා බදු ප්‍රතිලාභ හෝ වට්ටම් ලබා දීම.<br>▪ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් - අපද්‍රව්‍ය එකතු කිරීම සහ සැකසීම වැඩිදියුණු කිරීම සඳහා පුද්ගලික ප්‍රතිචක්‍රීකරණය කරන්නන් සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වීම.<br>▪ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන - විද්‍යුත් අපද්‍රව්‍ය සහ බැටරි වැනි ප්‍රතිචක්‍රීකරණය කිරීමට අපහසු අයිතම සඳහා මධ්‍යගත ප්‍රතිචක්‍රීකරණ එකතු කිරීමේ ස්ථාන ස්ථාපිත කිරීම. |
| 4. ප්‍රතිසාධනය (Recover) (අපද්‍රව්‍ය වලින් වටිනාකම උකහා ගැනීම) | ▪ කොම්පෝස්ට් කිරීමේ පහසුකම් - කෘෂිකර්මාන්තය සහ ගෙවතු වගාව සඳහා කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පරිවර්තනය කිරීම.<br>▪ අපද්‍රව්‍ය-බලශක්ති - ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය භාවිතා කර පුළුස්සා දැමීම හෝ ජීව වායු නිෂ්පාදනය හරහා විදුලිය ජනනය කිරීම.<br>▪ ගොඩකිරීමේ වායු ප්‍රතිසාධනය (Landfill Gas Recovery) - බලශක්තිය නිපදවීම සඳහා ගොඩකිරීම් වලින් මීතේන් නිෂ්පාදනය.<br>▪ ඉදිකිරීම් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය - කඩා දැමූ ගොඩනැගිලිවලින් ද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම. |

ඒ අනුව සමස්ථ කසල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය පහත පියවරයන් ඔස්සේ ක්‍රියාත්මක කළ හැකිය.

*රූපය 6.3 :කසළ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය*




එසේම පහත සඳහන් උපාය මාර්ග තුළින් තවදුරටත් ප්‍රදේශය තුළ කසළ කලමනාකරණය තවදුරටත් විධිමත් කල හැකිය.

- අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ නීති ක්‍රියාත්මක කිරීම - අනුකූල නොවන පුරවැසියන්ට සහ ව්‍යාපාරවලට සේවා ගාස්තු නියම නියම කිරීම.
- වෘත්ත ආර්ථිකයක් (Circular Economy) වර්ධනය කිරීම - ප්‍රතිචක්‍රීකරණය කළ හැකි නිෂ්පාදන සැලසුම් කිරීමට ව්‍යාපාර දිරිමත් කිරීම.
- ප්‍රතිචක්‍රීකරණ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම - ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් (Material Recovery Facilities) (MRFs) ස්ථාපිත කිරීම.
- ප්‍රජාවන් සහ පාසල් දැනුවත් කිරීම - 4R භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 6.4. ආර්ථික පුනර්ජීවන උපාය මාර්ගික සැලැස්ම
## (Economic Revitalization Strategy)

### 6.4.1. ආර්ථික සංවර්ධන සැලැස්ම

"සියනෑවේ පිබිදෙන හරිත අගනගරය" යන දැක්ම පෙරටුකොට ගෙන ඉලක්ක හා පරමාර්ථයන් ඔස්සේ ගොඩනැගුණු උපයා මාර්ග අතරින් ආර්ථික සංවර්ධන උපාය මාර්ගය සුවිශේෂී උපාය මාර්ගයක් වෙයි. එබැවින්, ආර්ථික සංවර්ධන උපාය මාර්ගය තුළින් ඉදිරි වසර දහයක කාලය සඳහා, පවතින විභවතාවන් සැලකිල්ලට ගෙන ගම්පහ මහනගර සභා බල ප්‍රදේශයේ හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආර්ථිකය සංවර්ධනය කළ හැකි ක්‍රමෝපායන් හඳුනා ගැනීම හා නියමු ව්‍යාපෘතීන් ඔස්සේ ඒවා ක්‍රියාවට නැංවීම සිදු කරනු ලබයි.

ඒ අනුව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට වෙන් වෙන් වශයෙන් සහ පොදු වශයෙන් ප්‍රධාන ආර්ථික සංවර්ධන උපාය මාර්ග 03ක් හඳුනා ගනු ලැබුණු අතර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවර්ධනය කරනු ලබන නියමු ව්‍යාපෘතීන් (Pilot Projects ) ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ උපාය මාර්ගයේදී (Project Implementation Strategy) විස්තර කරනු ලැබේ.

ඒ අනුව ප්‍රධාන ආර්ථික උපාය මාර්ග 03 වන්නේ,

1. ගමනාගමනය මුල් කරගත් සංවර්ධනය. ( Transit Oriented Development)
2. තරඟකාරී චන්ද්‍රිකා නගර පර්ෂද ඇති කිරීම. (Competitive Satellite Township Clusters Development)
3. අගය එකතු කරන ලද ආයුර්වේද හා කෘෂි කලාප සංවර්ධනය.( Ayuru-Agro Enhanced Fascinating Zones Development)

#### 6.4.1.1 ගමනාගමනය මුල් කරගත් සංවර්ධනය (Transit Oriented Development)

මෙම ගමනාගමනය මුල් වූ සංවර්ධනය යන ආර්ථික උපායමාර්ගය යෝජනා කරනු ලබන්නේ ගම්පහ නගර මධ්‍යයටය. ගම්පහ නගරය යනු ගම්පහ දිස්ත්‍රික් පරිපාලන අගනගරයේ කේන්ද්‍රස්ථානය වන අතර විභවතා රැසකින් පිරිපුන්, එනම් ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන අගනගරය වීම, ගමනාගමන සේවා, ප්‍රමුඛතම පාසල් පද්ධතියක් පිහිටා තිබීම, පෞද්ගලික අධ්‍යාපන සේවා පර්ෂද, රාජ්‍ය ආයතන , බැංකු සේවා පර්ෂද, සෞඛ්‍ය සේවා පර්ෂද, වාණිජ භාවිතයන් ආදී වූ විවධ සේවා ක්ෂේත්‍රයන්හි පුළුල් පරාසයක් සහිතව තම 237,000 ක් පමණ වූ පෝෂක නේවාසික ජනගහනයට (Residential Population) හා දිනකට නගරයට පැමිණෙන 200,000 කට අධික වූ ක්‍රියාකාරී ජනගහනයට (Functional Population) සේවා සපයන සේවා මධ්‍යස්ථානයකි. එනමුත්, මෙතරම් විභවතා සහිත නගරයක් වුවද එම විභවතා උපයෝගී කොටගෙන නිවැරදි දිශානතියක් ඔස්සේ නගරය ගමන් නොකිරීම හේතු කොට ගෙන නගරය සතු නිසි ආර්ථික වටිනාකම නගරයෙන් ගිලිහී යන බව නිරීක්ෂණය වේ.

එයට ප්‍රධාන හේතු සාධක ලෙස පෙනී යන්නේ නගරය සකස් වී ඇති නාගරික ව්‍යුහයත් සමඟ නගරයේ ක්‍රියාකාරී බව අවම වී තිබීම සහ එමගින් නගරය තුළට නව ආයෝජනයන් ආකර්ෂණය නොවීමයි. එනම් ගම්පහ නගර මධ්‍යය ව්‍යුහය සළකා බැලීමේදී නගර මධ්‍යයේ ක්‍රියාකාරීත්වය හුදු ගමනාගමනය, අධ්‍යාපනික, ආයතනික සේවා ලබා දෙන කාල සීමාවට පමණක් සීමා වී ඇති අතර සවස් කාලය තුළදී වීදි වල සහ නගරය තුළ හුදකලා බවක් නිරීක්ෂණය වෙයි. එයට ප්‍රධාන හේතුවක් ලෙස පෙනී යන්නේ නගරය ප්‍රධාන A ශ්‍රේණියේ මහා

මාර්ග ජාලයෙන් වෙන්ව පිහිටා තිබීමය. නිදසුනක් ලෙස කොළඹ- නුවර ප්‍රධාන මාර්ගයත් සමඟ කැලණිය, කිරිබත්ගොඩ, කඩවත වැනි ක්‍රියාකාරී සහ තරඟකාරී නගර බිහි වී ඇති අතර ප්‍රධාන කලාපීය ගමනාගමන මාර්ගයක් හරහා සංවර්ධනය වී ඇති මෙම නගර හරහා ගමන් කරන සංක්‍රමණික ජනගහනය නිසා දෛනිකව වැඩි වේලාවක් මෙම නගර ක්‍රියාකාරීව පවතී. එබැවින් එවැනි නගර වල වාණිජ වටිනාකම ඉහළ ගොස් ඇති අතර වැඩි ආයෝජන අවස්ථාවන්ද හිමිවී තිබේ. පෙර සඳහන් පරිදි එදිනදා සේවාවන් වලට පමණක් ගම්පහ නගරයට ඇදී එන ක්‍රියාකාරී ජනතාවක් (Functional Population) සිටින මෙම නගරය තුළ, එම ජනතාව රඳවා තබා ගැනීමට අවශ්‍ය ආර්ථික වටිනාකම් ගොඩ නැගිය යුතුය. එසේ සිදු කිරීමට නම් නව ආයෝජනයන් නගරයට ආකර්ෂණය විය යුතුය. එසේ නව ආයෝජනයක් ගොඩනැගෙන්නේ ක්‍රියාකාරී ජනගහනයක් නගර තුළ වැඩි වේලාවක් රැඳී සිටීනම් පමණි. නමුත් සේවා කේන්ද්‍ර ක්‍රියාකාරී ජනගහනයක් සිටින ගම්පහ නගරය තුළ මෙවැනි නව ආයෝජනයන් නගර ආර්ථිකයට එක් වීම ඉතා සීමිත අතර පැරණි සහ අබලන් වූ නගර ව්‍යුහයක් සහිත අඩු ආර්ථික වටිනාකමක් ඇති නගර මධ්‍යයක් නිර්මාණය වීමට මෙය ප්‍රධාන හේතුවක් වී ඇත.

තවද නව ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීම ආයාසයෙන් සිදු කළ නොහැකි අතර නිරායාසයෙන් ආයෝජන ගලා එන ආකාරයේ උපාය මාර්ගයක් නගර තුළ ඇති කළ යුතුය. ඒ අනුව පවතින විභවතාවන් හා අනාගත ව්‍යාපෘතීන් සහ එහි බලපෑම් සළකා බලමින් අනාගත නගර ව්‍යුහය තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන ආකාරයේ ගමනාගමනය පදනම් කරගත් සංවර්ධනයක් ඇති කිරීම යෝග්‍යය බව හඳුනාගනු ලැබීය. එයට මූලික හේතුව වූයේ ගම්පහ නගර මධ්‍යය ව්‍යුහය ගමනාගමනය පදනම් කොටගෙන වැඩි ක්‍රියාකාරීත්වයක් සිදුවීමයි.

එනම් මූලිකවම කෙටිදුර බස් සේවා ඔස්සේ නගරයට පැමිණෙන අවට නේවාසික ජනගහනය ප්‍රධාන දුම්රිය මාර්ගයේ ප්‍රධාන දුම්රිය නැවතුම්පොළක් වන ගම්පහ දුම්රිය ස්ථානය හරහා දෛනිකව කොළඹ වාණිජ නගරයට පිවිසීමයි. ගම්පහ බස් පර්යන්තය දැනට අන්තර් පළාත් සහ අන්තර් පළාත් බස් මාර්ග 24 කට පමණ පහසුකම් සපයයි. දෛනික ගමන් වාර 1500ක් පමණ ක්‍රියාත්මක වන මුළු බස් රථ සංඛ්‍යාව 500ක් පමණ ඇත. නගරයට ඇතුළු වන බොහෝ බස් රථ පෝෂක සේවා (Feeder Services) එනම් ප්‍රධාන දුම්රිය ස්ථානයක්, සංක්‍රමණ මධ්‍යස්ථානයක් (Transit Centre), සේවා ප්‍රදේශයක් (පරිපාලන සේවා, අධ්‍යාපන සේවා, සෞඛ්‍ය සේවා, වාණිජ හා බැංකු සේවා) වැනි වෙනත් සේවා මාදිලියකට මගීන් රැගෙන ගොස් ලබා දෙන කෙටි දුර සේවාවක් වන අතර ගම්පහ බස් පර්යන්තය සහ ගම්පහ දුම්රිය ස්ථානය ප්‍රධාන සංක්‍රමණ මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත. ප්‍රධාන දුම්රිය මාර්ග හතරෙන් ගම්පහ දුම්රිය ස්ථානය කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් ස්ථාන 15 ක් දුරින් ප්‍රධාන දුම්රිය මාර්ග කොරිඩෝවේ පිහිටා ඇති අතර දුම්රිය මාර්ගවල මගී ප්‍රමාණය සලකා බැලීමේදී පොල්ගහවෙල සිට කොළඹ දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගයේ දෛනික මගීන් සංඛ්‍යාව 100,000 ඉක්මවන බව පැහැදිලිව දැකගත හැකිය. එබැවින් ගම්පහ වැනි දුම්රිය පර්යන්තවලින් මගීන් දුම්රියට නැගීමද ද ලක්ෂයකට වඩා වැඩි අගයක් ගනී.

ඒ අනුව දැනට නගරය තුළ පවතින ක්‍රියාකාරී ගමනාගමන පද්ධතිය හා ගමනාගමන පද්ධතියේ විශාල වෙනසක් සිදුවන ජාතික මට්ටමේ ව්‍යාපෘතීන් එනම්, ගොඩනැගෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගය හා එහි ගම්පහ අන්තර් හුවමාරුව ගම්පහ නගරය තුළ පිහිටා තිබීම, මාර්ග සංවර්ධන අධිකාරියේ පුරෝකථනයන්ට අනුව මධ්‍යම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු අතර දෛනික වාහන ධාරිතාවය සළකා බැලීමේදී ඉහළම ධාරිතාවක් පෙන්වනු ලබන්නේ කඩවත - ගම්පහ අතර වන අතර වර්ෂ 2036 වන විට එම ප්‍රමාණය 53,529කි. එසේම ගම්පහ - වේයන්ගොඩ අන්තර් හුවමාරු අතර දෙවන ඉහළම ධාරිතාවක් පෙන්නුම් කෙරෙන අතර එය වර්ෂ 2036 වන විට 23,212 කි.

ඒ අනුව අනාගත ගම්පහ නගර මධ්‍යය තුල ගමනාගමනය මුල් කරගත් සංවර්ධනයක් අපේක්ෂා කෙරෙන අතර එය මිශ්‍ර සංගත (Mixed Compact Development) සංවර්ධනයක් ලෙස ප්‍රවර්ධනය වීම අපේක්ෂා කෙරේ. මෙහිදී නගර මධ්‍යයේ සිට මීටර 1500 ක කලාපයක් හඳුනා ගැනෙන අතර පළමු මීටර 400 ගමනාගමන මධ්‍යයය (Transit core ) පදික ප්‍රමුඛතා ප්‍රදේශයක් ලෙසත් , දෙවන මීටර 800 ගමනාගමන නේවාසික ප්‍රදේශයක් ලෙසත් (Transit Neighborhood) සහ තෙවන ප්‍රදේශය ගමනාගමන සහයක ප්‍රදේශය (Transit Supportive Area ) ලෙසත් වර්ධනය කෙරෙන අතර මෙම ප්‍රධාන අපරවයුහ පහසුකම් වර්ධනය කිරීම තුල වාණිජ, ආයතනික, නේවාසික, අධ්‍යාපන වෙළඳපල ආකර්ෂණය කර ගැනීම අපේක්ෂා කෙරේ. මෙහිදී ප්‍රධාන ව්‍යාපෘතීන් ලෙස බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, පදික ඇවිදීමේ මංතීරු හා ප පැදි මංතීරු , මිශ්‍ර සංවර්ධන හා නිවාස ව්‍යාපෘති ඇති කිරීම ප්‍රධාන වේ.

*රූප සටහන 6.2 : ගමනාගමනය මුල් වූ සංවර්ධනයේ සංකල්පිත සැලසුම්*






### 6.4.1.2. තරගකාරී චන්ද්‍රිකා නගර පර්ෂද ඇති කිරීම. (Competitive Satellite Township Clusters Development)

සංකල්පිත සැලැස්මේ දැක්වූ පරිදි එකිනෙක වෙනස් වූ තරගකාරී චන්ද්‍රිකා නගර හා ඒ අවට ඇති කුඩා මංසන්ධින් එකතු කොට ගෙන නගර පර්ෂද ඇති කිරීම බලාපොරොත්තු වන අතර මෙහි අපේක්ෂාව වන්නේ ඒ ඒ නගර වලට අයත් පෝෂක නේවාසික ජනගහනයට අවශ්‍ය පහසුකම් සේවා සැපයීම මෙන්ම අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය තුලින් නගර වටිනාකම වැඩිදියුණු කොට වාණිජ ආකර්ෂණය ලබා දීමයි. මෙහිදී චන්ද්‍රිකා නගරයක් ලෙස අදහස් කරනු ලබන්නේ මව් නගරය ආසන්නයෙන් මව් නගරයෙන් වෙන්ව පිහිටි යම්තාක් දුරකට ස්වයන්පොෂිත ඒකකයක් ලෙස තමාගේ පෝෂක ප්‍රදේශයට සේවා සැපයිය හැකි නගරයකි. මෙහිදී ගනේමුල්ල, යක්කල, වැලිවේරිය යන චන්ද්‍රිකා නගර පිළිවෙලින් නේවාසික චන්ද්‍රිකා නගරයක් (Domitory Satellite Township), යක්කල චන්ද්‍රිකා නගරයක් (Business Satellite Township) සේවා චන්ද්‍රිකා නගරයක් (Service Satellite Township) ලෙස සංවර්ධනය කිරීම යෝජිතය.

*රූප සටහන 6.3 : ගනේමුල්ල චන්ද්‍රිකා නගරය සංකල්පිත සැලසුම්*




*රූප සටහන 6.2 : වැලිවේරිය චන්ද්‍රිකා නගරය සංකල්පිත සැලසුම්*



### 6.4.1.3. අගය එකතු කරන ලද ආයුර්වේද හා කෘෂි කලාප සංවර්ධනය.( Ayuru-Agro Enhanced Fascinating Zones Development)

ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණෙන් කෘෂි හා ආයුර්වේ ක්ෂේත්‍ර වල පවතින විභවතාවයන් සැලකිල්ලට ගනිමින් යෝජිත මෙම ආර්ථික උපාය මාර්ගය මගින් ප්‍රාදේශීයව මූලිකව රැකියා අවස්ථා 300 ක් පමණ ඇති කිරීම අපේක්ෂා කරන අතර ගම්පහ යක්කල ආයුර්වේදය පදනම් කරගත් සංචාරක නැවතුමක් ලෙසද, බැලුම්මහර අගය එකතු කරන ලද අන්නාසි නිෂ්පාදන සඳහා වෙළඳපලක් නිර්මාණය කිරීම හා සංචාරක ගිමන් පලක් කර ගැනීමද,ගම්පහ හෙනරත්ගොඩ උද්භිත් උද්‍යානය ආශ්‍රිතව මල් විකිණුම් මධ්‍යස්ථාන ඇති කොට (Flower Street) සංකල්පය යටතේ ප්‍රවර්ධනය කිරීමද අපේක්ෂා කෙරේ.

*රූප සටහන 6.4 : අගය එකතු කරන ලද ආයුර්වේද හා කෘෂි කලාප සංවර්ධනය සංකල්පිත සැලසුම්*



## 6.5. නාගරික ජනාවාස උපාය මාර්ගික සැලැස්ම
(Urban Settlement Strategy)

### 6.5.1. යෝජිත ජනගහන සහ නිවාස ඝනත්ව ව්‍යාප්තිය

#### 6.5.1.1 ජාතික මට්ටම

ජාතික භෞතික සැලැස්ම -2048 තුළ ගම්පහ නගරය ජාතික නගරයක් වශයෙන් හඳුනාගෙන ඇති අතර ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අනාගත ජනගහනය පුරෝකථනය කිරීමේදී ජාතික භෞතික සැලැස්මෙහි සඳහන් ජනගහන පුරෝකථනය සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව වර්ෂ 2048 වන විට ලංකාව තුළ අපේක්ෂිත ජනගහනය මිලියන 25ක් වන අතර ජාතික භෞතික සැලැස්මේ අපේක්ෂිත ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (Key Performance Indicator / KPI) අනුව එම මිලියන 25ක ජනගහනයෙන් 70% ක ප්‍රමාණයක් එනම් මිලියන 17.5 ක් නාගරික ජනගහනය වන බවට අපේක්ෂා කරයි. දැනට සිටින නාගරික ජනගහනය මුළු ජනගහනයෙන් 18.2% කි.

එසේම ජාතික භෞතික සැලසුම මඟින්, ප්‍රධාන මාර්ග මූලික කර ගනිමින් සිදු වී ඇති අඛණ්ඩ නාගරික ඒකරාශී වීම් (Urban Agglomoration) හඳුනාගෙන එම අඛණ්ඩ නාගරික ව්‍යාප්තිය ක්‍රමවත් කොට ජාතික ආර්ථිකයට දායක කළ හැකි ආකාරයේ ඵලදායී ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රධාන නාගරික ඒකරාශී ප්‍රදේශ (Urban Agglomorations) පහක් හඳුනාගෙන ඇති අතර එම එක් එක් නාගරික ඒකරාශී ප්‍රදේශ වල අපේක්ෂිත නාගරික ජනගහන පුරෝකථනයන් දක්වා ඇත. ඒ අනුව මෙම නාගරික ඒකරාශී ප්‍රදේශයන් (Urban Agglomorations) හි වර්ෂ 2048 වන විට අපේක්ෂිත ජනගහනය මිලියන 11.2ක් වන අතර එය වර්ෂ 2048 වන විට ලංකාවේ අපේක්ෂිත ජනගහනයෙන් 45% ක ප්‍රතිශතයකි. එම ජනගහනයෙන් 63% ක විශාල ප්‍රතිශතයක් බස්නාහිර නාගරික ඒකරාශී (Western Urban Agglomoration ) ප්‍රදේශයෙන් අපේක්ෂිතය. ඒ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය මෙයින් බස්නාහිර නාගරික ඒකරාශී (Western Urban Agglomoration ) ප්‍රදේශයට අයත් වේ. ඒ එක් එක් නාගරික ඒකරාශී (Urban Agglomoration ) ප්‍රදේශයන්ගේ අපේක්ෂිත ජනගහනය, ජන ඝනත්වය හා භූමි ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇති අතර යෝජිත ජනාවාස ධූරාවලියේ (The Proposed Settlement Hierarchy) සිතියම ද දක්වා ඇත.

*වගුව6.3 : යෝජිත නාගරික ඒකරාශී ප්‍රදේශ වල භූමි ප්‍රමාණය හා අපේක්ෂිත ජනගහනය*

| | Urban Agglomeration | Extent (km2) | Population (2020) | Population (2030) | Expected population (2048) | Population density (2048 |
|---|---|---|---|---|---|---|
| 1 | Western | 3,965 | 5,865,577 | 6,264,593 | 7,000,000 | 1,765 |
| 2 | Southern | 2,271 | 1,575,241 | 1,721,154 | 2,000,000 | 881 |
| 3 | Batticaloa - Ampara | 474 | 547,409 | 620,196 | 800,000 | 1,688 |
| 4 | Trincomalee | 1,168 | 334,354 | 387,094 | 600,000 | 514 |
| 5 | Northern | 1,247 | 486,682 | 533,723 | 800,000 | 642 |
| | Total | **9,125** | **8,809,263** | **9,526,759** | **11,200,000** | **1,227** |

මූලාශ්‍රය : ජාතික භෞතික ප්‍රතිපත්ති හා සැලැස්ම- 2048

*සිතියම 6.6 : යෝජිත ජනාවාස ධූරාවලිය - 2048*




මූලාශ්‍රය : ජාතික භෞතික ප්‍රතිපත්ති හා සැලැස්ම- 2048, වාර්තාව ,2023 මැයි මස

### 6.5.1.2. ප්‍රාදේශීය මට්ටටම

එසේම පුරෝකථනයන් හා ගණනය කිරීම් අනුව බස්නාහිර නාගරික ඒකරාශී (Western Urban Agglomoration ) ප්‍රදේශයෙන් 6% ක ප්‍රතිශතයක් එනම් 350,000 ක ජනගහනයක් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් අපේක්ෂිතය. එසේම ජාතික භෞතික සැලැස්ම තුළ හඳුනාගෙන ඇති ජාතික නගර 21 සඳහා පුරෝකථනය කරන ලද ජගහනය දක්වා ඇති අතර ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුල එම ජාතික නගර සඳහා අපේක්ෂිත 2,065,000 ක් වූ මුළු ජනගහනයෙන් 7% ක ප්‍රතිශතයක් එනම් 150,000 ප්‍රමාණයක් වර්ෂ 2048 වන විට අපේක්ෂිතය. එසේම එම ජාතික නගර 21 ප්‍රමුඛතා ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් හඳුන්වා දී ඇති අතර ගම්පහ නගරය ගමනාගමන හා සේවා නගරයක් ලෙස හඳුනාගෙන ඇත. එම ජාතික නගර 21 හා අපේක්ෂිත ජනගහනය, ජන ගණත්වය හා ප්‍රමුඛතා ක්‍රියාවන් පහත වගුවේ සඳහන් කර ඇත.

*වගුව6.4 : යෝජිත ජාතික නගර වල පළාත් පාලන ආයතනය, අපේක්ෂිත ජනගහනය හා ප්‍රමුඛතා ක්ෂේස්ත්‍ර*

| | ජාතික නගරය | පළාත් පාලන ආයතනය | භූමි ප්‍රමාණය (ව.කි.) | ජනගහනය (2020) | අපේක්ෂිත ජනගහනය (2048) | ජන ඝණත්වය (2048) | නගර ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන පැති |
|---|---|---|---|---|---|---|---|
| 1 | අම්පාර | අම්පාර ම.න.ස. | 34.0 | 27,372 | 70,000 | 2058.8 | කෘෂි-කර්මාන්ත, සංචාරක, සේවා |
| 2 | අනුරාධපුර | අනුරාධපුර ම.න.ස. | 42.0 | 49,773 | 150,000 | 4761.9 | සංචාරක, සංස්කෘතික, උරුමයන් |
| 3 | බදුල්ල | බදුල්ල ම.න.ස. | 10.0 | 45,912 | 65,000 | 6500.0 | සංචාරක, ප්‍රවාහන, සේවා |
| 4 | මඩකලපුව | මඩකලපුව ම.න.ස. | 42.0 | 90,425 | 150,000 | 3574.0 | සංචාරක, සේවා, කෘෂි ආශ්‍රිත නිමැවුම් |
| 5 | ගාල්ල | ගාල්ල ම.න.ස. | 17.0 | 84,722 | 140,000 | 8235.3 | සංචාරක, සමුද්‍රීය, පුරාවිද්‍යා සංරක්ෂණ |
| 6 | ගම්පහ | ගම්පහ ම.න.ස. | 6.7 | 65,510 | 150,000 | 22288.3 | සේවා, ප්‍රවාහන |
| 7 | කළුතර | කළුතර ම.න.ස. | 7.6 | 34,139 | 70,000 | 9162.3 | සේවා, කෘෂි ආශ්‍රිත නිමැවුම් |
| 8 | මහනුවර | මහනුවර ම.න.ස. | 26.5 | 97,209 | 125,000 | 4725.9 | සංචාරක, සංස්කෘතික, ඓතිහාසික, සංරක්ෂණය |
| 9 | කෑගල්ල | කෑගල්ල න.ස. | 8.0 | 16,948 | 75,000 | 9,375.0 | අධ්‍යාපනික, සේවා |
| 10 | කිලිනොච්චි | කරච්චි ප්‍රා.ස. | 308.0 | 70,862 | 100,000 | 324.7 | සංචාරක, සේවා |
| 11 | කුරුණෑගල | කුරුණෑගල ම.න.ස. | 10.6 | 26,480 | 100,000 | 9,433.9 | සංචාරක, සේවා |
| 12 | මන්නාරම | මන්නාරම න.ස. | 14.7 | 57,148 | 75,000 | 5102.0 | සුළං බලශක්තිය, ධීවර කටයුතු, තෙල් සහ ගෑස්, සංචාරක |
| 13 | මාතලේ | මාතලේ ම.න.ස. | 8.6 | 47,143 | 40,000 | 4651.2 | සංචාරක, සේවා |
| 14 | මාතර | මාතර ම.න.ස. | 12.8 | 74,119 | 140,000 | 10980.4 | සේවා, අධ්‍යාපනික |
| 15 | මොනරාගල | මොනරාගල ප්‍රා.ස. | 292.0 | 54,929 | 150,000 | 513.7 | සේවා, කෘෂි ආශ්‍රිත නිමැවුම් |
| 16 | මුලතිව් | මුලතිව් ප්‍රා.ස. | 585.0 | 30,642 | 60,000 | 102.6 | සේවා, සංචාරක |
| 17 | පොලොන්නරුව | පොලොන්නරුව ම.න.ස. | 41.0 | 36,732 | 125,000 | 3048.8 | සංචාරක, කෘෂි ආශ්‍රිත නිමැවුම්, සේවා |
| 18 | පුත්තලම | පුත්තලම න.ස. | 24.3 | 49,957 | 100,000 | 4123.7 | කෘෂි ආශ්‍රිත නිමැවුම්, සේවා |
| 19 | නුවරඑළිය | නුවරඑළිය ම.න.ස. | 12.0 | 32,734 | 20,000 | 1666.7 | සංචාරක, පර්යේෂණ හා අධ්‍යාපනික, සංරක්ෂණය |
| 20 | රත්නපුර | රත්නපුර ම.න.ස. | 22.0 | 60,478 | 80,000 | 3636.4 | සංචාරක, සේවා, මැණික් විද්‍යාව |
| 21 | වවුනියාව | වවුනියාව න.ස. | 35.9 | 48,483 | 80,000 | 2230.9 | සංචාරක, සේවා කෘෂි ආශ්‍රිත නිමැවුම් |
| | **එකතුව** | | **1560.6** | **1,101,717** | **2,065,000** | **1323.2** | |

Activate Windows
Go to Settings to activat

මූලාශ්‍රය : ජාතික භෞතික ප්‍රතිපත්ති හා සැලැස්ම- 2048, වාර්තාව ,2023 මැයි මස

එමෙන්ම 2030 වර්ෂය තෙක් යෝජිත බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්මට අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාව මහා කොළඹ සංවර්ධන හර ප්‍රදේශයෙන් බැහැරව පිටත හර ප්‍රදේශයේ පවතින අතර එම පිටත හර ප්‍රදේශය සලකනු ලබනුයේ කොළඹ හා තදාසන්න නගරවලින් පිටාර යන නේවාසික ඉල්ලුම ආකර්ෂණය කර ගත හැකි මධ්‍යම ඝනත්වයෙන් යුත් නේවාසික හා මිශ්‍ර සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රවර්ධනය කිරීමයි.

*සිතියම 6.7 : යෝජිත බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්ම - 2030*




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

වර්ධනය වේ යැයි අපේක්ෂිත අනාගත ජනගහනය හරහා ප්‍රදේශයේ නිවාස ඝනත්වය සහ ව්‍යාප්තිය යෝජිත එක් එක් කාලාපයට අනුව මෙන්ම ඒවාට ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ඉඩම් පරිහරණ භාවිතයන්ට අනුවද වෙනස්කම්වලට ලක් වේ.

ඒ අනුව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයට සහ ගම්පහ ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයටවෙන් වෙන් වශයෙන් පුරෝකථනය කළ ජනගහනය සහ ඊට අනුබද්ධව යෝජිත නිවාස ඝනත්වය, සංවර්ධන සැලැස්ම මඟින් ළඟා කරගැනීමට බලාපොරොත්තු වන අනාගත දැක්ම, පාරිසරික විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල සහ සංවර්ධන විභවතාවයන්ට අනුකූල වන පරිදි ඝනත්ව කලාප වශයෙන් බෙදා වෙන් කිරීම පහත පරිදි වේ. එහිදී උපකල්පනයන් මත ඝනත්ව කලාපවල අනාගතයේදී දිරිගන්වන ප්‍රමුඛ භාවිතය පදනම් කර ගනිමින් ජනගහන වර්ධන වේගයන් සලකා බලා ඇත.

එම ගණනය කිරීම් මත ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශයේ 2033 වන විට ජනගහනය 120,000 ක් වන අතර වර්ධන වේගය 2% කි. ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2033 වන විට ජනගහනය 230,000 ක් වන අතර වර්ධන වේගය 2.5% කි. ගම්පහ ප්‍රාදේශීය කොට්ඨාශ බල ප්‍රදේශය වශයෙන් සැළකූ කළ 2033 හි අපේක්ෂිත මුළු ජනගහනය 350,000කි.

ඒ අනුව ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් එක් කලාප සහ ඒවාට 2033 වසර වන විට අපේක්ෂිත නේවාසික ජනගහනය සහ පවුල් ඒකකයක අවම පුද්ගලයන් ගණන සැලකිල්ලට ගනිමින් කලාප අනුව නිවාස ව්‍යාප්තිය සහ නිවාස ඝනත්වය ගණනය කිරීම් පහත වගු ඔස්සේ වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. මෙහිදී ප්‍රමුඛතා මංසන්ධීන් අනුව එම එක් එක් කලාප පර්ෂදයන් වලට බෙදා දක්වා ඇත.

### 6.5.1.2.1 වර්ෂ 2033 වන විට සංවර්ධන කලාප අනුව අපේක්ෂිත ජනගහනය, ජන ඝනත්වය සහ නිවාස ඒකක -ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය

*වගුව6.5 : කලාප අනුව ජනගහනය, ජන ඝනත්වය සහ නිවාස ඒකක ගණන - ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය*

| පර්ෂදය (Cluster) | යෝජිත නාමය | 2033 සඳහා යෝජිත ජනගහනය | අපේක්ෂිත ජන ඝනත්වය (හෙකටයාරයකට පුද්ගලයන්) | 2033 සඳහා අපේක්ෂිත මුළු නිවාස සංඛ්‍යාව | අපේක්ෂිත නිවාස ඝනත්වය (හෙකටයාරය කට නිවාස ) |
|---|---|---|---|---|---|
| ගම්පහ නගර පර්ෂදය (Gampaha City Cluster) | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1) (හෙක්ටයාර 153) | 15000 | 98 | 3750 | 25 |
| | අධි ඝනත්ව ආයතනික කලාපය (I1 ) (හෙක්ටයාර 739) | 30000 | 40 | 7500 | 10 |
| | අධි ඝනත්ව නේවාසික කලාපය (R1) (හෙක්ටයාර 388) | 25000 | 64 | 6250 | 16 |
| මිරිස්වත්ත සහ යක්කල නගර පර්ෂදය (Miriswaththa & Yakkala Town Cluster) | අධි ඝනත්ව වාණිජ කලාපය (C1) (හෙක්ටයාර 604) | 25000 | 41 | 6250 | 10 |
| | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) (හෙක්ටයාර 316) | 7000 | 22 | 1750 | 06 |
| | මධ්‍යම ඝනත්ව සංචාරක කලාපය (T2) (හෙක්ටයාර 130) | 3000 | 23 | 750 | 06 |
| | මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2) (හෙක්ටයාර 468) | 15000 | 32 | 3750 | 08 |
| එකතුව | | 120,000 | | 30,000 | |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023

### 6.5.1.2.2 - වර්ෂ 2033 වන විට සංවර්ධන කලාප අනුව අපේක්ෂිත ජනගහනය, ජන ඝනත්වය සහ නිවාස ඒකක ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

*වගුව 6.7 කලාප අනුව ජනගහනය, ජන ඝනත්වය සහ නිවාස ඒකක - ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*

| පර්ෂදය (Cluster) | යෝජිත නාමය | 2033 සඳහා යෝජිත ජනගහනය | අපේක්ෂිත ජන ඝනත්වය (හෙක්ටයාරය කට පුද්ගලයන්) | 2033 සඳහා අපේක්ෂිත මුළු නිවාස සංඛ්‍යාව | අපේක්ෂිත නිවාස ඝනත්වය ( හෙක්ටයාරය කට නිවාස ) |
|---|---|---|---|---|---|
| මාකෙවිට පර්ෂදය (Makevita Cluster) | අඩු ඝනත්ව නේවාසික කලාපය (R3) (හෙක්ටයාර 1108) | 25000 | 23 | 6250 | 06 |
| ගනේමුල්ල පර්ෂදය (Ganemulla Cluster) | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1) (හෙක්ටයාර 959) | 50000 | 52 | 12500 | 13 |
| | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) -II (හෙක්ටයාර 451) | 15000 | 33 | 3750 | 08 |
| යාගොඩ පර්ෂදය (Yagoda Cluster) | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) -I (හෙක්ටයාර 983) | 15000 | 15 | 3750 | 04 |
| | අධි ඝනත්ව නේවාසික කලාපය (R1) (හෙක්ටයාර 611) | 40000 | 65 | 10000 | 16 |
| බැලුම්මහර පර්ෂදය (Balummahara Cluster) | මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2) (හෙක්ටයාර 1243) | 50000 | 40 | 12500 | 10 |
| වැලිවේරිය පර්ෂදය (Weliweriya Cluster) | මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය (In 2) (හෙක්ටයාර 1070) | 35000 | 33 | 8750 | 08 |
| එකතුව | | 230,000 | | 57,500 | |

මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023

ඒ අනුව අනාගත ජනගහන පුරෝකථනය හා නිවාස අවශ්‍යතාවය සලකා බැලීමේදී පවතින නිවාස හැර 2033 වර්ෂය වන විට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා තවත් නිවාස ඒකක 30,500 ක අවශ්‍යතාවයක් ඇත. එසේම, පුරෝකථන කර ඇති ජනගහනය ප්‍රධාන නගර, උප නගර හා මංසන්ධීන් මුල්කර ගනිමින් ඒ ඒ සංවර්ධන කලාප තුළ ව්‍යාප්ත වන අපේක්ෂිත ව්‍යාප්තිය පහත සිතියම6.8 මඟින් පෙන්නුම් කර ඇත.

*සිතියම 6.7 : ප්‍රධාන නගර , උප නගර හා මංසන්ධීන් මුල්කරගනිමින් අපේක්ෂිත ජනගහනය හා නිවාස සංඛ්‍යාව*




මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023

## 6.6. දැනුම් කේන්ද්‍රය පුළුල් කිරීමේ උපාය මාර්ගික සැලැස්ම (Knowledge Hub Expansion Strategy)

ගම්පහ නගරය අධ්‍යාපනික වශයෙන් ඉතා ප්‍රචලිත අතර පසුබිම් අධ්‍යනයේදී සඳහන් කළ පරිදි ප්‍රශස්ත මට්ටමේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික පාසල් වලින්ද, පෞද්ගලික අධ්‍යාපන ආයතනයන්ගෙන්ද, රජයේ ආයුර්වේද වෛද්‍ය විශ්ව විද්‍යාලයකින්ද සමන්විත වේ. ඒ අනුව දිනකට පාසල් සඳහා නගරයට පැමිණෙන සිසුන් පිරිස 45,000 ඉක්මවන අතර පෞද්ගලික අධ්‍යාපනික ආයතන සඳහා දිනකට නගරයට ඇදී එන සිසුන් පිරිසද 40,000 කට අධික වේ. මෙයින් සැලකිය යුතු සිසුන් පිරිසක් පිටත ප්‍රදේශ වලින් පැමිණෙන අතර නගරාසන්නයේ නේවාසිකව අධ්‍යාපනය ලබයි.

ඒ අනුව දැනට අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් ලෙස නගරය තුළ කිසිඳු පහසුකමක් නොමැති වීමත්, පෞද්ගලික අධ්‍යාපන පර්ෂද නිසි ප්‍රමිතියකින් නොමැති වීමත් එම පර්ෂදයන් වඩාත් ඵලදායී ලෙස භාවිතා නොකිරීමත්, එහි ආර්ථික වටිනාකම් නගරයට එක් නොවීමත් යන කරුණු සැලකිල්ලට ගනිමින් මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමට යෝජිතය. එහිදී මෙම උපාය මාර්ගයේ තේමා පාඨය ලෙස "මුළු නගරයම එක සුවිසල් පාසලක් (The Whole city a one big school)" ගෙන ගම්පහ නගරය අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රශස්ත භාවයකින් පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ.

එහිදී ප්‍රධාන වශයෙන් පහත කරුණු කෙරේ ප්‍රමුඛතා ව්‍යාපෘති හරහා අවධානය යොමු කරයි.

- අධ්‍යාපනික ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- ළමා හිතකාමී නාගරික කොරිඩෝ ඇති කිරීම.
- නිපුණතා සංවර්ධන ආයතන ප්‍රවර්ධනය කිරීම.
- ක්‍රීඩා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.
- ශිෂ්‍ය නවාතැන් පහසුකම් සංවර්ධනය.
- විවෘත විවේක ප්‍රදේශ සංවර්ධනය.
- අධ්‍යාපන කලාපයේ ස්වභාවය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා මාර්ගෝපදේශ සැලසුම් කිරීම.

*රූප සටහන 6.5 :යෝජිත දැනුම් කේන්ද්‍රය මුල් කරගත් සංවර්ධනය*




*මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023*

තවද, දැනට ගම්පහ නගරය තුළ ගම්පහ - ජා ඇළ බස් නැවතුම්පොළ ආසන්නයේ පවතින නගරයේ විශාලතම පෞද්ගලික අධ්‍යාපන පර්ෂදය හා ඒ අවට ප්‍රදේශය අධ්‍යාපනික ත්‍රිකෝණයක් ලෙස (Educational Triangle) පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් අධ්‍යාපනික ආයෝජනයන් පුළුල් කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. එම ප්‍රදේශයේ සංකල්පිත සැලැස්මක් පහත රූප සටහන මඟින් පෙන්වා දී ඇත.

*රූප සටහන 6.6 :යෝජිත අධ්‍යාපනික ත්‍රිකෝණය*




*මූලාශ්‍රය : ගම්පහ දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම, 2023*

## 6.7. නගර සන්නාම උපාය මාර්ගික සැලැස්ම (City Branding Strategy)

නගර සන්නාමය (City Branding) යනු නගරයක අනන්‍යතාව, ආයෝජන ප්‍රවර්ධනය, සංචාරක සංවර්ධනය සහ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලික වැඩපිළිවෙලකි. මෙය ව්‍යාපාරවලට, සංචාරකයන්ට සහ පුරවැසියන්ට නගරය පිළිබඳව අනුභූතිමත් හා ආකර්ෂණීය බවක් ගොඩනැගීමට උපකාරී වේ. නගර සන්නාමය ශක්තිමත් කිරීමෙන් නගරයට ආයෝජකයින් ආකර්ෂණය වීමේ ප්‍රවණතාව ඉහළ යන අතර, ඉදිකිරීම්, ව්‍යාපාර සහ දේපළ වටිනාකම් ඉහළ යා හැක. තවද , නගර සන්නාමය වැඩිදියුණු වීම තුළින් නගරයේ ආදායම ඉහළ යනු ඇත. එසේම, නගරයේ සංස්කෘතික උරුමය සහ ස්වභාවික ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීමද කළ හැකි වේ.

ප්‍රජා සහභාගීත්වය, පුරවැසියන්ගේ අභිමානය සහ නගරයේ අනන්‍යතාව ශක්තිමත් කිරීම නගර සන්නාමය මූලික අරමුණු ලෙස සැලකිය හැක. නගරය සහභාගී හා සංවිධානය වූ ප්‍රජාවක් බවට පත් කිරීම, නගර සන්නාමය හරහා ජනතාවට නගරය සතුටින් පිළිගන්නා සේ සැලසුම් කිරීම වැදගත් වේ. නගර සන්නාමය නිවැරදිව ක්‍රියාවට නැංවීමෙන් පුරවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරමින් යටිතල පහසුකම්, මහජන සේවා සහ පරිසරය නවීකරණය කළ හැක. නගර සන්නාමය මගින් නගරය අනිකුත් නගරවලට වඩා විශේෂී කරමින්, අධ්‍යාපනය, නව තාක්ෂණය සහ ව්‍යාපාර කේන්ද්‍රයක් බවට පත් කළ හැක. විශේෂයෙන්ම, නගර සන්නාමය යනු නගරයක දිගුකාලීන සංවර්ධනය, පරිසර හිතකාමී වැඩපිළිවෙල සහ සුහුරු නගර සැලසුම් (Smart City) මඟින් නගරය අනාගතය පෙන්නුම් කරනු ලබන විරාජමාන ලක්ෂණයක් වේ.

ලොව විශේෂී නගර සන්නාමය මූලික නගර ලෙස ප්‍රංශයේ පැරීසිය, ඇමෙරිකාවේ නිව්යෝර්ක්, ඩෙන්මාර්කයේ කෝපන්හේගන්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි යන නගර හඳුන්වා දිය හැකි අතර ඒවායේ ප්‍රසිද්ධ නගර සන්නාමයන් පහත පරිදි දැක්විය හැක.

- Paris, France – "The City of Love" – ආදරණීය නගරයක් ලෙස ප්‍රසිද්ධය *(Famous for romance, fashion, and culture.)*
- New York City, USA – "The City That Never Sleeps" – ව්‍යාපාර, සංස්කෘතිය සහ සංචාරය සඳහා ප්‍රකටය *(A global business, culture, and tourism hub)*
- Copenhagen, Denmark – "Green City" – පරිසර හිතකාමී නගරයක් ලෙස ප්‍රසිද්ධය *(Known for sustainability, cycling culture, and smart urban planning)*
- Dubai, UAE – "City of the Future" – නවීන ව්‍යාපාර සහ සංචාරය සඳහා ප්‍රසිද්ධයි *(Iconic for luxury tourism, business, and innovation)*

නගර සන්නාමය සාර්ථක වීමට නගරයේ අනන්‍යතාව හඳුනා ගැනීම, එය ලොව ප්‍රසිද්ධ කිරීම, ගුණාත්මක වෙළඳපල සැලසුම් ක්‍රියාවට නංවා ගෙන, නගර පාලනය සහ ප්‍රජාව අතර සහයෝගය ඇති කිරීම වැදගත් වේ. නගර සන්නාමය නිවැරදිව ක්‍රියාවට නැංවීමේදී නගරය ආර්ථික, සමාජ සහ සංස්කෘතික වශයෙන් සාර්ථකත්වයට පත් කළ හැක.

ගම්පහ නගරය “සියනෑවේ පිබිදෙන හරිත අග නගරය” ලෙස ප්‍රචලිත කිරීමෙහි ලා භෞතිකව හා පාරිසරිකව නගරය තුළ වටිනාකම් එකතු කළ යුතු අතර ඒ සඳහා ගම්පහ නගර සංවර්ධන සැලැස්ම තුළ විවිධ ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

## 6.8. තිරසාර පාරිසරික උපායමාර්ග සැලැස්ම (Sustainable Environment Strategy)

### 6.8.1 පරිසර සංරක්ෂණ ප්‍රදේශ

වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 9384 ක් වූ ගම්පහ නාගරික බල ප්‍රදේශයේ හෙක්ටයාර් 7102.93 (76%) ක් සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය ලෙස සැලකිය හැකි අතර හෙක්ටයාර් 2282 (24%) ක ප්‍රමාණයක භූමි ප්‍රමාණය පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස විශ්ලේෂණාත්මකව දැක්විය හැක. එම පාරිසරික සංවේදී ප්‍රදේශ පහත ආකාරයට වර්ගීකරණය කල හැක.

*වගුව6.8 : පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ*

| අනු අංකය | භාවිතය | ප්‍රමාණය (හෙක්:) |
|---|---|---|
| 1) | කුඹුරු වගා බිම් | 2018 |
| 2) | අත්හරින ලද කුඹුරු බිම් | 45 |
| 3) | වගුරු බිම් | 108 |
| 4) | ජල දේහයන් | 111 |
| එකතුව | | 2282 |

මූලාශ්‍රය: භූමි පරිහරණ සිතියම (නා.සං.අ.) – 2019

ඉහත වගුවෙහි සදහන් පරිදි පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ, ගම්පහ නාගරික බල ප්‍රදේශයේ භෞතික පරිසරය, එහි ස්වභාවික පරිසරය හා තුලනාත්මකව සංවර්ධනය කළ හැකි වන පරිදි හා දැනට අවදානමට ලක්ව ඇති පාරිසරික හා ස්වභාවික සම්පත් වැඩිදියුණු කර, ප්‍රදේශයේ ජනතාවට පාරිසරික හිතකාමී නේවාසික පරිසරයක් ඇති කිරීම මෙම සැලැස්මේ පරමාර්ථය වේ. මෙම පාරිසරික තත්වයන් වැඩිදියුණු කිරීමේ සැලැස්ම තුල ගම්පහ නාගරික බල ප්‍රදේශයේ උතුරු අර්ධයෙන් ගලා බස්නා ස්වාභාවික ජල මාර්ගයක් වශයෙන් අත්තනගලු ඔය ආශ්‍රිත ප්‍රදේශය සහ කුඹුරු හා පහත් බිම් ප්‍රදේශ සඳහා මූලික වශයෙන් අවධානය යොමු කල යුතු අතර, බටහිර, නැගෙනහිර, දකුණු අර්ධයෙන් ගලා බස්නා කුඩා ඇල මාර්ග කිහිපයක්ම අත්තනගලු ඔය හා සම්බන්ධ වේ. එමෙන්ම ප්‍රදේශයේ නැගෙනහිර මායිමෙන් ඌරුවල් ඔය ආරම්භ වී උතුරු සීමාවේදී අත්තනගලු ඔය හා සම්බන්ධ වේ. මේ අනුව පවතින පාරිසරික සංවේදී ප්‍රදේශයන්ට අනුව ගම්පහ නාගරික බල ප්‍රදේශයේ සමස්ථයක් ලෙස පරිසර හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා බස්නාහිර පළාත් තෙත්බිම් කලාපීකරණ සැලැස්මට අනුව ගම්පහ නාගරික බල ප්‍රදේශයේ තෙත්බිම් පහත සිතියම6.9 ආකාරයට කලාපීකරණය සිදු කල හැක .

සිතියම6.8 : යෝජිත තෙත් බිම් කලාපීකරණ සැලැස්ම




මූලාශ්‍රය : පාරිසරික හා භූ දර්ශන අංශය, නා .සං.අධි ,2024

මේ අනුව ගම්පහ නාගරික බල ප්‍රදේශයේ තෙත්බිම් කලාපීකරණ ඉලක්කය සහ අරමුණු වනුයේ වනුයේ,

### 1.1 ඉලක්කය

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා තෙත් බිම් යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකීමට ගැනීමත් එමඟින් අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීම මඟින් "තිරසාර පරිසර කළමනාකරණය" සිදු කිරීම.

### 1.2 අරමුණු

i. ගම්පහ නාගරික බල ප්‍රදේශය තුල ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ගං වතුර බලපෑම් අවම කිරීම මඟින් පරිසර හිතකාමී නගර ඇති කිරීම.

ii. විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපනික දැනුවත් කිරීම සඳහා තෙත්බිම් යොදා ගැනීම.

iii. ජෛව විවිධත්වය ඉහල නංවමින් පාරිසරික, සංචාරක හා විනෝදාත්මක අවස්ථා වැඩි කිරීම සඳහා තෙත්බිම් යොදා ගැනීම.

ඉහත කරුණු අනුව ගම්පහ නාගරික බල ප්‍රදේශයේ තෙත්බිම් පහත ආකාරයට කලාපීකරණය කල හැක.

1. මධ්‍යම සංවේදී පාරිසරික සංරක්ෂණ කලාපය

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැදවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

2. අඩු සංවේදී පරිසර සංරක්ෂණ කලාපය

පවතින වගා කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය,ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ බස්නාහිර පළාතේ තෙත්බිම් ආශ්‍රිත කෘෂි කර්මාන්තය සිදු කෙරෙන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

මෙම පරිසර සංරක්ෂණ කලාප සඳහා අනුමත භාවිතයන් හා රෙගුලාසි දෙවන පරිච්ඡේදය තුළ සඳහන් කර ඇත.

### 6.8.1 යෝජිත පොදු එළිමහන් විනෝද අවකාශ සැලැස්ම (PORS Plan)

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා 2024 - 2033 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම පහත පරිදි වේ.

*වගුව6.9 : යෝජිත පොදු එළිමහන් අවකාශ සැලැස්ම*

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (ha) |
|---|---|---|
| 1. | යෝජිත කුඩා උද්‍යාන<br>Proposed Mini Parks (PMP) | 0.77 |
| 2 | යෝජිත අසල උද්‍යාන (Proposed Local Parks) | 1.10 |
| 3 | යෝජිත තෙත්බිම් උද්‍යාන<br>Proposed Wetland Parks (PWP) | 16.16 |
| 4 | යෝජිත රේඛීය උද්‍යාන<br>Proposed Linear Parks (PLiP) | 9.56 |
| | යෝජිත එකතුව | 27.59 |
| 5. | පවතින පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය<br>Existing PORS | 12.23 |
| | මුළු එකතුව | 39.82 |

මූලාශ්‍රය : පාරිසරික හා භූ දර්ශන අංශය, නා .සං.අධි ,2024

*සිතියම 6.9 : යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම*

:




පාරිසරික හා භූ දර්ශන අංශය, නා .සං.අධි ,2024

## 6.9. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම

### 6.9.1 උපාය මාර්ගික ව්‍යාපෘති සහ අනෙකුත් ව්‍යාපෘති

|---|---|---|---|
| නේවාසික කලාපය | අධි ඝනත්ව නේවාසික කලාපය | R1 | 2.30 |
| | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය - I | R2 – I | 1.50 |
| | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය - II | R2 – II | 1.50 |
| | අඩු ඝනත්ව නේවාසික කලාපය | R3 | 1.45 |
| වාණිජ කලාපය | මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය | C2 | 2.40 |
| මිශ්‍ර සංවර්ධන කලාපය | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | MD1 | 2.60 |
| කාර්මික කලාපය | මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය | In1 | 2.00 |
| සංරක්ෂණ කලාපය | මධ්‍යම සංවේදී සංරක්ෂණ කලාපය | CN2 | අදාළ නොවේ |
| | අඩු සංවේදී සංරක්ෂණ කලාපය | CN3 | අදාළ නොවේ |

## 7.6 ගම්පහ මහා නගර සභා හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

I. වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ, අංක 1172/7 හා 2001.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් තුල පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා සහ අංක 1983/30 හා 2016.09.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් තුල පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා මෙම රෙගුලාසි බල පැවැත්වේ.

II. කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී, ඊට අදාලවන සැලසුම් හා සංවර්ධන නියමතා සඳහා මෙම කලාපීකරණ සැලැස්මේ නියමතාවන්ට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජූලි මස 08 දිනැති හා අංක 2235/54 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති සැලසුම් හා සංවර්ධන නියෝග /රෙගුලාසි (2021) ගම්පහ මහා නගර සභා සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා බලාත්මක වේ.

III. කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී, ඊට අදාලවන වාහන නතර කිරීමේ පහසුකම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජූලි මස 08 දිනැති හා අංක 2235/54 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති සැලසුම් හා සංවර්ධන නියෝග /රෙගුලාසි (2021) අංක 73 වගන්තිය ප්‍රකාරව සැලසුම් කළ යුතු අතර එහි 10 වන උපලේඛනයේ දක්වා ඇති රථවාහන නැවතුම් පිලිබඳ අවශ්‍යතා සංශෝධනය කර මෙහි වගු අංක 8.4.6 මඟින් දක්වා ඇත. එය ගම්පහ මහා නගර සභා සහ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා බලාත්මක වේ.

IV. වාහන නැවැත්වීමේ ඉඩකඩ අවශ්‍යතා සැලසුම් කිරීමේදී මාර්ගයේ අවම පළල ලෙස එම මාර්ගයට අදාළ යෝජිත පළල සැළකිල්ලට ගත යුතු අතර අදාළ වේ නම් මාර්ග රක්ෂිතය භෞතිකව ප්‍රවේශ මාර්ගයට මුදාහල යුතුය. එහි අවම භූමි ප්‍රමාණය මෙම සැලැස්මෙහි කලාපීකරණ රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

V. ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2001.02.20 දිනට පෙර අනුබෙදුම් කර ඇති ඉඩම් අනු බෙදුම් සැලසුම් වල අවම බිම් ප්‍රමාණය ව.මී. 150ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකන අතර ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016.09.09 දිනට පෙර අනුබෙදුම් කර ඇති ඉඩම් අනු බෙදුම් සැලසුම් වල අවම බිම් ප්‍රමාණය ව.මී. 250ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකනු ලබයි.

VI. ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2001.02.20 දිනට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි හෝ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016.09.09 දිනට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි පවත්නා ගොඩනැගිලි ලෙස සලකනු ලබන අතර ඒවා නීත්‍යනුකූල කිරීමට අවශ්‍ය වන්නේනම් වර්තමාන රෙගුලාසි වලට අනුකූලව සංශෝධිත ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීම අදාළ පළාත් පාලන ආයතනය මඟින් සලකා බලනු ලැබීය හැකිය. එහිදී, ආවරණ අනුමැතිය සඳහා වන සේවා ගාස්තු නිදහස් කිරීම සඳහා, ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ නම් අදාළ ගොඩනැගිල්ල 2001.02.20 දිනට පෙර ඉදිකරන ලද ගොඩනැගිලක් බවට හෝ ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නම් අදාළ ගොඩනැගිල්ල 2016.09.09 දිනට පෙර ඉදිකරන ලද ගොඩනැගිලක් බවට වරලත් ව්‍යුහාත්මක/ සිවිල් ඉංජිනේරුවරයෙකු විසින් ගොඩනැගිල්ලේ ස්වභාවය හා වර්ග ප්‍රමාණයන් ඇතුළත්ව වාර්තාවක් අදාළ පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහිදී වඩාත් නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා Google Erath මෘදුකාංගය භාවිතා කළ හැකිය.

VII. යම් ඉඩමක අයිතිකරුවකු විසින්, වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්, යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සඳහා සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු ලබයි. නමුත් බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට/ යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිය යුතුය.

VIII. එකිනෙකට ස්වායක්තව ප්‍රධාන මාර්ගයන් හා සම්බන්ධ වන, අවම පළල මීටර් 7 ට හෝ ඊට වැඩි සහ නිත්‍යානුකූල ප්‍රවේශ අයිතිය හිමි මාර්ග එකකට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධන පරිශ්‍රයට මුහුණලා ඇති අවස්ථාවන්හිදී, ප්‍රවේශ මාර්ගයේ පළල ලෙස එකී සියලු මාර්ගවල පළල එකතුව සලකා අවසරලත් සංවර්ධනය ගණනය කිරීම අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

IX. ගොඩනැගිලි ඉදිකිරීමේදී ඉඩමේ ආනතිය $45^{\circ}$ වඩා වැඩිවෙන අවස්ථාවන්හිදී අවසර දිය හැකි උපරිම භූමි ආවරණය සහ අවසරදිය හැකි උපරිම ගෙබිම් අනුපාතය/උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූලව තීරණය කල යුතුය.

X. ආනතිය සහිත ඉඩමක් අනුබෙදුම් කිරීමේදී ඉඩමේ ආනතිය $45^{\circ}$ වඩා වැඩිවෙන අවස්ථාවන්හිදී අවසර දිය හැකි අවම භූමි ප්‍රමාණය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූලව තීරණය කල යුතුය.

XI. ආනතියක් සහිත භූමියක සිදු කරන ඉදිකිරීම් කටයුතු සඳහා කරනු ලබන ඉවුරු කැපීම් වලදී අදාළ ආයතන වල නිර්දේශ ලබා ගත යුතු අතර කැපුම්තලය ඉහළ කෙළවර සිට යාබද වැට මායිම දක්වා අවම වශයෙන් මීටර් 1 ක ඉඩක් වෙන් කළ යුතුය.

XII. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් හෝ ඊට වැඩි ගණනකට අයත් වන්නේනම්, එම බිම් කොටස සඳහා ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් හෝ ඇතුළත් පළාත් පාලන ආයතනය මඟින් අනෙකුත් පළාත් පාලන ආයතන වල එකඟතාවය මත අනුමැතිය ලබා දීම සඳහා තීරණය කරනු ලැබේ.

XIII. කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට වැටෙන සේ පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට හසුවන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය ලබන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මඟිනි. එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය. තවද සංරක්ෂණ කලාප සඳහා මෙම නියමතාවය අදාළ නොවේ.

XIV. යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටී ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඇතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ. යම්හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇතිවිටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය.

XV. කලාපීකරණ සැලැස්මේ පෙන්වා දී ඇති මායිම්, භෞතික මායිම් හා භූගෝලීය ඛණ්ඩාංක යන දෙකෙන්ම නිර්වචනය කර ඇති අවස්ථාවකදී මායිම් වෙනසක් සිදු වුවහොත් ඒ පිලිබඳ අවසාන තීරණය නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතු වේ.

XVI. කලාපීකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත් එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිලිබඳ තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

XVII. යෝජිත කලාපීකරණ සැලැස්ම තුල අනුමත භාවිතයන් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සදහා සහ පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සදහා අනුමැතිය ලබා දීම පිලිබදව සලකා බලනු ලැබිය හැකි අතර භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යැයි සනාථ වන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස නියම කරනු ලැබිය හැක.

XVIII. ප්‍රදේශයේ මංසන්ධි ආශ්‍රිතව මාර්ග දෙපස වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස් තුළ හෝ මාර්ග රක්ෂිත තුළ විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ සමාන ඉදිකිරීම් සඳහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් සිදු නොකරනු ලබයි.

XIX. සුසාන භූමියක්/ආදාහනාගාරයක් සඳහා යම්කිසි ඉඩමක් වෙන් කරනු ලබන්නේ නම් අදාළ පළාත් පාලන ආයතනයේ නිර්දේශ ලබාගත යුතුය.

XX. සංවර්ධන සැලැස්ම තුල හඳුනාගෙන නොමැති නමුත් පහත් බිම්, වගුරු බිම්, කුඹුරු, තෙත්බිම් හෝ ඕවිට හෝ වෙනත් එවැනි ඉඩම් සදහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියෙහි මූලික සැලසුම් නිරාකරණය ලබාගත යුතුය.

XXI. යම් සංවර්ධනයක් සඳහා කුළුණු දොඹකර භාවිතා කරනු ලබන්නේ නම් ඒ සදහා සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ නිර්දේශ සහ රක්ෂණාවරණයක් සහිතව අවසර පත්‍රයක් අදාළ සංවර්ධනය සදහා අනුමැතිය ලබාදුන් ආයතනයෙන් ලබාගතයුතුය.

XXII. පාසල් හා ළමා නිවාස සදහා ගොඩනැගිලි ඉදිකිරීමේදී විවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් 50% ක ප්‍රමාණයක් විවෘතව තැබිය යුතුය.

XXIII. රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට අපොහොසත් වන්නේනම්, උපරිමය මීටර 500ක දුරකින් පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය.

XXIV. අධිකාරිය විසින් හඳුනා ගනු ලබන ප්‍රදේශ වල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය.

XXV. මෙම සැලසුම් ප්‍රදේශය තුල ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, යනාදී රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් හා සංවර්ධන යෝජනා ලබා ගත යුතු වේ.

XXVI. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිර්දේශයන්ට යටත්ව සිදුකරනු ලබන කැණීම් කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට යටත්ව මූලික සැලසුම් නිරාකරණය ලබා දීම සලකා බැලිය හැකිය. තවද, එකී කැණීම් කටයුතු සිදුකරන ස්ථාන ආශ්‍රිතව ස්ථානගතවී තිබෙන ඉදිකිරීම් හෝ වෙනත් භාවිතයන් වලට එම කැණීම් කටයුතු තුළින් සිදුවන හානිය වැළැක්වීම සඳහා සුදුසු වැඩපිළිවලක් භූ විද්‍යා සමීක්ෂණ

හා පතල් කාර්යාංශයේ උපදෙස් පරිදි සකස් කිරීමට සහ එම ආයතනයේ නිර්දේශ අනුව කැණීම් කරන ලද ඉඩම ඉදිරි සංවර්ධන කටයුතු සඳහා භාවිත කළ හැකි තත්ත්වයට පත් කිරීමට සංවර්ධනකරු විසින් කටයුතු කළ යුතුය.

XXVII. යම්කිසි නීතිගත සැලසුම්, සංවර්ධන හෝ ගොඩනැගිලි රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රයෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතුවේ.

XXVIII. ගම්පහ නාගරික ප්‍රදේශය අත්තනගලු ඔය පහළ ද්‍රෝණියේ පිහිටා ඇති ගංවතුර අවදානම් සහිත ප්‍රදේශයකි. ඒ අනුව ගංවතුර මගින් වන හානිය අවම කරගැනීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් සිදු කිරීමේදී පහත සඳහන් මාර්ගෝපදේශ අනුව අදාළ ඉදිකිරීම් සිදු කිරීම යෝග්‍ය වේ.

I. ප්‍රදේශයේ අපේක්ෂිත ගංවතුර මට්ටමට වඩා ඉහළ මට්ටමකින් අත්තිවාරම් ඉදිකිරීම. (මෙහිදී ප්‍රදේශයේ ඉහළම වාර්තාගත ගංවතුර මට්ටමට වඩා උසින් ගොඩනැගිල්ල සැලසුම් කිරීම යෝග්‍ය වේ).

II. ගංවතුර පැමිණෙන දිශාවට අවම පළලක්/ ප්‍රදේශයක් මුහුණලා පවතින පරිදි ගොඩනැගිල්ල ඉදිකිරීම යෝග්‍ය වේ.

III. ගොඩනැගිලි ඉදිකිරීමේදී කොන්ක්‍රීට්, ප්‍රතිකාර කළ දැව සහ ජල ආරක්ෂිත ආලේපන වැනි ජල හානියට ඔරොත්තු දෙන ගංවතුර-ප්‍රතිරෝධී ද්‍රව්‍ය භාවිතා කිරීම සුදුසුය.

IV. ස්වාභාවික ජල ප්‍රවාහයට බාධා නොවන පරිදි සහ පාංශු ඛාදනය අවම කිරීමට භූමි අලංකරණ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම යෝග්‍ය වේ.

# 08

පරිච්ඡේදය



# කලාපීකරණ රෙගුලාසි

# පරිච්ඡේද 08
# කලාපීකරණ රෙගුලාසි

## 8.1 ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ කලාපීකරණ රෙගුලාසි.

ගම්පහ සංවර්ධන සැලැස්ම මඟින් ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කලාප 07 සඳහා බලපැවැත්වෙන කලාපීකරණ නියමනා පහත දක්වා ඇත.

### 8.1.1 අධි ඝනත්ව නේවාසික කලාපය (R1)

*වගුව 8.1.1 : අධි ඝනත්ව නේවාසික කලාපය (R)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය |
| උප කලාපය | අධි ඝනත්ව නේවාසික කලාපය |
| කලාප ලක්ෂණ | ආයතනික කලාපයටත් කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය මුල් කරගත් අධි ඝනත්ව වාණිජ තීරයටත් මැදිව පිහිටා ඇති මෙම අධි ඝනත්ව නේවාසික කලාපය, ඉහළ නේවාසික ජනගහනයක් ආකර්ෂණය කරගත හැකි නේවාසික ප්‍රදේශයක් ලෙස ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 17 |
| කලාප අංකය | R1 |
| කලාප සංගුණකය | 2.60 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ ගල් කැණීම් / පස් කැණීම් සඳහා අවසර ලබා දීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිර්දේශයන්ට අනුව මෙම අධිකාරිය විසින් සලකා බලනු ලැබේ. |

## 8.1.2 මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2)

*වගුව 8.1.2 : මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය |
| කලාප ලක්ෂණ | ගම්පහ සහ යක්කල නගර වලට අතරමැදිව උතුරින් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල සීමාවට මායිම්ව පිහිටි මෙම කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු නේවාසික කලාපයක් ලෙස සංවර්ධන කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක :17 |
| කලාප අංකය | R2 |
| කලාප සංගුණකය | 2.10 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ ගල් කැණීම් / පස් කැණීම් සඳහා අවසර ලබා දීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිර්දේශයන්ට අනුව මෙම අධිකාරිය විසින් සලකා බලනු ලැබේ. |

## 8.1.3 අධි ඝනත්ව වාණිජ කලාපය (C1)

*වගුව 8.1.3 :අධි ඝනත්ව වාණිජ කලාපය (C1)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | වාණිජ කලාපය |
| උප කලාපය | අධි ඝනත්ව වාණිජ කලාපය |
| කලාප ලක්ෂණ | මෙම කලාපය කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය මුල් කරගත් අධි ඝනත්ව වාණිජ තීරයක් ලෙස සංවර්ධන කිරීම අපේක්ෂා කරන අතර යක්කල සහ මිරිස්වත්ත මංසන්ධින් මුල් කොටගෙන ප්‍රශස්ත වාණිජ භාවිතයක් ඇති කිරීමත් එතුළින් නගරය තුළ වාණිජ ක්‍රියාකාරකම් වැඩි කිරීමත් කොළඹ - නුවර ප්‍රධාන මාර්ග තීරයේ විභවතාව මැනවින් උකහාගෙන නගර ආර්ථිකය වැඩිදියුණු කිරීමත් අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 17 |
| කලාප අංකය | C1 |
| කලාප සංගුණකය | 2.90 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතුය. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ගුණාත්මක වාණිජ සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින්, කුඩා බිම් කොටස් ඒකාබද්ධ වන ආකාරයේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලබන අතර, පවතින ඉඩම කැබලි එකතු කර සිරස් සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් වන්නේනම් 10% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ. |

## 8.1.4 මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2)

*වගුව 8.1.4 : මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | වාණිජ කලාපය |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය |
| කලාප ලක්ෂණ | කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයට මැදිව යක්කල ආයුර්වේද සංචාරක කලාපයට මායිම්ව සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට මායිම්ව පිහිටා ඇති මෙම කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු වාණිජ කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 17 |
| කලාප අංකය | C2 |
| කලාප සංගුණකය | 2.30 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ගුණාත්මක වාණිජ සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින්, කුඩා බිම් කොටස් ඒකාබද්ධ වන ආකාරයේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලබන අතර, පවතින ඉඩම කැබලි එකතු කර සිරස් සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් වන්නේනම් 10% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ. |

### 8.1.5 අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1)

*වගුව 8.1.5 : අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපයේ නම | මිශ්‍ර සංවර්ධන කලාපය |
| උප කලාපයේ නම | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය |
| කලාප ලක්ෂණ | ගම්පහ නගර මධ්‍යය පාදක වූ, යෝජිත ප්‍රවාහන සහ ගමනාගමන සංවර්ධන අවස්ථාවන්හි වාසිය ලබා ගනිමින් මෙම කලාපය තුළ වාණිජ, සේවා ආයතන, අධ්‍යාපනික, ගමනාගමන, නේවාසික යන භාවිතයන් මුල් කොටගත් සීඝ්‍ර සංගත සංවර්ධනයක් ඇති කිරීම සඳහා සහ ගමනාගමනය මුල් වූ නගරයක් ලෙස පදිකයන් සඳහා ඇවිදීමේ හැකියාව වැඩිකෙරෙන සහ ගම්පහ අගනගර ලාක්ෂණිකයන් මැනවින් පිළිබිඹු වන පරිදි සංවර්ධන සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි සකස්කොට සංවර්ධන කටයුතු දිරිගැන්වීම සිදු කෙරේ. මෙහිදී මූලිකව ප්‍රවාහන සහ ගමනාගමන සංවර්ධන අවස්ථා ලෙස මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ වන ගම්පහ අන්තර් හුවමාරුව, ගම්පහ දුම්රිය නැවතුම්පොළ සහ ඒ ආශ්‍රිතව ගොඩනැගීමට යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයන් සඳහන් කළ හැක. තවද මෙම කලාපය තුළ ගුණාත්මක වාණිජ සංවර්ධනයක් කරා යෑමට බලාපොරොත්තුවන බැවින් කුඩා බිම් කොටස් ඒකාබද්ධ වන ආකාරයේ ව්‍යාපෘති සඳහා වැඩි ඉඩක් ලබා දෙනු ඇත. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 17 |
| කලාප අංකය | MD1 |
| කලාප සංගුණකය | 3.90 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ගම්පහ- මිරිස්වත්ත මාර්ගය, ගම්පහ යක්කල මාර්ගය, ගම්පහ -ජා ඇළ මාර්ගය, ගම්පහ- පැරණි මිනුවන්ගොඩ මාර්ගය ,ගම්පහ- ඔරුතොට මාර්ගය, මහ වීදිය, මේරි බිසෝ මාවත, බෞද්ධාලෝක මාවත, මංගල |

| | |
|---|---|
| | මාවත,මාර්කට් වීදිය, උසාවි පාර යන මාර්ග වලට මුහුණලා වාණිජ කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී ගොඩනැගිල්ලේ අවම උස මීටර 7 කට නොඅඩු වන ලෙස සැලසුම් කළ යුතුය.<br><br>▪ මෙම කලාපය තුළ ගම්පහ- මිරිස්වත්ත මාර්ගය (ගම්පහ නගර මධ්‍යයේ සිට ගම්පහ මූලික රෝහල තෙක්), ගම්පහ-යක්කල මාර්ගය (ගම්පහ මූලික රෝහල ඉදිරිපිට), ගම්පහ -ජා ඇළ මාර්ගය, ගම්පහ-මිනුවන්ගොඩ මාර්ගය ,ගම්පහ-ඔරුතොට මාර්ගය (ගුවන් පාලම අසල සිට ගල් පල්ලිය තෙක්), මහ වීදිය, මේරි බිසෝ මාවත, බෞද්ධාලෝක මාවත, මංගල මාවත,මාර්කට් වීදිය, උසාවි පාර යන මාර්ග පදිකයන්ගේ ඇවිදීමේ හැකියාව ප්‍රවර්ධන සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන අතර පදික මංතීරු (පදික වේදිකා) හා වෘක්ෂලතා තීරයන් ඇති කිරීම අපේක්ෂා කෙරේ. එම පදික මංතීරු මත කිසිදු ආකාරයක ස්ථිර හෝ තාවකාලික ඉදිකිරීමක්,නාම පුවරු ප්‍රදර්ශනය කිරීමක් හෝ වෙළඳාමක් හෝ කිසිදු ආකාරයක පදික භාවිතයට අවහිර වන ක්‍රියාවන් සිදු කිරීම කිසි ලෙසකින්වත් සිදු නොකළ යුතු අතර එවැනි ඉදිකිරීම් හෝ ක්‍රියාකාරකම් වලට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ .<br><br>▪ මෙම කලාපය තුළ ගුණාත්මක වාණිජ සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින්, කුඩා බිම් කොටස් ඒකාබද්ධ වන ආකාරයේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලබන අතර, පවතින ඉඩම කැබලි එකතු කර තිරස් සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් වන්නේනම් 10% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ.<br><br>▪ මෙම කලාපය තුළ සිදුවන නේවාසික සංවර්ධනයන්හිදී මහල් නිවාස සංකීර්ණ භාවිතය ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කරන අතර මහල් නිවාස සංකීර්ණ ව්‍යාපෘති සඳහා මාර්ගයේ අවම පළල මීටර 6 ක් සළකා බලනු ලබන අතර මීටර 9ක් වන සේ සංවර්ධනය කරන ඉඩම තුළින් වෙන් කළ යුතුය. |

| | |
|---|---|
| | ▪ මෙම කලාපය තුළ, ගම්පහ- ජා ඇළ , ගම්පහ - පැරණි මිනුවන්ගොඩ පාර හා ගම්පහ- නව මිනුවන්ගොඩ පාර අතර මැද පිහිටා ඇති පෞද්ගලික අධ්‍යාපන පර්ෂදය තුළ පවතින ඉඩම කැබලි එකතු කර ඒකාබද්ධ සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් වන්නේනම් 10% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලබන අතර ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර 6ක් විය යුතුය.<br><br>▪ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අංක 2235/54-2021 ඇති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2021.07.08 දින ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන හා සැලසුම් රෙගුලාසි වල 17 වන උපලේඛනය "අ" ආකෘතියෙහි සඳහන් මධ්‍යම අධිවේගී මාර්ග ආශ්‍රිත කලාප සඳහා වන සංවර්ධන රෙගුලාසි මෙම කලාපය තුළ බල පැවැත්වේ. |

### 8.1.6 අධි ඝනත්ව ආයතනික කලාපය (I1)

*වගුව 8.1.6 : අධි ඝනත්ව ආයතනික කලාපය (I1)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | ආයතනික කලාපය |
| උප කලාපය | අධි ඝනත්ව ආයතනික කලාපය |
| කලාප ලක්ෂණ | මෙම කලාපය ගමනාගමනය මුල් වූ මිශ්‍ර සංවර්ධන කලාපයට යාබදව පවතින කලාපය වේ. ගම්පහ දිස්ත්‍රික්කයේ අගනගරය ලෙස, රාජ්‍ය සේවා ආයතන පර්ෂදයක් ඇති මෙම කලාපය ගමනාගමනය මුල් වූ නගර මාධ්‍යයෙන් ඔබ්බට විහිදී ගිය, ප්‍රශස්ථ ආයතනික හා අධ්‍යාපනික සේවා පර්ෂදයක් ඇති කිරීමත් , ගමනාගමනය මුල් වූ සංගත නගර මාධ්‍යයට ආසන්නයේ පවතින, අනාගත නේවාසික ජනඝනය ආකර්ෂණය කරගත හැකි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමත් අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 17 |
| කලාප අංකය | I1 |
| කලාප සංගුණකය | 2.65 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ සිදුවන නේවාසික සංවර්ධනයන්හිදී මහල් නිවාස සංකීර්ණ භාවිතය ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කරන අතර මහල් නිවාස සංකීර්ණ ව්‍යාපෘති සඳහා මාර්ගයේ අවම පළල මීටර 6 ක් සළකා බලනු ලබන අතර මීටර 9ක් වන සේ සංවර්ධනය කරන ඉඩම තුළින් වෙන් කළ යුතුය.<br><br>▪ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අංක 2235/54-2021 ඇති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2021.07.08 දින ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන හා සැලසුම් රෙගුලාසි වල 17 වන උපලේඛනය “අ” ආකෘතියෙහි සඳහන් මධ්‍යම අධිවේගී මාර්ග ආශ්‍රිත කලාප සඳහා වන සංවර්ධන රෙගුලාසි මෙම කලාපය තුළ බල පැවැත්වේ. |

## 8.1.7 මධ්‍යම ඝනත්ව සංචාරක කලාපය (T2)

*වගුව 8.1.7 : මධ්‍යම ඝනත්ව සංචාරක කලාපය (T2)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | සංචාරක කලාපය |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව සංචාරක කලාපය |
| කලාප ලක්ෂණ | කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය දෙස් විදෙස් සංචාරකයන් විසින් භාවිත කරන සංචාරක මාර්ග තීරයක් වන අතර එම මාර්ග තීරයේ වටිනාකම භාවිතයට ගනිමින් මෙම ප්‍රදේශයේ ප්‍රාදේශීය අනන්‍යතාවය පිළිබිඹු වන එනම් ආයුරුවේද වෛද්‍ය කලාපයක් ලෙස ප්‍රචලිත යක්කල ආයුරුවේද විශ්වවිද්‍යාල අවට කලාපය, කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය භාවිතා කරන දෙස් විදෙස් සංචාරකයන්ගේ ආයුර්වේද සහ සුවතා සංචාරක ගිමන්පළක් ලෙස ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 17 |
| කලාප අංකය | I2 |
| කලාප සංගුණකය | 1.60 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතුය. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.4 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ආයුර්වේද සහ සුවතා සංචාරක ප්‍රවර්ධනය සඳහා යොදා ගනු ලබන භාවිතයන් නම්, එම භාවිතය සඳහා 20% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ. |

## 8.2 ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ කලාපීකරණ රෙගුලාසි.

ගම්පහ සංවර්ධන සැලැස්ම මඟින් ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කලාප 07 සදහා බලපැවැත්වෙන කලාපීකරණ නියමතා පහත දක්වා ඇත.

### 8.2.1 අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD 1)

*වගුව 8.2.1 : අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය (MD1)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | මිශ්‍ර සංවර්ධන කලාපය |
| උප කලාපය | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය |
| කලාප ලක්ෂණ | ගනේමුල්ල නගරය කේන්ද්‍ර කොටගෙන ඇති මෙම කලාපය ගනේමුල්ල දුම්රිය ස්ථානයත්, ගනේමුල්ල ප්‍රධාන බස් නැවතුම්පලත් සහ කඩවත- ගනේමුල්ල මාර්ගය හරහා කඩවත අන්තර් හුවමාරුවට ඉතා ආසන්නයේ පිහිටා ඇති බැවින් ඉහළ ජනගහන ආකර්ශනයක් පවතින ප්‍රදේශයක් වන අතර එම ප්‍රදේශය වාණිජ, ආයතනික,සේවා, නේවාසික යන භාවිතයන් මුල්කොටගත් අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | MD1 |
| කලාප සංගුණකය | 2.60 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ගුණාත්මක වාණිජ සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින්, කුඩා බිම් කොටස් ඒකාබද්ධ වන ආකාරයේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලබන අතර, පවතින ඉඩම කැබලි එකතු කර තිරස් සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් වන්නේනම් 10% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ.<br>▪ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අංක 2235/54-2021 ඇති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2021.07.08 දින ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන හා සැලසුම් රෙගුලාසි වල 17 වන උපලේඛනය “අ” ආකෘතියෙහි සඳහන් මධ්‍යම අධිවේගී මාර්ග ආශ්‍රිත කලාප සඳහා වන සංවර්ධන රෙගුලාසි මෙම කලාපය තුළ බල පැවැත්වේ. |

## 8.2.2 මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) I

*වගුව 8.2.2 :මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) I*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය |
| කලාප ලක්ෂණ | ගනේමුල්ල නගරය ආසන්නයේ පිහිටා ඇති මෙම කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | (R2) I |
| කලාප සංගුණකය | 1.50 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | - |

### 8.2.3 මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) II

*වගුව 8.2.3 : මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය (R2) II*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය |
| කලාප ලක්ෂණ | ගනේමුල්ල නගරය ආසන්නයේ පිහිටා ඇති මෙම කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | (R2) II |
| කලාප සංගුණකය | 1.50 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | - |

### 8.2.4 අධි ඝනත්ව නේවාසික කලාපය (R1)

*වගුව 8.2.4 : අධි ඝනත්ව නේවාසික කලාපය (R1)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය |
| උප කලාපය | අධි ඝනත්ව නේවාසික කලාපය |
| කලාප ලක්ෂණ | කඩවත අන්තර් හුවමාරුවට ආසන්නව පිහිටා ඇති නේවාසික කලාපයක් වන මෙය දැනට පවතින නේවාසික ආකර්ෂණය පදනම්කොටගෙන හා සංවර්ධන විභවතාව පදනම් කොටගෙන අධි ඝනත්වයකින් යුතු නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | (R1) |
| කලාප සංගුණකය | 2.30 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | - |

### 8.2.5 මධ්‍යය ඝනත්ව වාණිජ කලාපය (C2)

*වගුව 8.2.5 : මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය (C2)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | වාණිජ කලාපය |
| උප කලාපය | මධ්‍යය ඝනත්ව වාණිජ කලාපය |
| කලාප ලක්ෂණ | කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය මැදි කොට මිරිස්වත්ත, යක්කල අනු නගර අයත් අධි ඝනත්ව වාණිජ කලාපයට මායිම්ව පිහිටා ඇති මෙම කලාපය මධ්‍යම ඝනත්වයකින් යුතු වාණිජ කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | (C2) |
| කලාප සංගුණකය | 2.40 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතුය. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ගුණාත්මක වාණිජ සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින්, කුඩා බිම් කොටස් ඒකාබද්ධ වන ආකාරයේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලබන අතර, පවතින ඉඩම කැබලි එකතු කර ඒකාබද්ධ සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් වන්නේනම් 10% ක අමතර ගෙබිම් අනුපාතයක් ලබා දෙනු ලැබේ. |

## 8.2.6 මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය (In2)

*වගුව 8.2.6 : මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය (In2)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | කාර්මික කලාපය |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව කාර්මික කලාපය |
| කලාප ලක්ෂණ | බියගම අපනයන සැකසුම් කලාපයට ආසන්නයේ පවතින කලාපයක් ලෙස හා දැනටමත් විභවතාවක් පෙන්නුම් කෙරෙන කෘෂිකර්මාන්තය පදනම් කරගත් අගය එකතු කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන කර්මාන්ත ආර්ථිකය තව දුරටත් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ඇත. මෙමගින් ප්‍රදේශයට සෘජු සහ වක්‍ර රැකියා අවස්ථාද බිහි කෙරෙන අගය එකතු කරන ලද කෘෂි නිෂ්පාදන කර්මාන්ත ආයෝජන අවස්ථා පුළුල් කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | (In2) |
| කලාප සංගුණකය | 2.00 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතුය. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ රථවාහන නැවතුම් පිළිබඳ රෙගුලාසිවලට අනුව කර්මාන්ත ආශ්‍රිත භාවිතයන් සඳහා බල පැවැත්වෙන සම්මත වාහන අවශ්‍යතාවයෙන් 50% නිදහස් කරනු ලැබේ.<br>▪ කර්මාන්ත භාවිතයන් සඳහා අවම ප්‍රවේශ මාර්ග පළල මීටර 9 විය යුතු අතර පවතින මාර්ගයන්හි පළල මීටර 6 ට නොඅඩු වන අවස්ථාවන්හිදී යෝජිත මාර්ග පළල සපුරාලීම සඳහා ඉඩම් බැහැර කිරීම සලකා අවසර ලබා දීම සලකා බැලිය හැක. |

### 8.2.7 අඩු ඝනත්ව නේවාසික කලාපය (R3)

*වගුව 8.2.7 : අඩු ඝනත්ව නේවාසික කලාපය (R3)*

| | |
|---|---|
| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය |
| උප කලාපය | අඩු ඝනත්ව නේවාසික කලාපය |
| කලාප ලක්ෂණ | අත්තනගලු ඔය ජල පෝෂක ප්‍රදේශයට අයත් අධි සංවේදී, වාර්ෂික ගංවතුර තත්ත්වයෙන් දැඩි බලපෑමක් ඇති මෙම ප්‍රදේශය පරිසර සංවේදීතාවය සැලකිල්ලට ගෙන අඩු ඝනත්ව නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක : 18 |
| කලාප අංකය | (R3) |
| කලාප සංගුණකය | 1.45 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය | වගුව8.4.1 සහ වගුව8.4.2 හි ආකෘතියට අනුකූල විය යුතුය. |
| අවසරලත් උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය | වගුව8.4.3 ආකෘතිය අනුව දැක්විය යුතු අතර මෙම කලාපය තුළ ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා භාවිත සඳහා උපරිම ගෙබිම් ආවරණ ප්‍රතිශතය 50% කි. |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | වගුව8.4.3 ආකෘතිය අනුව විය යුතුය. |
| අවසරලත් භාවිතාවන් | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්. |
| අවම බිම් ප්‍රමාණය | වගුව8.4.5 හි දැක්වෙන ආකෘතියෙහි මෙම කලාපයෙහි අවසරලත් අනු භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණය. |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ▪ මෙම කලාපය තුළ ඉදිකරනු ලබන සියළු ගබඩා, ගුදම් හා කර්මාන්තශාලා වල ඉඩමේ මායිම වටා ඇතුළතින් මීටර 03 ක ස්වාරක්ෂක කලාපයක් සඳහා ශාක තීරයක් පවත්වා ගත යුතු අතර භූ දර්ශන සැලැස්ම මෙම අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.<br>▪ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අංක 2235/54-2021 ඇති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2021.07.08 දින ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන හා සැලසුම් රෙගුලාසි වල 17 වන උපලේඛනය “අ” ආකෘතියෙහි සඳහන් මධ්‍යම අධිවේගී මාර්ග ආශ්‍රිත කලාප සඳහා වන සංවර්ධන රෙගුලාසි මෙම කලාපය තුළ බල පැවැත්වේ. |

## 8.3 ගම්පහ මහා නගර සභා හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංරක්ෂණ කලාපීකරණ රෙගුලාසි.

ගම්පහ සංවර්ධන සැලැස්ම මඟින් ගම්පහ මහා නගර සභා හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් දෙකම ආවරණය වන පරිදි ප්‍රධාන සංරක්ෂණ කලාප 02ක් හඳුන්වා දී ඇති අතර එම කලාප සඳහා බල පැවැත්වෙන කලාපීකරණ රෙගුලාසි පහත දක්වා ඇත.

### I. මධ්‍යම සංවේදී පාරිසරික සංරක්ෂණ කලාපය

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

### අ. මධ්‍යම සංවේදී පරිසර සංරක්ෂණ කලාපය - අනුමත භාවිතයන්

i. තෙත්බිම් ස්වභාවික උද්‍යාන
ii. පරිසර හිතකාමී අවන්හල්- සම්පූර්ණ වර්ග මීටර 100 ක උපරිමයකට යටත්ව (කුළුණු මත ඉදිවූ)
iii. එලිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන
iv. තෙත්බිම් කෞතුකාගාර - සම්පූර්ණ වර්ග මීටර 100 ක උපරිමයකට යටත්ව (කුළුණු මත ඉදිවූ)
v. කබානා - උපරිම වර්ග මීටර 50 බැගින් වූ කබානා (කුළුණු මත ඉදිවූ )
vi. ජලාශ්‍රිත ගමනාගමනය (අත්තනගලු ඔය ආශ්‍රිත)
vii. ජාතික වැදගත් කමක් සහිත රජයේ අනුමත පොදු අපරවයුහ ව්‍යාපෘති
viii. නව වාරිමාර්ග ඉදිකිරීම /ගංවතුර ආරක්‍ෂණ ඉදිකිරීම
ix. පාරිසරික අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා වූ ගොඩනැගිලි - සම්පූර්ණ වර්ග මීටර 100 ක උපරිමයකට යටත්ව (කුළුණු මත ඉදිවූ)

## ආ. මධ්‍යම සංවේදී පරිසර සංරක්ෂණ කලාපයේ අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි

*වගුව 8.3. 1:මධ්‍යම සංවේදී පරිසර සංරක්ෂණ කලාපයේ අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි*

| අංකය | කලාප විශේෂිත සංවර්ධන කොන්දේසි | |
|---|---|---|
| 1. | ගංවතුර රැඳවුම් ධාරිතාව | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාව මඟින් අනුමත මුලික සැලැස්මට අනුව පාලනය විය යුතු අතර, එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ද අනුකූල විය යුතුය. |
| 2. | කුළුණු මත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන අවම බිම් කට්ටි ප්‍රමාණය | අක්කර 01 |
| | | අක්කරයකට අඩු කුඩා බිම් කට්ටි සඳහා ද අනුමත භාවිතයන් සමාන වන නමුත්, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩ දෙනු නොලැබේ. |
| 3. | කුළුණු මත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රවේශ මාර්ගයේ අවම පළල | අවම පළල මීටර 9 ක් විය යුතු අතර ප්‍රවේශ මාර්ගයේ දිග මීටර 200කට නොවැඩි වේ නම් ප්‍රවේශ මාර්ගයේ අවම පළල මීටර 6 ක් දක්වා ලිහිල් කළ හැකිය. |
| 4. | අවසර ඇති උපරිම ගොඩනැගිලි උස | කුළුණු උස හැර මීටර් 7 කි.<br>(නිරීක්ෂණ මධ්‍යස්ථාන හැර ) |

## II. අඩු සංවේදී පරිසර සංරක්ෂණ කලාපය

පවතින කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ රට සම්බන්ධ දෙනිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ, බස්නාහිර පළාතේ තෙත්බිම් ආශ්‍රිත කෘෂි කර්මාන්තය සිදු කෙරෙන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

## අ. අඩු සංවේදී පරිසර සංරක්ෂණ කලාපය - අනුමත භාවිතයන්

i. ගොවිජන සංවර්ධන පනතට අනුකූල වන කෘෂිකාර්මික භාවිතයන්.
ii. තෙත්බිම් ආශ්‍රිතව සිදු කරන කෘෂිකර්මාන්තය.
iii. භූමිය යථා තත්වයට පත් කිරීමේ කටයුතු වලට යටත්ව භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ කොන්දේසි වලට යටත්ව සිදුකරනු ලබන කැණීම් කටයුතු (මැටි වලවල් සහ පස් කැණීම්)
iv. පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු.

## ආ. අඩු සංවේදී පරිසර සංරක්ෂණ කලාපයේ අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි

I. මෙම කලාපයේ කිසිදු ඉදිකිරීමක් සදහා අවසර නොමැත.

II. ගම්පහ නාගරික බල ප්‍රදේශයේ විදුලිය, ජලසැපයුම, දුරකථන, මහා මාර්ග, දුම්රිය මාර්ග ආදී ජාතික වශයෙන් වැදගත් පොදු අපර ව්‍යුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ අවස්ථාවකදී, ඉහත කොන්දේසි ලිහිල් කළ හැක.

## III. ගම්පහ නාගරික බල ප්‍රදේශයේ යෝජිත තෙත්බිම් කලාප සඳහා වූ මාර්ගෝපදේශ

I. මෙම කලාපීකරණය ගම්පහ මහා නගර සභා හා ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මධ්‍යම සංවේදී පරිසර සංරක්ෂණ කලාපය සහ අඩු සංවේදී පරිසර සංරක්ෂණ කලාපය තුළ පිහිටි සියළු තෙත්බිම් සඳහා පමණක් වලංගු වේ.

II. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත් බිම් වල සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු උපලේඛනයේ සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.

III. මෙම කලාප තුළ අනුමත භාවිතයන්ට අනුකූලව සංවර්ධනය කිරීමට ප්‍රථමව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතන වල නිර්දේශයන්ට යටත්ව නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණය ලබා ගත යුතු අතර එහි සඳහන් කොන්දේසි ඉටු කිරීමෙන් පසුව අදාළ පළාත් පාලන ආයතනයෙන් හෝ නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා ගත යුතුයි.

IV. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් අංක. 1662/ 17 හා 2010.07.14 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ඇළ මාර්ග රක්ෂිත බිම් තීරු සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඇළ මාර්ග සහ ජලාශ සඳහා අදාළ රක්ෂිත බිම් තීරු පවත්වා ගත යුතුය.

V. ගම්පහ නාගරික බල ප්‍රදේශයට අයත් පාරිසරික සංවේදී වටිනාකමක් සහිත තෙත්බිම්වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හැර වෙනත් ශාක ඉවත් නොකළ යුතුය.

VI. ගම්පහ නාගරික බල ප්‍රදේශයේ යෝජිත තෙත්බිම් කලාප වල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.

VII. නාගරික බල ප්‍රදේශයෙහි තෙත්බිම් වල අනුමත කාර්යයන් වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.

VIII. මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

IX. ගම්පහ නාගරික බල ප්‍රදේශයට අයත් තෙත්බිම් වල කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය.(ගෘහස්ථ, ආයතනික, කාර්මික, වෛද්‍ය, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය).

X. ගම්පහ නාගරික බල ප්‍රදේශයට අයත් තෙත්බිම් වලට අපජලය බැහැර නොකළ යුතුය. නමුත් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයට යටත්ව පිරිපහදු කළ ජලය පමණක් මුදාහැරිය හැකිය.

*සිතියම8.1 :යෝජිත තෙත්බිම් සංරක්ෂණ සැලැස්ම*




මූලාශ්‍රය: පරිසර හා භූ දර්ශන අංශය, නා.සං.අධි, 2024

## 8.4 උපලේඛණ

*වගුව 8.4.1 : අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි (2021) හි 06 වන උපලේඛනයේ "අ" ආකෘතිය : (සංශෝධිත)*

| ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | කලාපිය සංගුණකය = 0.75-0.99 | | | | කලාපිය සංගුණකය =1.00-1.24 | | | | කලාපිය සංගුණකය =1.25-1.49 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | |
| | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර්12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි |
| 150 - 250ට අඩු | 1.3 | 1.3 | 1.4 | 1.4 | 1.6 | 1.7 | 1.8 | 1.9 | 2.0 | 2.2 | 2.3 | 2.4 |
| 250 - 375 ට අඩු | 1.3 | 1.6 | 1.8 | 2.0 | 1.8 | 2.2 | 2.4 | 2.7 | 2.2 | 2.7 | 3.0 | 3.3 |
| 375 - 500 ට අඩු | 1.3 | 1.6 | 1.9 | 2.1 | 1.9 | 2.2 | 2.5 | 2.8 | 2.3 | 2.8 | 3.2 | 3.4 |
| 500 - 750 ට අඩු | 1.4 | 1.7 | 2.0 | 2.2 | 2.0 | 2.3 | 2.7 | 3.0 | 2.4 | 3.0 | 3.4 | 3.5 |
| 750 - 1000 ට අඩු | 1.5 | 1.8 | 2.2 | 2.5 | 2.1 | 2.4 | 2.9 | 3.3 | 2.6 | 3.0 | 3.6 | 4.0 |
| 1000 - 1500 ට අඩු | 1.6 | 1.9 | 2.3 | 2.7 | 2.2 | 2.5 | 3.0 | 3.6 | 2.7 | 3.1 | 3.8 | 4.5 |
| 1500 - 2000 ට අඩු | 1.7 | 2.1 | 2.5 | 3.0 | 2.3 | 2.7 | 3.4 | 4.0 | 2.9 | 3.4 | 4.2 | 5.0 |
| 2000 - 2500 ට අඩු | 1.8 | 2.3 | 2.7 | 3.1 | 2.4 | 2.8 | 3.5 | 4.2 | 3.0 | 3.5 | 4.4 | 5.4 |
| 2500 - 3000 ට අඩු | 1.9 | 2.4 | 3.0 | 3.6 | 2.5 | 3.2 | 4.0 | 4.7 | 3.1 | 3.8 | 4.7 | 5.8 |
| 3000 - 3500 ට අඩු | 2.0 | 2.5 | 3.1 | 3.7 | 2.6 | 3.4 | 4.2 | 5.0 | 3.2 | 4.0 | 5.0 | 6.2 |
| 3500 - 4000 ට අඩු | 2.2 | 2.6 | 3.3 | 3.9 | 2.8 | 3.6 | 4.3 | 5.3 | 3.3 | 4.3 | 5.5 | 6.6 |
| 4000ට වැඩි | 1.5 | 1.9 | 2.3 | 2.8 | 2.5 | 2.8 | 3.5 | 4.0 | 3.0 | 3.8 | 4.5 | 5.5 |

| ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | කලාපිය සංගුණකය = 1.50 - 1.74 | | | | කලාපිය සංගුණකය = 1.75-1.99 | | | | කලාපිය සංගුණකය =2.00-2.24 | | | | කලාපිය සංගුණකය =2.25-2.49 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | |
| | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි |
| 150 - 250ට අඩු | 2.4 | 2.6 | 2.7 | 2.8 | 2.8 | 3.0 | 3.2 | 3.3 | 3.0 | 3.4 | 3.6 | 3.8 | 3.0 | 3.4 | 3.6 | 4.0 |
| 250 - 375 ට අඩු | 2.6 | 3.2 | 3.6 | 4.0 | 3.0 | 3.4 | 4.3 | 4.7 | 3.2 | 3.6 | 4.5 | 4.5 | 3.5 | 3.8 | 4.5 | 5.0 |
| 375 - 500 ට අඩු | 2.7 | 3.3 | 3.8 | 4.2 | 3.2 | 3.5 | 4.5 | 5.0 | 3.4 | 3.7 | 4.8 | 5.2 | 3.6 | 4.5 | 4.7 | 5.5 |
| 500 - 750 ට අඩු | 2.8 | 3.4 | 4.0 | 4.5 | 3.4 | 3.6 | 4.7 | 5.5 | 3.5 | 4.0 | 5.0 | 6.0 | 3.7 | 5.0 | 5.0 | 6.0 |
| 750 - 1000 ට අඩු | 3.1 | 3.6 | 4.3 | 5.0 | 3.5 | 3.8 | 5.1 | 6.0 | 3.6 | 4.5 | 5.7 | 6.5 | 3.8 | 5.1 | 6.0 | 6.5 |
| 1000 - 1500 ට අඩු | 3.2 | 3.8 | 4.6 | 5.5 | 3.6 | 4.0 | 5.4 | 6.5 | 3.7 | 5.0 | 6.1 | 8.0 | 3.9 | 5.3 | 6.5 | 8.5 |
| 1500 - 2000 ට අඩු | 3.4 | 4.0 | 5.0 | 6.0 | 3.7 | 4.2 | 5.8 | 7.0 | 3.8 | 5.1 | 6.7 | 9.0 | 4.0 | 5.4 | 7.0 | *10 |
| 2000 - 2500 ට අඩු | 3.5 | 4.2 | 5.2 | 6.5 | 3.8 | 4.4 | 6.2 | 7.5 | 3.9 | 5.2 | 7.1 | *10 | 4.0 | 5.5 | 7.5 | *10.5 |
| 2500 - 3000 ට අඩු | 3.6 | 4.4 | 5.5 | 7.0 | 3.9 | 4.6 | 6.5 | 8.0 | 4.0 | 5.3 | 7.4 | *10.5 | 4.0 | 5.6 | 7.5 | *11 |
| 3000 - 3500 ට අඩු | 3.7 | 4.6 | 6.0 | 7.5 | 4.0 | 4.8 | 6.9 | 8.5 | 4.0 | 5.4 | 7.6 | *11 | 4.0 | 5.7 | 8.0 | *11.5 |
| 3500 - 4000 ට අඩු | 3.8 | 4.8 | 6.3 | 7.7 | 4.0 | 5.0 | 7.3 | 9.0 | 4.0 | 5.5 | 7.8 | *11.5 | 4.0 | 5.8 | 8.0 | *12 |
| 4000ට වැඩි | 4.0 | 5.0 | 6.5 | 8.0 | 4.0 | 5.2 | 7.5 | 9.5 | 4.0 | 5.6 | 8.0 | *12 | 4.0 | 5.9 | 8.0 | *UL |

| ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | කලාපිය සංගුණකය = 2.50-2.74 | | | | කලාපිය සංගුණකය = 2.75-2.99 | | | | කලාපිය සංගුණකය = 3.00-3.24 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | |
| | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර්6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි |
| 150 - 250ට අඩු | 3.0 | 3.4 | 3.6 | 4.0 | 3.0 | 3.4 | 3.6 | 4.0 | 3.0 | 3.4 | 3.6 | 4.0 |
| 250 - 375 ට අඩු | 3.5 | 4.0 | 5.0 | 5.5 | 3.5 | 4.2 | 5.0 | 5.5 | 3.5 | 4.4 | 5.0 | 5.5 |
| 375 - 500 ට අඩු | 3.6 | 4.6 | 5.2 | 6.0 | 3.6 | 4.7 | 5.2 | 6.0 | 3.6 | 4.8 | 5.2 | 6.0 |
| 500 - 750 ට අඩු | 3.7 | 5.1 | 5.5 | 6.5 | 3.7 | 5.2 | 5.5 | 6.5 | 3.7 | 5.3 | 5.5 | 6.5 |
| 750 - 1000 ට අඩු | 3.8 | 5.2 | 6.5 | 7.0 | 3.8 | 5.3 | 7.0 | 7.5 | 3.8 | 5.4 | 7.0 | 7.5 |
| 1000 - 1500 ට අඩු | 3.9 | 5.4 | 7.0 | 9.0 | 3.9 | 5.5 | 7.5 | 9.0 | 3.9 | 5.6 | 7.5 | 9.0 |
| 1500 - 2000 ට අඩු | 4.0 | 5.5 | 7.5 | *10.5 | 4.0 | 5.6 | 7.5 | *10.5 | 4.0 | 5.7 | 8.0 | *10.5 |
| 2000 - 2500 ට අඩු | 4.0 | 5.6 | 7.5 | *11 | 4.0 | 5.7 | 8.0 | *11 | 4.0 | 5.8 | 8.0 | *11 |
| 2500 - 3000 ට අඩු | 4.0 | 5.7 | 8.0 | *11.5 | 4.0 | 5.8 | 8.0 | *11.5 | 4.0 | 5.9 | 8.0 | *11.5 |
| 3000 - 3500 ට අඩු | 4.0 | 5.8 | 8.0 | *12 | 4.0 | 5.9 | 8.0 | *12 | 4.0 | 6.0 | 8.0 | *12 |
| 3500 - 4000 ට අඩු | 4.0 | 5.9 | 8.0 | *12 | 4.0 | 6.0 | 8.0 | *12 | 4.0 | 6.0 | 8.0 | *12 |
| 4000ට වැඩි | 4.0 | 6.0 | 8.0 | *UL | 4.0 | 6.0 | 8.0 | *UL | 4.0 | 6.0 | 8.0 | *UL |

| ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | කලාපිය සංගුණකය = 3.25-3.49 | | | | කලාපිය සංගුණකය = 3.50-3.74 | | | | කලාපිය සංගුණකය = 3.75-4.00 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | |
| | මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි |
| 150 - 250ට අඩු | 3.0 | 3.4 | 3.6 | 4.0 | 3.0 | 3.4 | 3.6 | 4.0 | 3.0 | 3.4 | 3.6 | 4.0 |
| 250 - 375 ට අඩු | 3.5 | 4.6 | 5.0 | 5.5 | 3.5 | 4.8 | 5.0 | 5.5 | 3.5 | 5.0 | 5.0 | 5.5 |
| 375 - 500 ට අඩු | 3.6 | 4.9 | 5.2 | 6.0 | 3.6 | 5.0 | 5.2 | 6.0 | 3.6 | 5.4 | 5.2 | 6.0 |
| 500 - 750 ට අඩු | 3.8 | 5.4 | 5.5 | 6.5 | 3.8 | 5.5 | 5.5 | 6.5 | 4.0 | 5.7 | 5.5 | 6.5 |
| 750 - 1000 ට අඩු | 4.0 | 5.5 | 7.5 | 8.0 | 4.0 | 5.6 | 7.5 | 8.0 | 4.5 | 6.0 | 7.5 | 8.0 |
| 1000 - 1500 ට අඩු | 4.0 | 5.7 | 8.0 | 9.0 | 4.2 | 5.8 | 8.0 | 9.0 | 4.5 | 6.5 | 8.0 | 9.0 |
| 1500 - 2000 ට අඩු | 4.0 | 5.8 | 8.0 | *11 | 4.2 | 6.0 | 8.0 | *11 | 4.5 | 7.0 | 8.0 | *11 |
| 2000 - 2500 ට අඩු | 4.0 | 5.9 | 8.0 | *11.5 | 4.2 | 6.2 | 8.0 | *11.5 | 4.5 | 7.0 | 8.0 | *12 |
| 2500 - 3000 ට අඩු | 4.0 | 6.0 | 8.0 | *12 | 4.2 | 6.4 | 8.0 | *12 | 4.5 | 7.0 | 8.0 | *12 |
| 3000 - 3500 ට අඩු | 4.0 | 6.0 | 8.0 | *12 | 4.2 | 6.5 | 8.0 | *12 | 4.5 | 7.0 | 8.0 | *12 |
| 3500 - 4000 ට අඩු | 4.0 | 6.0 | 8.0 | *12 | 4.2 | 6.5 | 8.0 | *12 | 4.5 | 7.0 | 8.0 | *12 |
| 4000ට වැඩි | 4.0 | 6.0 | 8.0 | *UL | 4.2 | 6.5 | 8.0 | *UL | 4.5 | 7.0 | 8.0 | *UL |

| |
|---|
| UL - අසීමිත<br>නිත්‍යානුකූලව වාහන නැවතුම් සඳහා වෙන්කර ඇති ගෙබිම් ප්‍රමාණයන් ගෙබිම් අනුපාතය සඳහා ගණනය නොකරයි.<br>කලාපීය රෙගුලාසි යටතේ මහල් ප්‍රමාණය හෝ ගෙබිම් අනුපාතය දකවා ඇති විටකදී ඉහත ගෙබිම් අනුපාතයන් අදාළ නොවේ.<br>සංවර්ධන සැලැස්ම යටතේ ඉඩමේ ආනතියට අනුව ඉහත ගෙබිම් අනුපාතයන් වෙනස් විය හැක<br>ඉඩමේ ආනතිය අංශක 11ට වඩා වැඩිවනවිට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබාගත යුතුය<br>* ගෙබිම් අනුපාතය 10.0 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා අවසර ලැබෙනුයේ අවම වශයෙන් මීටර් 12ක එසේ .ගොඩනැගිලි සීමාවක් පනවා ඇති ප්‍රවේශ මාර්ගය සඳහා පමණි (මාර්ගයේ මැද සිට) නොවන අවස්ථාවක උපරිම ගෙබිම් අනුපාතය9.0 ට සීමා විය යුතුය.<br>මෙම සැලැස්ම මගින් ප්‍රවේශ මාර්ගයේ යෝජිත පළල දක්වා ඇති අවස්ථා වලදී ඊට අදාළ මාර්ග රක්ෂිතය භෞතිකව සංවර්ධනය කිරීමට යටත්ව එම මාර්ගයේ අවම මාර්ග පළල ලෙස ප්‍රවේශ මාර්ගයේ යෝජිත පළල සලකනු ලැබේ. |

*වගුව 8.4.2 : අවසරලත් මහල් ප්‍රමාණයන් : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන රෙගුලාසි / රෙගුලාසි (2021) හි 06 වන උපලේඛනයේ "ආ" ආකෘතිය : (සංශෝධිත)*

| මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන් | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාර්ගයේ අවම පළල | ඉඩමේ මුහුණතෙහි අවම පළල | ගෙබිම් ආවරණ ප්‍රතිශතය* | උපරිම මහල් ප්‍රමාණය | | | |
| | | | කලාපිය සංගුණකය 0.5 - 0.74 | කලාපිය සංගුණකය 0.75 - 1.24 | කලාපිය සංගුණකය 1.25 - 3.49 | කලාපිය සංගුණකය 3.50 - 4.00 |
| මීටර් 3.0 | මීටර් 6 | 65% | 1 (G) | 2 (G+1) | 3 (G+2) | 3 (G+2) |
| මීටර් 4.5 | මීටර් 6 | 65% | 1 (G) | 2 (G+1) | 3 (G+2) | 4 (G+3) |
| වාහන නැවතුම් ඉඩකඩද ඇතුලත්ව ඉහත මහල් ප්‍රමාණයන් දක්වා ඇත<br>එක් එක් මාර්ග සඳහා ප්‍රවේශකත්වය ලබා ගන්නා නිවාස ඒකක ප්‍රමාණයන් වෙනස් නොවේ<br>* කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී | | | | | | |

*වගුව 8.4.3 : විවෘත අවකාශයන්: නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි (2021)හි 06 වන උපලේඛනයේ "ඉ" ආකෘතිය:*

| "ඉ" පෝරමය විවෘත -අවකාශයන් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගොඩනැගිල්ලේ උස (මීටර්) | ඉඩමේ මුහුණතෙහි අවම පළල (මීටර්) | ගෙබිම් ආවරණ ප්‍රතිශතය* | | පසුපස අවකාශය (මීටර්) | | පැති අවකාශය (මීටර්) | | ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබාගන්නා වාලිං සදහා | |
| | | නේවාසික නොවන | නේවාසික | මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට | මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට | මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට | මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට | අවම පළල | අවම ගෙබිම් ප්‍රමාණය |
| 7ට අඩු | 6 | 80%** | 65% | 2.3 මීටර් | 2.3 මීටර් | - | 2.3 මීටර් | 2.3 මීටර් | 5 ව. මීටර |
| 7 - 15ට අඩු | 6 | 65% | 65% | 3.0 මීටර් | 3.0 මීටර් | - | 3.0 මීටර් | 3.0 මීටර් | 9 ව. මීටර |
| 15 - 30ට අඩු | 12 | 65% | 65% | 4.0 මීටර් | 4.0 මීටර් | 1.0 මීටර් සහ 3.0 මීටර් | 4.0 මීටර් | 4.0 මීටර් | 16 ව. මීටර |
| 30 - 50ට අඩු | 20 | 65% | 65% | 4.0 මීටර් | 5.0 මීටර් | 3.0 මීටර් දෙපසින් | 5.0 මීටර් | 5.0 මීටර් | 25 ව. මීටර |
| 50 - 75ට අඩු | 30 | 50%*** | 50%*** | 5.0 මීටර් | 6.0 මීටර් | 4.0 මීටර් දෙපසින් | 6.0 මීටර් | 6.0 මීටර් | 36 ව. මීටර |
| 75 සහ ඊට වැඩි | 40ට වැඩි | 50%*** | 50%*** | 5.0 මීටර් | 6.0 මීටර් | 5.0 මීටර් දෙපසින් | 6.0 මීටර් | 6.0 මීටර් | **** |

ගොඩනැගිල්ලේ උස - ප්‍රවේශ මාර්ගය මට්ටමේ සිට ඉහල සදලු තලය හෝ වහලය මට්ටම දක්වා උස (වාහන නැවතුම් මහල්ද ඇතුළත්ව)

* කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී

** සම්පූර්ණයෙන්ම නේවාසික නොවන සංවර්ධන කටයුතු සදහා

*** ගොඩනැගිලි උසේන් 20% හෝ මහල් 12 යන දෙකෙන් අවම උසක් සහිත පොඩියම් )Podium) මහල් සදහා 65% ගෙබිම් ආවරණ ප්‍රතිශතයක් ලබා දියහැක

**** අමතර සෑම උස මී 3ක් සදහාම අවම ගෙබිම් ප්‍රමාණය ව. මිටර් 1 කින් වැඩිවිය යුතුය

*වගුව 8.4.4 : සංවර්ධන කලාප සඳහා අවසරලත් භාවිතයන් සහ අවම බිම් ප්‍රමාණය - ගම්පහ මහා නගර සභාව*

| | | | ගම්පහ මහ නගර සභාව | නේවාසික කලාපය (R) | | වාණිජ කලාපය (C) | | මිශ්‍ර සංවර්ධන කලාපය (MD) | සංචාරක කලාපය (T) | කාර්මික කලාපය (I) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන භාවිතය | උප අංකය | උප භාවිතය | අවම බිම් ප්‍රමාණය (ව. මීටර්) | R1 | R2 | C1 | C2 | MD1 | T2 | I1 |
| 1. නේවාසික (Residential) | 1 | නිවාස | 150 | | | | | | | |
| | 2 | සහාධිපත්‍ය නිවාස සංකීර්ණ | 500 | | | | | | | |
| | 3 | නිවාස සංකීර්ණ | 500 | | | | | | | |
| | 4 | නිල නිවාස/සේවක නිවාස | 150 | 250 | 250 | | | | | |
| | 5 | සේවා නිවාස | 150 | | | | | | | |
